# බෞද්ධාලෝකය

DOP/NEWS/24/2023
ISSN 2613-8743

19 වැනි කාණ්ඩය 4 වැනි කලාපය

ශ්‍රී බුද්ධ වර්ෂ 2567 - වප් - ඉල් - උඳුවප්
(2023 ඔක්තෝබර් - නොවැම්බර් - දෙසැම්බර්)

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ප්‍රකාශනයකි



බලංගොඩ සඳගිරි රජ මහා විහාරයේ
අෂ්ඨඵල බෝධීන් වහන්සේ

# බලංගොඩ සඳගිරි අෂ්ඨඵල බෝධීන් රජ මහා විහාරයේ වස් ආරාධනා පින්කම සහ වැසි සළු පූජාව



# බෞද්ධාලෝකය

ශ්‍රී බුද්ධ වර්ෂ 2567 වප්, ඉල්, උඳුවප් 2023 ඔක්තෝම්බර්, නොවැම්බර්, දෙසැම්බර්


## ලිපි සරණිය


- **ධම්ම පදය** - පණ්ඩිත රන්ජිත් වනරතන, 02
  **Dhamma Padaya - English** (ධම්මපද වනරත්න ව්‍යාඛ්‍යා පොත ඇසුරෙන්)
  පරිවර්තනය - මහාචාර්ය ශිරෝමි සමරසිංහ
- **ජාත්‍යන්තර කාන්තා දිනයට බුදු දහමින් නව කිවීමක්** - සෝමසිරි වික්‍රමසිංහ උඩුගම්පල 03
- **ජාතික වීර ශ්‍රීමත් ඩී.බී. ජයතිලක චරිතය** - උමා පෙරේරා ද ලැනරොල් 05
- **වැවයි දාගැබයි - ගමයි පන්සලයි** - චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ 10
- **සම්බුද්ධ පරිනිර්වාණය** - වෛද්‍ය ඉන්ද්‍රානි රත්නායක 13
- **සිල්පද භාවිතය නැතිවීම** - සිරිසුමන ගොඩගේ 14
- **Paryatti , Pratipatti, Learning and Practicing** - **Das Miriyagalla** 16
- **සීවලී මහ රහතන් වහන්සේට පල දුන් කුසල අකුසල කර්ම** - නරේන්ද්‍ර බණ්ඩාර පෙරමුණෙ 18
- **ඇයද උත්පලවණ්ණාවකි - IV වන කොටස** - දයා හේවාගම අනුරාධපුර 20
- **තාරුණ්‍ය සහ බුදුදහම** - ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමින් වහන්සේ 22
- **සිත යනු කුමක් ද?** - අනුර සේනාරත්න 25
- **ලෝකයේ දීර්ඝතම වන්දනා සමය** - ලොකුබණ්ඩාර මුණසිංහ 29
- **ශ්‍රී ලංකාවේ රාජ්‍යපාලනය හා බුදුසමය** - සිරිසේන විතානගේ 32


---


**කළමනාකරණ උපදේශක මණ්ඩලය**
මහාචාර්ය මාලිනි ඇඳගම
මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ

**ප්‍රකාශනය**
ප්‍රචාරක කටයුතු පිළිබඳ ජාතික මණ්ඩලය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

**කවරයේ ඡායාරූප ලබාදීම**
කාවින්ද දිල්ෂාන් විජේසිංහ

**ඡායාරූප සැකසීම**
කාවින්ද දිල්ෂාන් විජේසිංහ
දුෂාන්ති කුමාරි

**පිටු සැලසුම**
ස්මාර්ට් ප්‍රින්ටිස් සොලියුෂන් සෙන්ටර්

**මුද්‍රණය**
රජයේ මුද්‍රණාලය

**සංස්කරණ කළමනාකරණය**
වෛද්‍ය රාණි ප්‍රනාන්දු

**සංස්කාරක මණ්ඩලය**
චන්ද්‍රසිරි වැලිගමගේ
ශ්‍යාම් නුවන් ගනේවත්ත
නාලක ජයසේන

**චිත්‍රය**
බලංගොඩ, සඳගිරි අෂ්ඨඵල බෝධි රාජ විහාරස්ථානයේ වැඩවසන අෂ්ඨඵල බෝධීන් වහන්සේ



**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
380, බෞද්ධාලෝක මාවත, කොළඹ - 07
දුරකථන : 011-2691695 / 011-2688517
ෆැක්ස් : 011-2688517 web : www.acbc.lk
විද්‍යුත් ලිපිනය : acbc380@gmail.com
buddhistinfo380@gmail.com

ශ්‍රී බුද්ධ වර්ෂ 2567 වප්, ඉල්, උඳුවප්

# ධම්ම පදය
## ජීවිතයට සම්බන්ධ කර ගනිමු

### ධම්මපද වනරතන ව්‍යාඛ්‍යා පොත ඇසුරෙනි

**අප්‍රමාදයෙන් ප්‍රමාදය නෙරපී යේ**

**පමාදං අප්පමාදෙන**
**යදා නුදති පණ්ඩිතො**
**පඤ්ඤාපාසාද මාරුය්හ**
**අසොකො සොකිනිං පජං**
**පබ්බතට්ඨොව භුම්මට්ඨෙ**
**ධීරො බාලෙ අවෙක්ඛති**

"පණ්ඩිත තෙමේ යම් කලෙක ප්‍රමාදය අප්‍රමාදයෙන් ද දුරු කෙරේ. ඒ ප්‍රඥා නමැති පහයට නැඟී ශෝක රහිත වූයේ ශෝක කරන ප්‍රජාව පර්වත මස්තකයක සිටියෙකු සේ බිම සිටියා වූ බාල ජනයන් දකියි."

රජගහ නුවර පිප්පලී ගල් ගුහාවෙහි මහා කසුප් මහ රහතන් වහන්සේ නිතොර වැඩ වෙසෙති. එහි වැඩ වෙසෙන මහ කසුප් මහ රහතන් වහන්සේ පෙරවරු කාලයෙහි රජගහ නුවර පිඬු පිණිස හැසිර, පස්වරුයෙහි කසිණාලෝකය පතුරුවා හැර, පමා ගති ඇති හා නොපමා ගුණ ඇතිව දවස් යවන මිනිසුන් ද, දිය ගොඩ ආදී නොයෙක් තැන්වල මැරෙණ උපදින සත්වයන්ද දිවසින් බලමින් වැඩ වෙසෙති.

එදවස බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන සේක්, මා පුත් මහ කසුප් දැන් කෙබඳු විහරණයකින් යුතුව වෙසේද දැයි බැලූ සේක. එවිට සත්වයන්ගේ චුති, උප්පත්ති බලමින් සිටින සේ පෙණින.

භාග්‍යවතුන් වහන්සේ ස්ථවිරයන් අභිමුව සිටින කලක මෙන් ආලෝකය පතුරුවා, කාශ්‍යපය! සත්වයන්ගේ චුති උප්පත්ති දෙක බුදු නැණින් බලාවත් නො පිරිසිදිය හැක. මැරෙන උපදින සත්වයන්ගේ විෂය ගණන් නැත. දැකීම සුකර නොවේ. කාශ්‍යපය! තොපගේ ශ්‍රාවකඥානය පිළිබඳ විෂයය අල්ප වෙයි. සත්වයන්ගේ චුති, උප්පත්ති දෙක බැලීමත් දැන ගැනීමත් බුදුවරයන්ටම විෂය වේ. එහෙත් අප්‍රමාදයට නැග, භවගාමී කර්මයන් සුන් නොකොට, මැරෙමින් උපදනා අඥාන සත්වයන් දිවැසින් බලන බැව් වදාළ සේක.

***"Pamadam appamadena***
***yada nudati pandito***
***pannapasada maruyha***
***asoko sokinim pajam***
***pabbatatthova bhumattea***
***dhiro bale avekkhati"***

The wise dispel negligence through mindfulness. He ascends the pinnacle of wisdom and being free from sorrow, looks at the sorrowing beings. Just as one on the mountain top looks at those on the plain below, so also, the wise look at the ignorant.

Maha Kasspa thero frequently spends time in the Pippali cave in Rajagaha. While residing there, Mahakassapa thero goes for alms before mid day and spends the time after mid day developing the mental light (Kasinalokaya) through divine vision, looks at those beings who are negligent and those who are mindful, those who are being born in the water and being born on land and so on.

During this time the Buddha was residing at the Dewram monastery, and used his divine vision to see how Mahakassapa thero was spending the time. The Buddha saw that the thero was looking at the births and deaths of beings.

The Buddha sent forth his radiance and appeared before Mahakassapa thero. Addressing the thero the Buddha said, "Kassapa, the number of births and deaths of beings is innumerable even for the Buddha to count. It is not your concern to count them. It is the concern only of the Buddha to look and to find out about the births and deaths of beings. However by ascending the pinnacle of mindfulness and dispelling *bhavagami karma*, one can see the ignorant being born and dying, with the divine eye.



# ජාත්‍යන්තර කාන්තා දිනයට බුදු දහමින් නව කියවීමක්

වර්තමානයේ නොයෙක් විට අසන්නට ලැබෙන කාන්තා විමුක්තිය කාන්තාවට සමතැන ඉල්ලා සිටීම ආදි ලිබරල් කාන්තා ව්‍යාපාර යුරෝපයේ බටහිර පෙදෙසින් ආරම්භ වී පසුව ලොව පුරා ක්‍රමයෙන් ප්‍රචාරය වන්නට විය. මේ වන විට උපරිම ලෙස වර්ධනය වෙමින් පැවති බටහිර මනෝවිද්‍යාව නමැති සංකල්පය මුළුමනින් පාහේ පුරුෂවාදීය යන චෝදනාව බහුලව එල්ලවන්නට වුවේය. මේ කාරණයේ ප්‍රතිඵලයක් වශයෙන් කාන්තාවාදී මනෝවිද්‍යා ප්‍රවේශයක් ගොඩනැගීමට සමහරු උත්සාහ කළහ. 1980 දශකය වන විට එම ප්‍රවේශය විවිධාංගීකරණය වෙමින් කාන්තාව හා සම්බන්ධ නව සංකල්ප ඔස්සේ වැඩෙන්නට වූවේය. එහි ඉහළම ප්‍රතික්‍රියාව ලෙස කාන්තා දර්ශනයක් ද නිර්මාණය වු බව ඇතැම්හු පවසති. ස්ත්‍රීවාදී විමුක්ති අරගලය නව සමාජ ව්‍යාපාරයක් වශයෙන් සැලකිය හැකි බැවින් යුරෝපයේ ස්ත්‍රීවාදී ව්‍යාපාරය පශ්චාත් නූතන දේශපාලන බලවේග යක් බවට පත් වූ බව නොරහසකි.

එහෙත් මෙයට වසර දෙදහස් පන්සියයකටත් එහා දුර අතීතයකදි කාන්තාවට ලෞකික සහ ලෝකෝත්තර යන දෙආකාරයෙන්ම විමුක්තිය සලසා දීමට බුදුරජාණන් වහන්සේ අනුග්‍රහය ලබා දුන් බව අපි දකිමු. බුදුන් වහන්සේ ලොව පහල වූවේ අන්තවාදී පුරුෂ මූලික ගුණාංග සහිත බ්‍රාහ්මණ සමාජයක බව අමතක කළ යුතු නොවේ. එම සමාජයේ වත් පිළිවෙත් අනුව සැමියා මිය ගිය කාන්තාවක් වී නම් ඇය සැමියා දවන ගිණි මැලයට පැන දිවිනසා ගත යුතුය. නැතහොත් දේව දාසියක විය යුතුය. බ්‍රාහ්මණ ඉගැන්වීම අනුව ස්ත්‍රිය පුරුෂයා සතු තවත් භාණ්ඩයකි. එය සංයුක්ත නිකායේ ඉසිවර සූත්‍රයේ මෙසේ දැක්වේ.

ප්‍රශ්නය ඃ කිංසු භණ්ඩානං උත්තමං - කිනම් භාණ්ඩයක් උතුම් වේද?

පිළිතුර ඃ ඉත්ථි භණ්ඩානනං උත්තමං - ස්ත්‍රී භාණ්ඩය උතුම් වේ.

මෙවැනි පුරුෂ මූලික බ්‍රාහ්මණ සමාජයේ අදහස් බිඳ හෙළමින් කාන්තා විමුක්තිය උදාකර දීමට බුදුන් වහන්සේ අනුගමනය කළ ක්‍රියා මාර්ග ගැන සිතා බැලීම යෝග්‍යය.

**සිතා රක්‍ෂති කෞමාරේ - භර්තා රක්‍ෂති යෞවනේ**

**පුත්‍රශ්ච ස්ථවිරේ භාවේ - නුස්ත්‍රී ස්වාතන්ත්‍ර වර්තතී**

(ස්ත්‍රිය) ළදරු වියේදී පියා විසින් රක්‍ෂා කරනු ලබයි. යෞවනයේදී සැමියා විසින් රකිනු ලැබේ. මහළු වියේදී පුත්‍රයා විසින් රකිනු ලබයි. එනිසා ස්ත්‍රිය ස්වාධීනත්වය ලැබීමට නුදුසුසුය. ඒ එදා පැවති බ්‍රාහ්මණ සමාජයේ මතය වූවේය.

සමාජයේ ප්‍රධානත්වය ඉසිලූ බමුණෝ කාන්තාවගේ නිදහස ඒ අයුරින් පාගා දැමූහ. සිය අතින් පුද පූජා පැවැත්වීම අහිමි කළහ. ඇය නිවසේ කටයුතුවලට පමණක් සීමා කළහ. ඔවුහු කාන්තාව සිය ස්වාමියාගේ දාසියක් බවට පත් කළහ. එහෙත් බුදු රජාණන් වහන්සේ මෙම ආකල්පය මුළුමනින්ම වෙනස් කළා පමණක් නොව උත්තරීතර වූ මහණ බව ලබා ගැනීමටද මග සළස්වා දුන් සේක. එමෙන්ම ස්ත්‍රීත්වය බොහෝ සේ අගය කළ සේක. විශාල වශයෙන් සමාජ පරි පීඩනයට ලක් වූ භාරත වනිතාව කෙරෙහි බුදුන් වහන්සේ දැරූ කාරුණික සහ උසස් ආකල්පය මල්ලිකා දේවියට දුවක ලැබීමෙන් කනස්සල්ලට පත් වූ කොසොල් රජුට දේශනා කරන ලද මෙම ධර්ම පාඨයෙන් පෙනේ. මෙය සංයුක්ත නිකායේ කෝසල සංයුක්තයේ ධීතු සුත්තකයේ දක්නා ලැබේ.

**ඉත්ථිපිහි ඒකච්චියා - සෙය්‍යා පෝස ජනාධිප**

**මේධාවිනි සීලවති - සස්සු දෙස පතිබ්බාතා**

**තසසාසෝ ජායති පෝසෝ - සූරො හොති දිසම්පති**

**තාදිසා සුභාගිර්‍යා පුතෙතා - රජ්ජම්හි අනුසාසති.**

රජතුමනි! ඇතැම් ස්ත්‍රීහු පුරුෂයනට වඩා ශ්‍රේෂ්ඨ වෙති. නුවණැති සිල්වත්, නැදි මයිලන් දෙවිකොට වෙසෙන පතිවත රකින යම් ස්ත්‍රියක් වෙත් ද දිසාවන්ට අධිපති රජතුමනි! ඇයට යම් පුත්‍රයෙකු උපදීද හෙතෙම දක්‍ෂයෙකු වෙයි. එබඳු යහපත් තැනැත්තියගේ පුත්‍රයා රාජ්‍යානුශාසනයටද පත්වේ. යනු එහි අර්ථයයි. මෙවැනි ආකල්පමය වෙනසක් ඇති කිරීම එදා විප්ලවවාදී පියවරක් වුවේය. එයින් ලද දිරිගැන්වීම මත සිය දහස් ගණන් වනිතාවෝ බෞද්ධ උපාසිකාවන් බවට පත්වූහ. ඛේමා උප්පලවන්නා, සුමනා, සුභද්‍රා, විශාඛා, කෝසල මල්ලිකා, ආදී නාමයන් මෙහිදී සිහියට නැගේ. මෙම මහෝපාසිකාවෝ පසු කලෙක සියලු කෙලෙසුන් නසා අර්හත් ඵලයට ද පැමිණීමට සමත් වූහ.


එසේම සාරිපුත්ත මහ මොග්ගල්ලා ආදී මහ ප්‍රඥා ඇති මහා ඍද්ධි ඇති මහ රහතන් වහන්සේලාට යම් සේ අග්‍ර ශ්‍රාවක තනතුරු ප්‍රදානය කළ සේකද, එසේම මහා ශ්‍රාවිකාවන් වහන්සේලාටද ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සාශන භාරධාරි මහ තනතුරුවලින් ගෞරවය ලබා දුන් සේක. චිර රාත්‍රඥ භික්ෂුණීන් වහන්සේලා අතරින් මහා ප්‍රජාපතී ගෝතමී තෙරණීන් වහන්සේ අග්‍ර බවටද, ප්‍රඥාවන්ත තෙරණීන් අතරින් ඛේමාටද, ඍද්ධිමත් භික්ෂුණීන් වහන්සේලා අතරින් උප්පලවන්නාද, විනයධර භික්ෂුණීන් වහන්සේලා අතරින් පටාචාරාවන් ද, ධම්ම කථිකාවන් අතර ධම්මදින්නාවද ආදී වශයෙන් අග්‍ර වූ තනතුරු ලැබූ මේ පිරිස ක්‍ෂාන්තිය උදාකර ගත්හ.

භාරතීය කාන්තා සමාජයට සාපේක්‍ෂව සලකන විට ඉතා කුඩා අංශුවක් ලෙස සැලකිය හැකි ශ්‍රී ලාංකික කාන්ත ප්‍රජාවගේ හැඩ ගැස්ම උදෙසා මූලිකත්වය ගත්තේ ද භාරත තෙරණියක් වීමද විශේෂත්වයකි. අශෝක අධිරාජයාගේ දියණිය වූත් මෙරට බුදු සසුන පිහිටුවා වදාළ මහිඳු මහ රහතන් වහන්සේගේ නැගණිය වූත් සංඝමිත්තා මහ රහත් තෙරණිය ලංකා කාන්තා පරපුරේ ඉදිරි ගමන වෙනුවෙන් සහ විමුක්තිය ලබා දීම උදෙසා ජීවිතයම කැප කළාය. ඇයගේ පරිනිර්වාණය සිදුවූවේත් මෙරට දීමය. එම හේතුව නිසා අපේ රටේ කාන්තා දිනය ලෙස උඳුවප් පුර පසළොස්වක දිනය නම් කර තිබේ. එය ජාත්‍යන්තර මට්ටම දක්වා ගෙන යාමට ශක්තිය හා ධෛර්ය පතමු.

**සෝමසිරි වික්‍රමසිංහ**

අස්ගිරි වල්පොල

උඩුගම්පොල



# ජාතික වීර ශ්‍රීමත් දොන් බාරොන් ජයතිලක චරිතය තුලින් අද දරුවන්ට ගත හැකි ආදර්ශ

**උමා පෙරේරා ද ලැනරෝල් විසිනි**

වරාගොඩ, ගමේ දහම් පාසලේ ඉගෙන ගන්නා දරුදැරියන් කිහිපදෙනෙක් සුපුරුදු පරිදි ළමුන්ට ගුරුහරුකම් දෙන අත්තම්මා ගෙන් යමක් දැන ගැනීම පිණිස සටහන් පොතක්ද රැගෙන පැමිණියා. අත්තම්මා ඉතා සතුටින් දරුවන් පිළිගෙන ගෙදර ඉස්තෝප්පුවේ තිබූ දිග බංකුවේ වාඩි කරවා ගත්තා. අත්තම්මාගේ පුටුවේ අත්තම්මා වාඩි වුණා දරුවන්ට අවශ්‍යව තිබුණේ ශ්‍රීමත් දොන් බාරොන් ජයතිලක යන ජාතික වීරවරයා ගැන තොරතුරු ටිකක් දැන ගැනීමටයි. එය ඇසූ අත්තම්මා "මා වාගේ ඒ කාලේ සිටි අපේ අය තමා සැබෑ තොරතුරු දන්නේ" කියමින් පොත් රාක්කය වෙත ගියාය. එයින් ඇයගේ පැරණි සටහන් ලියා ඇති පොත රැගෙන විත් ටීපෝව මත තබා උපැස් යුගල පැළඳ ගත්තාය. එක් දරුවෙක් ලහිලහියේ බංකුවෙන් නැගිට අත්තම්මාගේ පුටුව ටීපෝව ළඟට ලංකර දුන්නේය. දරුවාට ස්තුති කළ අත්තම්මා **"මේ දරුවන් ළඟ තිබෙන ඔය සටහන් පොතෙත් ඔය ළමයින්ට අවශ්‍ය කරුණු සටහන් කරගත්තොත් තමා වටින්නේ"** යැයි පැවසුවාය. දරුවන්ද ඊට ප්‍රතිචාර දැක්වීය. අත්තම්මා පොත පෙරලමින් සිනහ මුසු මුහුණින් කථාව ඇරඹුවාය.

වර්ෂ 1868 පෙබරවාරි මස 13 වන දින කැලණි රජමහා විහාරය අසබඩ කැලණි නදිය ගලා බසින සුන්දර පරිසරයක පිහිටි **වරාගොඩ ග්‍රාමයේ පින්වත් දරුවෙක් උපත ලැබුවා. ඔහු නමින් දොන් බාරොන් ජයතිලක විය.** මේ දරුවාගේ පවුල් විස්තර ටික දැනගන්න මේ දරුවන් කැමති ඇතිනේ. දොන් බාරොන්ගේ පියා, වේයන්ගොඩ අතුකෝරලගේ දොන් දානියල් ජයතිලක සේනානායක නම් විය. ඔහු එකල රැකියාව වශයෙන් පෑලියගොඩ සිට රත්නපුරය දක්වා පාරවල් සෑදීමේ ආණ්ඩුවේ කොන්තරාත් වැඩ භාරව කටයුතු කර ඇත. ඒ කාලයේද ජොහානිස් වීරසිංහ රාළහාමි නැමති අයගේ දියණිය වූ ලියනගේ එලිසා පෙරේරා වීරසිංහ මෙනවිය සමඟ විවාහ වී කැලණියේ වරාගොඩ ගමේ පදිංචි වුණා. එකල එතුමියගේ මහගෙදර වශයෙන් සැලකූ ගෙය 'මිලින්ටන්' නමින් හැඳින්විය. එය මේ දෙපළ මුලින්ම පදිංචිවූ නිවසයි. මේ නිවස දොන් බාරෝන් ජයතිලක දරුවා උපන් ගෙයයි. පසුව ගම්මුලාදෑනි ලියනගේ ජොහානිස් පෙරේරා වීරසිංහ රාළහාමි තම දියණියට වරාගොඩ බෝධීන් වහන්සේ ඉදිරිපිට ඇති ඉඩම තෑගි කළා. එහි සිය පවුලේ පදිංචියට දොන් දානියල් ජයතිලක නව නිවසක් සාදා ගත්තා. පසුකාලයේ දී "සභාපති වලව්ව" නමින් හැඳින් වූ මෙම ගෙය අදටත් හොඳ තත්ත්වයෙන් පවත්නා දැකීම සතුටකි.

මේ දෙපළගේ වැඩිමහල් දැරිය 'සුසානෝ' කුඩා වියේදී මිය ගියා. පවුලේ වැඩිමහල් පුතු දොන් බාරොන් ජයතිලක නම් විය. මෙතුමා බුදුදහමට, සංස්කෘතියට, රටට, ජාතියට විශිෂ්ඨ සේවාවක් කළ ජාතික වීරවරයකු ලෙස ඉතිහාසගත වුණා. දෙවැනි පුතා විදාන ආරච්චි හා

විවාහ ලේකම් තනතුරු දැරූ දොන් සයිමන් ජයතිලක (මුහන්දිරම් රළහාමි) වූ අතර බාලපුතා දොන් ඒබ්‍රහම් ජයතිලක (මුදලිතුමා) ගම්සභා නඩුකාර වරයෙකු වශයෙන් සේවය කළා.

පියා පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනේ ප්‍රධාන දායක පවුල් අතරට සම්බන්ධව ඉදිරියෙන් වැඩ කළා. මව ඉතා සිල්වත් ගුණවත් කාන්තාවක් වූවා. දොන් බාරොන් මව් කුස සිටියදී මව දුටු සිහිනය, පසු සැබෑ වුණා. සඳ බැබළෙන රාත්‍රියක පෙරහැරේ රැගෙන ආ පුන්සඳවන් මැණිකක් මවගේ දෝතට ආවා. ඒ මැණික මේ පින්වත් බාරොන් දරුවා බව අදත් ගමේ පැරැණ්නෝ විශ්වාස කරනවා.

**මේ දරුවන්ට වාගේ දොන් බාරොන්ටත් පුංචි කාලයක් තිබුණා.** කුඩා කල දෙමව්පියන් සමඟ නිතර පන්සලට යනවා සාමණේර හාමුදුරුවරු සමඟ ඇසුරට වැටුණා. පන්සලට යනවිට පාවහන් ගැළවීමට අමතක කළේ නැහැ. බුදුන් වැඳීමට පෙර අනිකුත් ළමයින් මෙන් බෝ මළුව පිරිමැදීමට කැමතියි. මේ දරුවා තුළ තිබූ සංවර කම කැපී පෙනුණා.

පියා මේ දරුවා 1874 වර්ෂයේදී (වයස අවුරුදු 6 න්) පෑළියගොඩ විද්‍යාලංකාර පිරිවෙනේ විදුහල්පති රත්මලානේ ධර්මාලෝක නායක ස්වාමීන් වහන්සේ වෙත කැඳවාගෙන ගොස් අකුරු කියවා ගත්තා. ඉන්පසු නායක ස්වාමීන් වහන්සේ ඉතා සතුටින් මේ නැණවත් දරුවාගේ සිංහල, පාලි, සංස්කෘත භාෂා ඥාණය දියුණු කිරීමට භාරගත්තා. එකළ ළමයින්ට ඉංග්‍රීසි නම් භාවිතා කළා. ඒ කාලයේ මිෂනාරි පාසල්වලට ළමුන් ඇතුළත් කළ යුගයක්. ඒ අනුව ඉංග්‍රීසියෙන් විෂයයන් හැදෑරීමට කැලණියේ බැප්ටිස්ට් පාසලටද පුංචි බාරොන්ව ඇතුලත් කළා. එයින් නොනැවතී 1881 වර්ෂයේදී කොළඹ වෙස්ලි කොලේජියට ඇතුල් කළා. එතුමා එහිදී ඉංග්‍රීසි හා ලතින් භාෂාව දක්ෂ ලෙස ඉගෙන ගත්තා. තම නිවසේ සිට කැලණියේ පට්ටිය හන්දිය තෙක් සහෝදරයින් දෙදෙනාද කැටුව කරත්තයෙන් ගොස් එතැන් සිට කොළඹ වෙස්ලි කොලීජියට ගියේ දුම්රියෙන්. වෙස්ලි විදුහලේදී කේම්බ්‍රිජ් කණිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ සහතික ලබා ගත්තා. පාසල් කාලයේදී ඔහුගේ ප්‍රියතම ක්‍රීඩාව ක්‍රිකට් විය.

වර්ෂ 1890 බෞද්ධයන් හා ක්‍රිස්තියානි භක්තිකයන් අතර පැවති විවාදවලදී බෞද්ධයන්ට සිදුවූ අසාධාරනයන් පිළිබඳ අනාවරණය වුනා. මේ පිළිබඳව මනා දැනුමක් තිබූ ලංකාවට පැමිණි ඇමරිකන් ජාතික හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා හා සමඟ ජයතිලකතුමා මහනුවර ධර්මරාජ විද්‍යාලය පිහිටෙව්වා. 1891 ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පති ධූරයට දොන් බාරොන් ජයතිලක තුමාට පත්වීමක් ලැබුණා. 1890 ඉන්දියාවේ කල්කටා විශ්වවිද්‍යාලයෙන් බී.ඒ. ශාස්ත්‍රාචාර්ය උපාධිය සමත් විය. 1898 කොළඹ ආනන්ද විද්‍යාලයේ උප විදුහල්පති හැටියට සේවයකර වර්ෂ 1900 දී විදුහල්පතිධූරයට ද පත්විය. ඔහු ආනන්ද විද්‍යාලයේ පළමු සිංහල බෞද්ධ ලාංකික විදුහල්පති වශයෙන් සැලකේ.

වර්ෂ 1898 අගෝස්තු මස 12 වැනිදා බාරොන් ජයතිලක තුමා පණ්ඩිත බටුවන්තුඩාව මැතිඳුන්ගේ තුන්වැනි දියණිය වන මල්ලිකා බටුවන්තුඩාව මෙනෙවිය සමඟ විවාහ ගිවිස ගත්තා. එතුමිය ඉංග්‍රීසි සිංහල උගත් බෞද්ධාගමට ලැදි කාන්තාවක් වීම දොන් බාරොන්තුමාගේ වැඩකටයුතු ඉදිරියට ගෙන යාමට අතදුන් දිරිය කාන්තාවක් විය.

වර්ෂ 1898 මෙතුමා තරුණ බෞද්ධ සමිතිය පිහිටුවීමට පුරෝගාමී වූ අතර එහි පළමු සභාපති ධූරටය නිතරඟ යෙන් පත්ව ඉමහත් සේවයක් කළා. 1902 පරම විඥානාර්ථ බෞද්ධ සමිතියේ (පාඨශාලා අංශයේ) කළමනාකාර අධ්‍යක්ෂක හා පසුව 1908 ලේකම්ධූරයට ද පත් විය. සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය ආරම්භ කිරීමෙහිලා පුරෝගාමීව වැඩ කරන ලදි.

1910 ජූලි 15 වැනිදා ප්‍රථම වරට එංගලන්තය බලා පිටත්වීමට නැව්ගත වුණා. **1910 ජර්මනියේ බර්ලින් නුවර පැවති ආගම් පිළිබඳ සම්මේලනයේ ලාංකික බෞද්ධ නියෝජිතයා මෙන් පෙනී සිටියා. 1912 එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් (Oxford) විශ්වවිද්‍යාල නීති උපාධිය සමත්ව “ලින්කන් ඉන්” හි බැරිස්ටර්වරයෙකු වශයෙන් සුදුසුකම් ලැබීය. එවකට එතුමා වයස අවුරුදු 42 ක් වූ අතර ඉන් නොනැවතී 1920 දී ඔක්ස්ෆර්ඩ්හි විශ්වවිද්‍යාල ශාස්ත්‍රපති (එම්.ඒ.) උපාධිය ලබා ගැනීමට ද සමත් විය. වර්ෂ 1913 අද්වකාත් කෙනෙකු හැටියට සුප්‍රීම් උසාවියේ දිවුරුම් දුන්නා.** මෙතුමා දක්ෂ අද්වකාත්වරයෙකු ලෙස කලක් සේවය කළද මුදල් ඉපැයීමට වඩා ඔහුට අවශ්‍ය වූයේ ආගම, රට, ජාතිය හා සංස්කෘතියට වැඩකිරීමටයි.

1912 දී යටත් විජිත ආණ්ඩුව රා පනතක් (Toddy Act) ගෙන ඒමට ප්‍රයත්න දැරීය. ශ්‍රී ලංකාවේ බහුතරයක් වූ බෞද්ධ ජනතාවට හා සංස්කෘතියට කරන ලද අගෞරවයක් බව සලකා එය ප්‍රතික්ෂේප කළ යුතුය යන මතයේ ජයතිලකතුමා තරයේ එල්බ සිටියේය.

මෙසේ විරෝධතා පැවතියද 1912 අප්‍රේල් මස ව්‍යවස්ථාදායක මණ්ඩලය රා පනත අනුමත කරන ලදි. රා පනත සම්මත වන විට ජයතිලකතුමා උසස් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා එංගලන්තයට ගොස් සිටියා. ඒ කාලය තුළදී ද ඔහු ලංකාවේ රා පනතට විරෝධය පාමින් එංගලන්තය හා වේල්ස්හි වූ අමද්‍යප සංවිධාන හා එක්වී එයට විරෝධය පළ කළා. මෙම පනතට විරුද්ධව අනගාරික ධර්මපාලතුමා ඇතුළු නායකයන් රැසක් විරෝධතා රැලි ආරම්භ කරන ලදි. 1912 මැයි මස 25 වැනි දින කොළඹ ආනන්ද විද්‍යාලයේ විශාල රැස්වීමක් පැවැත් විය. ශ්‍රීමත් බාරොන් ජයතිලක මැතිතුමන් විසින් එංගලන්තයේ අමද්‍යප සමිති හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලංකාවේ අනුමත කරන ලද පනතට විරුද්ධව කරුණු පහදා දුන්නා. මේ සම්බන්ධයෙන් මෙතුමාට විශාල ප්‍රසාදයක් පිරි නමන ලදි.

1913 අගෝස්තු 11 වැනි දින එංගලන්තයේ සිට ලංකාවට සැපත් ශ්‍රීමත් දොන් බාරොන් ජයතිලක සහ ආර්යාව ලාංකිය ජනතාව විසින් හරසරයෙන් පිළිගත්තා. මග දෙපස වීථි හා පාරවල් සරසා තිබුණා. පළමුව මල්ලිකා ආර්යාවද කැටුව පෑලියගොඩ පිරිවෙනේ නායක ස්වාමින් වහන්සේ (අතිපූජ්‍ය රත්මලානේ ධර්මාලෝක) නාහිමි ඇතුළු ස්වාමින් වහන්සේලාට වැඳ නමස්කාර කර දෙවනුව වරාගොඩ ගමේ "(සභාපති වලව්ව)" තෙක් තොරණ හන්දිය පසුකර ගමන්කළා. ලංකාවට කීර්ති නාමයක් රැගෙන පැමිණි මෙතුමා වරාගොඩ ගමේ උදවිය පිළිගත්තේ මේ ආකාරයෙනි. මල්මාලා පළඳවා මල්මිටි පිළිගැන්වූ ආකාරය හා සාදර පොලවල් වල පිළිගත් ආකාරය අද මෙන් ඒ කාලයේ සිටි වැඩිහිටි යන්ගේ මතකයේ රැඳී ඇත. මග දෙපස සිටි සෙනග ඉතා ප්‍රීතියෙන් ඔල්වර හඬ නැගුවා. ගමේ ගෙවල් දොරකඩ ගොක්කොළ ආරුක්කු සවිකර තිබුණා. රතිඤ්ඤා හඬ මැද්දේ ගේ දොරකඩට ඇතුළුවන විට මල්වෙඩිල්ලක් පත්තුකර පිළිගත්තා. (ශබ්ද විකාශන) වත්තේ පොල්ගස් කිහිපයක සවිකර තිබුණා. ඒවායේ හඬ ගමපුරා පිළිරැව් දුන්නා. ගමේ අයට හා යහළුවන්ට ඉන් කථා කිරීමට අවස්ථා සැලසුණා. ජයතිලක මැතිතුමාද ජනතාව ඇමතුවා. **කථාවට හා වාද විවාදවලට දක්ෂ ශ්‍රීමතාණන් තමා ගැන වර්ණනාවට වඩා මේ රටේ මිනිසුන්ගේ අවශ්‍යතාවයන් පිරි මැසීමට බලාපොරොත්තු වන බවට ඉඟියක් දැක්වූවා.** මා මෙලෙස මේ කථාවෙන් මේ දරුවන්ට මේ උතුම් චරිතය තුළින් ආදර්ශ රැසක් ගැනීමට හැකි වේවි කියා සිතනවා.

1915 මුස්ලිම් කෝලාහල සමයෙහි සිංහල ජාතීන්ට පක්ෂව රජයට විරෝධ වීම නිසා හා සාමය කඩවන අන්දමින් මිනිසුන් උසිගැන්වීම යන ඔප්පු කළ නොහැකි චෝදනා මත ඩී.බී. ජයතිලක, ඩී.එස්. සේනානායක හා එෆ්.ආර්. සේනානායක ඇතුළු ආදී විරුවන් පිරිසක් ඉංග්‍රීසි පාලකයන් විසින් සිරභාරයට ගන්නා ලදි.

1916 දීත් එංගලන්තය බලා ගිය ජයතිලකතුමාට එහිදී සිරකරුවන්ට වන අසාධාරණකම් ගැන කථා කිරීමට හා පාලක තන්ත්‍රයේ සංශෝධන ඇතිකර ගැනීම සඳහා කථා කිරීමටද අවස්ථා සැලසුණි.

මෙතුමා නොසැලෙස සත්‍ය ප්‍රකාශ කරන නිර්භීත චරිතයක් ඇත්තෙකි.

**වර්ෂ 1924 මෙතුමා ව්‍යවස්ථාදායක සභාවට කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු ලෙස නිතරගයෙන් පත්විය.** අයවැය විවාදයේදී නව හාල් බද්දට විරෝධය පල කළා. ලුණු බද්ද අඩුකළා යුතු බවත්, ඇඟ බද්ද නිෂ්ප්‍රභ කළ යුතු බවත්, සුඛෝපභෝගී භාණ්ඩ ආනයනය කිරීම තහනම් කළ යුතු බවත් ප්‍රකාශ කළා, එකල අය වැය පිළිබඳ විෂය තුනක් සම්බන්ධ කරුණු දක්වා සිටියා.

i. රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් අඩු කිරීම පිළිබඳ විරෝධය

ii. රාජ්‍ය සේවය හැකිතරම් ලාංකීය කළ යුතු බව

iii. සුදුසුකම් ඇති ශ්‍රී ලාංකිකයන් ඉහල තනතුරුවලට පත් කිරීම ආදියයි.

**1923 දෙසැම්බර් 21 වැනි දින ජයතිලකතුමා ජාතික සංගමයේ සභාපති ධූරයට ඒකමතිකව පත් විය. මෙවැනි සේවාවන්හී නිරතවීම නිසා ජයතිලක මැතිතුමා ව්‍යවස්ථා දායකයේ සභාපති ධූරයට පත් කෙරුනි. මේ සෑම කාර්යයන්හී නිරත වීමේදී එතුමා තුල පැවති ස්ථානෝචිත ප්‍රඥාව වැදගත් විය.**

**බාරොන් ජයතිලකතුමාට 1932 දී බ්‍රිතාන්‍ය රාජ්‍ය සම්ප්‍රදායට අනුව 5 වැනි ජෝජ් රජතුමා පිරිනමන ශ්‍රීමත් යන නයිට් නම්බුනාමය පිරිනමන ලදි. ශ්‍රීමත් (සර්) යන නම්බුනාමයෙන් පිදුම් ලද පළමුවැනි සිංහල බෞද්ධ ලාංකිකයා වූයේ මේ යුග පුරුෂයායන්ය. එදින සිට මෙතුමා ශ්‍රීමත් දොන් බාරොන් ජයතිලක නාමයෙන් හැඳින්වුණා. එතුමාට කෙතරම් තාන්න මාන්න ලැබුණත් කිසිදු අහංකාර ගති පෑවේ නැත.** සිනහමුසු මුහුණින් ප්‍රශ්න විසඳුවා මිතුරන්ටත් විරුද්ධවාදීන්ටත් එක සේ සැලකුවා. එය පවුලෙන් පන්සලෙන් පාසල තුළින් ලැබූ පසු බිම විය හැකිය. විදුහල්පතිවරයෙකු හැටියට දරුවන්ට සමීපව පියකු මෙන් කටයුතු කළා.

ජයතිලකතුමා සහ ආර්යාව ධනය පිටුපස ගිය අය නොවේ. පිටරට ඉගෙනීමට තමාගේම ධනය වියදම් කර ඇත. බුලර්ස් පාරේ පිහිටි තර්බන් හවුන් නැමැති තම නිවසේ පදිංචියට පෙර තම ආදරණීය බිරිඳ 1929 දී කලුරිය කලෙන් එතුමා පදිංචිව සිටි දෙහිවල හිල්ස්ට්‍රීට් හී තිබු තම නිවසේ ඥාතීන් සමඟ විසීමට තීරණය කළා. ජයතිලක ශ්‍රීමතානන්ට දරුවන් නොසිටීමත්, මල්ලිකා ආර්යාවගේ අකල් වියෝවත් මෙතුමාට වූ විශාලතම අභාග්‍ය ලෙස සැලකේ.

**එතුමාගේ අන්තිම කැමති ප්‍රකාශයට අනුව බූදලය මහාභාර කාර්යාලයට පවරා දුනි.** එතුමා සතුව තිබූ ඉඩකඩම් දේපල හා බෞද්ධාලෝක මාවතේ පිහිටි 'තර්බන් හවුස්' නැමති සුවිසල් නිවස ඊට අයත්ය. අදත් මහාභාර කාර්යාලය පවත්වාගෙන යනු ලබන්නෙත් ඒ දෙමහල් නිවසේය. මේවායෙන් ලැබෙන ආදායම රට ජාතියට ප්‍රයෝජන වන අන්දමට පරිහරණය කිරීම මහාභාර කාර්යාලයට භාර කර ඇත.

අන්තිම කැමති පත්‍රයේ සඳහන් පරිදි විද්‍යාලංකාර පිරිවෙනට, තරුණ බෞද්ධ සංගමයට හා බෞද්ධ පාසල් කිහිපයකටද ප්‍රතිලාභ සලසා ඇත.

ඩී.බී. ජයතිලකතුමා තම පුස්තකාලයේ පුස්කොළ පොත්, සිංහල පාලි සංස්කෘත ග්‍රන්ථද තරුණ බෞද්ධ සංගමයට ප්‍රධානය කර ඇත. ශ්‍රීමත් දොන් බාරොන් ජයතිලක ජාතික විරුවාණන්ගේ ජන්ම දිනය යෙදී ඇති (පෙබරවාරි 13) එතුමාට කළගුණ සැලකීමක් වශයෙන් වසරක් පාසාම තරුණ බෞද්ධ සංගමය මගින් සමරනවා.

**දරුවන්ට පළමුව මව්බසත් දෙවන බස වශයෙන් ඉංග්‍රීසි භාෂාවේ අවශ්‍යතාවය තම චරිතය තුළින්ම පෙන්වුවා.** පිටරට ගොස් උපාධි ලබා ගැනීමට බොහෝ දරුවන්ට වත්කම් නැතිවීම නිසා **මෙරට විශ්ව විද්‍යාල පිහිටුවීමේ අවශ්‍යතාවය පෙන්වා දුන්නා.** පිරිවෙන් අධ්‍යාපනයෙන් හා දහම් පාසල් පිහිටුවීමෙන් උගත් ශිෂ්ට සම්පන්න දරු කැළක් රටට දායාද කළ හැකි බව පෙන්වූවා. බෞද්ධ පිරිමි පාසල් ආනන්ද විදුහල, ධර්මරාජ විදුහල වැනි පාසල් ගොඩනැගී යන විට කොළඹ විශාඛා විද්‍යාලය ගැහැනු ළමුන් සඳහා අලුත් මුහුණුවරකින් පවත්වාගෙන යනු ලැබීය. මේ පාසල්වල ප්‍රාථමික ඉගැන්වීම සිංහල මාධ්‍යයෙන්ද, ඉහළ පන්ති ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගනීම කෙරුණි. මේ ආදර්ශ දොන් බාරොන් තුළ තිබුණා. **ඉරිදා දින, දහම් පාසල් දිනය, හැටියට සැලකුවා දහම් පාසල්වල දරුවන්ට විභාග පැවැත්වීමට නියම කළා.** පරම විඥානාර්ථ සමාගම මගින් බෞද්ධ පාසල් විශාල ප්‍රමාණයක් ඇරඹුවා.

**අපටම කියා සිංහල ශබ්ද කෝෂයක අවශ්‍යකම දොන් බාරොන් ජයතිලක තුමාට පෙනුණා.** සදා සිහිවටනයක් ලෙස නිරුක්ති සිංහල ශබ්දකෝෂය ලියා ඉදිරිපත් කළා. මෙතුමා ප්‍රධාන කතෘ ලෙස සේවය කළ අවධියේ ශබ්දකෝෂයේ මුල් කලාපය පිට කරනු ලැබුවා. මේ සඳහා මුදලිඳු ගුණවර්ධන මැතිතුමා හා මුදලිඳු මැන්ඩිස් ගුණසේකර මැතිතුමා සමඟ මහන්සිය නොබලා විශාල වැඩකොටසක් ඉටු කළා. ඉන් පසු අන් කතුවරුන් යටතේ ශබ්දකෝෂයේ වැඩ කරගෙන ගියා. අවසාන කලාපය නිකුත් කරනු ලැබුවේ 1992 දීය. ජයතිලකතුමා මේ සඳහා දැමු අඩිතාලම පසුව වැඩකළ කතුවරයන්ට මහත් පිටුවහලක්ම විය. මෙතුමා ලංකාවේ බෞද්ධ ළමුන් සඳහා දහම් පොත් මාලාවක් සකස් කළා. මෙය ලංකාවේ බෞද්ධ ළමුන් සඳහා කරන ලද අනුපමේය මෙහෙවරකි. 1910 ලංකාවේ අමද්‍යප ව්‍යාපාරය ආරම්භ කිරීමේ පුරෝගාමීයෙකු වූ එතුමා ඒ පිළිබඳව කුඩා පොතක් පල කරන ලදී. **"වැලගෙඩියට ඔට්ටු"** හා **"කිරා බුදිදබන්"** වැනි කුඩා ළමුන්ට එතුමා ලියු කවි පන්ති අද දරුවන්ටත් අගනේය.

මෙතුමා සිල්රකින භාවනාවේ යෙදෙන චාම් ගතිගුණවලින් හෙබි කෙනෙක්. ආගමික කටයුතුවල යෙදෙන්නේ සුදු සරම හා බැනියම ඇඳ උපාසක ලීලාවෙන් රුවන්වැලිසෑයේ කොත් පැළඳවීමේ උත්සවයට ගියෙත් උපාසක ඇඳුමින්ය.

1924 වන තෙක් ශ්‍රීමත් බාරොන් ජයතිලක **දේශපාලනඥයෙක් නොවීය.** ඔහු අධ්‍යාපනඥයෙක්, බෞද්ධ සේවකයෙක්, සමාජ සංශෝධනවාදියෙක්, අමද්‍යප සේවකයෙක්, නිදහස උදෙසා සටන් කළ කෙනෙක් පීඩනයට පත් අය වෙනුවෙන් පෙනී සිටි අයෙක් හා යටත් විජිත විරෝධවාදීන්ගේ නායකයකුද විය.

ශ්‍රීමත් බාරොන් ජයතිලක මුළු කාලයම දහමට ඉගනීමට, සාහිත්‍යට හා අධ්‍යාපන සේවයට කැපකළ අයකු වුවද **එතුමාට කිසි කලක දේශපාලනයට පිවිසීමට අවශ්‍ය නොවීය. එහෙත් ඔහුගේ දේශයට ඔහු අවශ්‍ය විය.**

1931 **ඩොනමෝර් නව ව්‍යවස්ථාව යටතේ බාරොන් ශ්‍රීමතාණන් නිතරඟයෙන් අපේ මේ කැලණි ආසනය නියෝජනය කළා. ස්වදේශ කටයුතු ඇමති බවට පත් මෙතුමා අයවැය වාර්තාව සකස්කර ඉදිරිපත් කළ පළමු ලාංකිකයා විය.**

**එකල තිබූ රජයේ අවශ්‍යතා මත ඉන්දියාවේ ලංකාව නියෝජනය කරන මහා කොමසාරිස් ලෙස වැඩ භාරගත්තා.** ඒ අතරතුර හදිස්සියේ අසනීප වූයෙන් ලංකාවට ඒවට තීරණය කළා. 1944 මැයි 29 වැනි දින බැංගලෝහිදී එතුමා කලුරිය කළ බවට දුක් බර ආරංචිය අපට දැන ගැනීමට ලැබුණා. විශේෂ යානාවකින් දේහය ලංකාවට සැපත් කෙරුණා.

ස්වභාව ධර්මය අනුව ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයකුගේ වියෝව අහස කලු කර ගිගුරුම් දිදී වැළපුණ ආකාරය අපට දැකගත හැකි වූ අරුම පුදුම දෙයකි. ජාතික වීරවරයෙකු වූ ශ්‍රීමත් දොන් බාරොන් ජයතිකල නමැති මේ ලංකාපුත්‍රයාගේ දේහය රාජ්‍ය ගෞරව සහිතව විශාල ජනකායක් මධ්‍යයේ ආදාහනය සිදු කරන ලදි.

**මේ ජාතික වීරයාගේ ගුණ ගැයුම ටිබෙට් ජාතික එස් මහින්ද හිමියන්ගෙන් කවි ලියවුණි.** පහත සඳහන් මේ කවි පෙළ ඔබ වැනි දහම් පාසල් යන සෑම දරුවෙක්ම පාසම් කරගත යුතු යැයි මට හැඟේ.

අද බොහෝ දෙනෙකුට අමතකවී ඇති මේ විරුවා ඔබේ මතකයේ සදා රැඳේවා! ශ්‍රීමත් දොන් බාරොන් ජයතිලක නාමය අමරනීයයි.

**ලක් මව අදත් අඬයි**

මේ පත විපත තව මතු විපතට මු ලක
වා ගත නොහැක ගත ඇවිලෙයි ගිනි දැ ලක
මා අත හැර ගියෙන් මගෙ පුතු ජයති ලක
කා වත බලා සැනසෙම් මම කොයි ක ලක

රන් මල් හැලෙන කරුණා බර හි නාවට
පණ්ඩිත කමට යළි සිහි කල්ප නාවට
තැන්පත් කමට රූපෙට වාසනා වට
උන් මගේ පුතා අයියෝ! නැති වු නාමට

හුරු මිස නුහුරු බන නැති කිසිවකුදු හි තේ
දරුවෙකු ජයතිලක නම ගිය සියලු අ තේ
මරු ඇද ගතත් පණ නල ටික උඹේ පු තේ
ගරු නම සදා කල්හිම ගරු කරනු ඇ තේ

ගතේ වෙර සිඳෙන තුරු යහ මගේ යමින්
හිතේ දෑ පෙමින් දිය ගිය මගේ ලමින්
පුතේ උඹ කරපු වැඩ ටික මගේ නමින්
හිතේ පවති ගල කෙටු ඉර වගෙ වෙමින්

උරුමයි ලොවේ කොයි කාටත් මෙබඳු හ දී
දරුවා මගේ මා දැක සැනසෙන්ට නො දී
මරුවා අනේ ගිල ගත්තේ අතරක දී
කරුමේ මහිම එයි ඇස්වල කඳුළු ඇ දී

වියෝවින් උඹේ ලියලන දුක නිසා හි තේ
සතුටින් ගෙවෙන මොහොතෙහි මොහොතකදු නැ තේ
දැකුමෙන් දකින තුරු සසුනෙහි මුනුදි මෙ තේ
සැපතින් ඉඳින් පෙම්බර ජයතකිල පු තේ

ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි.

මේ කතා පුවත අද ඔබ වැනි ඉගන ගන්නා දරුවන්ට ආදර්ශයක්ම වේවා! කියමින් අත්තම්මා කවියකින් කථාව නිම කළා.

එදා උපන් විරුවා පෙන්වූ මේ පාඩම්
අද උපදින දරුවාටයි ඒ ඔවදන්
දරු පරපුර ගුණ නුවණින් වැඩේවා
ඉගනීමේ වටිනාකම දරුවන්ට දැනේවා

# වැවයි දාගැබයි... ගමයි පන්සලයි



මානව වර්ගයාගේ ආරම්භය වනයෙන් සිදුවේ. ගල්ගුහාවල විශාල ගස් බෙනවල වාසය සඳහා සුදුසු තැන් හඳුනාගන්නා තෝරා ගන්නා මානවයා සොබා දහම ලබාදෙන ගස්වල එලවැල දළු-කොළ මීපැණි සහ සතුන් දඩයමෙන් ලබා ගන්නා මස් සිය සිරුර පවත්වාගෙන යාම සඳහා ආහාර වශයෙන් ලබා ලන්නා ලදී. උෂ්ණත්වයෙන් සීතලෙන් සිරුර රැක ගැනීමට ගස් වලින් ලබා ගන්නා කොළ අතු සහ ඇතැම් ගස්වල පොතු තලා මට සිළුටුකොට භාවිතා කරන ලදී.

(මානව විද්‍යාව- මහාචාර්ය නන්දසේන රත්නපාල)

මෙම වනගත මානවයාට දරුවන් බිහිවීම වර්ගයා බෝවීම සමාජ විපරිණාමයේ අතිශයින්ම වැදගත් අවස්ථාව විය. මේ තත්ත්වය යටතේ පවුල් ඒකකයේ ආරම්භය ද වනයේ ගල්ගුහාවෙන් ගස් බෙනයෙන් සිදු වෙයි. එලවැල සොයා ගැනීමට වනයේ ඇවිද ගිය මානවයන් දෙපලගේ ජීවන ක්‍රියාකලාපයේ ප්‍රබල වෙනසක් දරුවා ලැබීමෙන් පසු සිදු වෙයි. දරුවා සමග සිය හිතවතිය ගල්ගුහාවේ ගස්බෙනයේ රඳවන පුරුෂ මානවයා ආහාර සොයන්නට තනියම වනයේ සැරිසරයි. මෙසේ මානවයා විසින් විශ්වයට පවුල නැමති සමාජ ඒකකය ආරම්භ කරයි. පවුල සමාජයට හඳුන්වා දෙයි. මෙම පවුල නැමති ප්‍රබල- ප්‍රාථමික- එහෙත් මූලික සමාජ ඒකකය එදා මෙදාතුර සමාජ විද්‍යාවේ පසු කාලීනව උගන්වන අනුකරන න්‍යාය පදනම් කරගෙන දැවැන්ත වූ විපරිණාමයකට පත්වෙයි. අද අප සිටින්නේ ජීවත් වන්නේ එම විපරිණාමීය පවුල් ඒකකය තුළයි. මානවයාගේ භෞතික ශරීරය මෙන්ම චින්තනය ද නැතහොත් සමස්ත මානව ක්‍රියාවලියම සොබාදහම පරිසරය ගහකොල භූමිය ජලය මත මූලික වශයෙන් පදනම සකසා ගනී. අදටද අනාගතයටද එය අවියෝජනීය පරිසර සබඳතාවයකි.

අපේ ජීවිත වලට කෘෂිකර්මය වැදගත් වන්නේ මෙම මූලසාධකය නිසාවෙනි වෙනත් විදියකින් කියතොත් අපට එයින් වෙන් වූ තොරවූ ජීවිතයක් ඇත්තේම නැත. අනතුරුව මානවයා කල්ගතවෙද්දී වනයෙන් එලියට එයි. ගංගා ආශ්‍රිතව සිය වාසස්ථාන ගොඩනගා ගනී. අනුක්‍රමයෙන් පවුලද ගොඩනැගෙයි සකස්වෙයි.

ඒ අතර මූලික පරිසර සාධකය වූ ජීවන ක්‍රියාවලිය පදනම් කරගත් කෘෂිකාර්මික ස්වභාවය වැඩි දියුණු වනවා මිස පසුබෑමකට ලක්වන්නේ නැත.

ළං ළංව පවුල් කිහිපයක් පැවතීමද ආරම්භයේ සිදු විය. පසුකාලීනව සහ වර්ගයා වර්ධනය වෙද්දී තව තවත් ප්‍රදේශ කරා සංක්‍රමණය වීම ද සිදු වෙයි. වනයේ පදිංචිය අතහැරීමත් සමගම වනයෙන් ලැබූ එල ප්‍රයෝජන එකවරට අත් හැරියේ නැත. එහෙත් අනුක්‍රමයෙන් සොබාදහම හඳුන්වාදෙන විවිධ භෝග වගා කිරීමට ද ඉතා ප්‍රාථමිකව පටන් ගනී. ගල්පතුරු- දැවපතුරු වැනි සොබාදහම හඳුන්වාදෙන ප්‍රාථමික කෘෂි උපකරණ භාවිතය සිදු වෙයි. නිවස සඳහා දැව-මැටි මෙන්ම අව්වෙන් වැස්සෙන් සුළඟින් ආරක්ෂා වීමට විවිධ තෘණ වර්ග අතු වර්ග භාවිතා වෙයි. මේ සියල්ල අනුක්‍රමයෙන් විපරිණාමයට පත් වී සංවර්ධනය වෙයි. භවභෝග වගාවේ නැති නම් කෘෂිකර්මයේ ආරම්භය හා විකාශය ද මෙසේ සිදු වෙයි.

මෙයින් පෙනී යන්නේ සොබා දහම හා පරිසරය මානවයාගේ සමස්ත ජීවන පැවැත්ම වෙළාගෙන ඇති වගයි. එමෙන් ඊට සමානුපාතිකව සමගාමීව කෘෂිකර්මය වැඩි දයුණු වෙමින් විවිධ උපාංග එකතු වෙමින් මානවයාගේ ජීවිතය හසුරුවනු ලබයි ලෝකයේ කිසිදු භූමි ප්‍රදේශයක් නොඑසේ නම් රටක් එකවරම කාර්මිකකරණයට හසුවන්නේ නැත.

මූලිකව කෘෂිකර්මාන්තය තුළින් ආර්ථික ක්‍රමය නිර්මාණය වී පසුකාලීනව ඒ තුළින්ම කාර්මීකරණයට අවතීර්ණ වෙයි. ඒසේ වන්නේ සිරුරේ පැවැත්මට කෘෂිකර්මයේ පවතින සෘජු සබඳතාවයයි.

ස්වාභාවිකව මෙම පිරිස තුළ හසුරුවන මෙහෙයවන අයෙකු නිර්මාණය වෙයි. මෙම මූලික මානව සමූහය රැහේ නායකයාගේ පාලනයට නතු වෙයි. ඔහුට අවනත වෙයි මෙම රැහේ මෙම නායකයාගේ පාලන ක්‍රියාවලියට ද කෘෂිකර්මය ප්‍රබල සාධකයක් වෙයි. මෑත කාලීන ඉතිහාසයේ වෙල් විදානේ මෙබඳු නායකත්ව චරිතයකි. මෙම නායකයන් හඳුන්වා දෙන කොන්දේසි වලට අනුකූලතාවය දක්වන්නට සෙසු අයට සිදු වෙයි. ප්‍රජා සමූහ මෙන්ම රාජ්‍ය හා රජකම මෙන්ම රාජ්‍ය පරිපාලනය දක්වා විකසිත වන්නේ මෙම කෘෂිකර්මය පාදක වූ මානව ජීවන ක්‍රියාවලියයි.

විවිධ වෙනස්කම් වලට භාජනය වෙමින් විපරිනාමයට බඳුන්වන්නේ මෙම රැහේ නායකයා ස්වභාවිකව තමන්ගේ සමූහය පවත්වාගෙන යාම සඳහා ආරම්භ කළ ප්‍රාථමික පාලන ක්‍රමයයි. මෙහි ප්‍රබල ගාමක බලවේගය නැත්නම් මූලික සාධකය කෘෂිකර්මාන්තය වගද අප අමතක කළ යුතු නොවේ.

මානවයාගේ පැවැත්ම සඳහා වන මෙම සාමූහික ජීවන රටාව ගොඩනැගෙන්නේ ද සොබා දහම අත්පත් කර දුන් භූමිය-ජලය-ගස්කොළන්-හිරුඑළිය-වාතය හා විවිධ භෝග වර්ග සමාරම්භක කෘෂිකර්මය ලෙස සමාජගත කරමින් මිනිසාට මෙම සමාරම්භක ස්වාභාවික උරුමයෙන් අත්මිදෙන්නට හෝ අත්හරින්නට කිසිදු යුක්තියුක්තානුභාවයක් ඇත්තේම නැත.

කෘෂිකර්මය මූලික පදනම කරගත් මෙම මිනිසාගේ ජීවන ක්‍රියාවලිය එදාමෙදා තුරු කුමන සම්බාධක පැවතියත් විපරිනාමය වෙමින් නැතහොත් විවිධ සංශෝධන ඇති වෙමින් උපාංග එකතු වෙමින් ඇතැම් උපාංග අතහරිමින් ඉදිරියටම විකාශනය වෙයි.

මෙම කෘෂිකාර්මික සංවර්ධන ක්‍රියාවලිය කෙතරම් පුළුල් ද යත් “මඩ සෝදා ගත් කළ ගොවියා රජකමට” සුදුසු බව කවරෙකු හෝ ප්‍රකාශකර ඇත. එය අතීතයේ ප්‍රබල සමාජ වගන්තියකි. විජයගෙන් ආරම්භවී 1505 න් නිමාවන පැරණි සිංහල රාජාවලියේ සෑම රජකෙනෙක් තමන්ගේ මූලික පරිපාලන ක්‍රියාවලිය යුද ගැටුම් පාලන ක්‍රියාවලියේ විවිධ වෙනස්වීම් සංශෝධන - ප්‍රාදේශීය පාලන ක්‍රම සියල්ල සඳහා කෘෂිකර්මය පදනම් කරගත් රජයේ පැවැත්ම සඳහා බදු පැනවීම මෙන්ම භාණ්ඩාග ාරය ශක්තිමක් කරලීම සඳහා ද කෘෂිකර්මය හා ගොවියා ඉතා පැහැදිලි ලෙස පාදක කරගෙන ඇත.

මේ කටයුතු සමාජ විද්‍යාත්මකව විග්‍රහ කර බලන විට සිංහල බෞද්ධ සංස්කෘතියේ සියලුම උප පද්ධති නිර්මාණය වන්නේ මෙම කෘෂිකාර්මික ක්‍රියාවලිය තුළිනි දැවැන්ත වාරිකර්මාන්තයට මෙන්ම මහා දාගැබ් බිහි වන්නේ කෘෂිකර්මය ලබා දුන් ප්‍රබල සහාය නිසාමය.

“වැවයි දාගැබයි ගමයි පන්සලයි” යන දැවැන්ත ප්‍රකාශයක් සමාජගත වන්නේද මේ නිසාවෙනි.

1505 සිට 1948 දක්වා පුරා වසර 443ක් පැවති විදේශීය ආක්‍රමණිකයන්ගෙන් ශ්‍රී ලාංකික සිංහල බෞද්ධ සංස්කෘතිය සම්පූර්ණයෙන් වෙනස් වෙයි විනාශ වෙයි. එම ආක්‍රමණිකයන් ද සිය වෙළඳ ආර්ථිකය ගොඩනගන්නේද සොබා දහම හා එක්ව අපගේ කෘෂිකර්මාන්තයෙන්ම උකහාගත් මූලධර්මයන් පදනම් කරගෙනය.

තමන්ගේ බලපරාක්‍රමය තහවරු කර ගැනීමටත් තමන්ගේ රටට අවශ්‍ය දෑ නිපදවීමටත් එම පාලකයන් කටයුතු කළ නිසා ශ්‍රී ලංකාවේ විනාශ වන්නේකෘෂිකර්මාන්තය පමණක් නොව ඊට සමගාමීව නිර්මාණය වූ සිංහල බෞද්ධ සංස්කෘතියට අයත් වූ සියළුම උප පද්ධතින්ය. මෙම උප පද්ධතීන් (සමස්ත සංස්කෘතිය) විනාශ වනවා පමණක් නොව බටහිරට ගැතිකම් දක්වන නව වෙළඳ කර්මාන්ත වැවිලි ආර්ථිකයක් බිහිවී මෙරට ජනතාවට මූලිකව ජීවත් වන්නට අවශ්‍ය දේ ආනයනය කරන්නට ද පටන් ගනී. ස්වාධීන නිදහස් කෘෂි ආර්ථිකය අතහැරීම නිසා ගැති බවද සමාජය තුළ නිර්මාණය විය. තමන්ගේ ජීවිත වලට සාමූහිකව වග කියන කෘෂි නිෂ්පාදන ක්‍රියාවලිය අහිමි විය.

ඕනෑම සමාජයක මූලික ආර්ථික ක්‍රියාවලිය වෙනස් වන විට ඊට අනුබද්ධ සියළුම සමාජ පද්ධති වෙනස් වෙයි එසේ වෙනස් වන්නේ සමාජ පද්ධති අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පවතින නිසාවෙන් සහ එකක් මත එකක් යැපෙන බැවිනි. (Inter-relationship and Inter-dependencies)

බුදුරදුන් වැඩසිටි බුදු පහසින් සිසිල්වත්වූ ශ්‍රී ලංකා භූමිතලයේ පෙර පිනකට මෙරට පහලවූ දේශීය ජාතිමාමක ජාතික වීරයන්ගේ උදාර මෙහෙයවීමෙන් 1948දී මූලික නිදහසක් ලබා ගන්නට යෙදුනි.

එහෙත් මෙය පූර්ණ ආර්ථික සමාජ නිදහසක් නොවේ. එය එසේ වන්නේද නැත. එය කල්ගත වන ක්‍රියාවලියකි. එය සමස්ත සංස්කෘතිය මත පදනම්වූවකි.

රටේ වගකීම බාරගත් දේශීය ජනතා නායකයින් මෙම කෘෂි ආර්ථිකයේ ප්‍රථම හා මූලික සමාජ බලපෑම තේරුම්ගත් නිසා ජනපද ක්‍රමය (ඉඩම් බෙදාදීම) කෘෂි උපකරණ ආනයනය කෘෂි රසායනික හා පොහොර - විවිධ ණය පහසුකම් හා සහනාධාර බීජ හා රෝපණ

ද්‍රව්‍යය ආදී උපාග පිළිබඳ අනුග්‍රහය මෙන්ම අවධානය යොමු කරන්නට යෙදුනි එපමණක් නොව නැවත ගම්තුළ සාමූහිකත්වය කෘෂිකර්මය හරහා නිර්මාණය වන්නටද ඉඩකඩ සැලසුනි.

එහෙත් අපේ රට සමෘද්ධිමත් රටක් ලෙස ඉතිහාසයට එක් කරන්නට සමත්වූවායයි සඳහන් කළ නොහැක. දිළිඳු බවද එන්න එන්නම උග්‍රවිය. ආදායම් විෂමතාවය අදටද වැඩිවෙමින් යයි. මේ සඳහා බලපා ඇති හේතු තුනක් සඳහන් කළ හැකිය.

1. සුපිරිසිදු දේශපාලන ක්‍රියාවලිය අපිරිසිදු වීම - ආර්ථික සමාජ- අඩාලවීම මූලික අරමුණින් බැහැරවීම
2. විද්‍යාත්මක හා තාක්ෂණිකව ගලපා ගැනීමට අවශ්‍ය පසුබිම නොමැතිවීම
3. බටහිර කාර්මික කරණය සමග බිහිවන වෙළඳපල - ජනතාවගේ පාරිභෝගික හා පරිභෝජන චින්තනය (පාරිභෝගික වාදය)

කෙසේ වෙතත් අප රට සංවර්ධනය කළ හැක්කේ අපට උරුම අයිතිවූ හිමිවූ කෘෂිකර්මාන්තයෙන් පමණි. දැනට ද ඒ සඳහා කාලය ඉතිරිව ඇත.

ගතවූ 75 වසර තුල විද්‍යාමාන වෙමින් අදට ද අප රටේ කෘෂිකර්මාන්තය තුළ පවතින දුබලතා ගණනාවකි.

1. වගාවට සුදුසු වගා කළ යුතු විශාල භූමි ප්‍රමාණයක් හිස්ව පවතී. ඉඩම් පිළිබඳ කෘෂි ජාතික කළමනාකරණ ප්‍රතිපත්තියක් සක්‍රියව නැත. (සෑම මහ මැතිවරණයකම අවසානයේ ගම්බද ප්‍රජාව ඉඩම් කොල්ලයක නිරත වෙමින් අනිසි අත්පත් කර ගැනීම් වලට දේශපාලඥයන් මැදිහත් වෙයි.)
2. අවශ්‍ය ණය ප්‍රමාණයවත් සහනාධාර ප්‍රමාණයවත් නිසි පරිදි නොලැබේ.

ගොවියාගේ දුක් අදෝනා, වෙළඳපල ගැටළු


3. භෝග විවිධාංගීකරණය - භෝග නවීකරණය, නව ක්‍රමවේද භාවිතය -පොදු හා ප්‍රමාණවත් ජාතික වැඩසටහනක් නැත.
4. පොහොර භාවිතය රජය මැදිහත්වීමෙන් දැවැන්ත ගැටලුවක් බවට පත්කරගෙන ඇත. එය නිෂ්පාදන ක්‍රියාවලියට ප්‍රභල බලපෑමකි.
5. වෙළඳපල පිළබඳ ප්‍රබල නිසි කළමනාකරන වැඩ පිළිවෙලක් නැත.භාණ්ඩ නිෂ්පාදකයාත් පාරිභෝගිකයාත් අපහසුතාවයට පත්ව ඇත.
6. ආහාර තාක්ෂණය අතිශයින් දුබලව පවතී. එනිසාම කෘෂිකර්මයේ පරමාධිපත්‍යය ආරක්ෂා වන්නේ නැත.
7. මුදල් ඉපයීමට මුල් කරගෙන ගෙන වස විස ආහාර හා මුසු කිරීම ප්‍රකට සිද්ධියකි. මුදල් නිසා ඒ සඳහා උපාය මාර්ග නැත.
8. නිෂ්පාදකයන්ට- ගොවියන්ට තාමත් සමාජ ගෞරවය ප්‍රමාණවත් නැත. ඒ අය තාමත් පහල සමාජ ආර්ථික ජීවන මට්ටමක විසදුමක ඡායාවක්වත් පෙනෙන්නට නැත.
9. වගා කල හැකි සරු අස්වැන්නක් ලබා දෙන බොහෝ දෑ ආනයනය කරනු ලබයි. කෙටි වාසි ලාභ සඳහා යොදා ගැනීම.
10. න්‍යායාත්මක විශ්ව දැනුම ලබන පරිස් හුදකලාවී ඇත.(පොතේ ගුරු) භූමිගත පිරිස ද හුදකලා වී ඇත. සුළු පිරිසක් මින් බැහැරව ඇත. එය ප්‍රමාණවත් නැත.

කෙසේ වෙතත් කෘෂිකර්මාන්තය මෙබදු දුර්දාන්ත තත්ත්වයකට පත්ව ඇති බව තේරුම් ගැනීම - විසඳුම් සැපයීම රටක් ජාතියක් වශයෙන් පමණක් නොව ජනතාවගේ ජීවන අයිතිය ආරක්ෂා කරදීමේ දැවැන්ත කාර්යයක් බව වගකිව යුතු උදවිය සිතිය යුතු කල්පනා කල යුතුක්‍රියාත්මක විය යුතු අවධියට අප දැන් පත්ව ඇත.

ක්‍රියාත්මක වැඩ පිළිලෙක් සඳහා අවධානය යොමු කළ යුතු අවස්ථා

1. විමර්ශනයකින් / සමීක්ෂණයකින් පර්යේෂණ අධ්‍යයනයකින් පවත්නා තත්ත්වය හොඳින් අවබෝධ කර ගැනීම
2. භූමිගත ගොවීන්ගේ/කෘෂිකාර්මිකයන්ගේ අදහස් යෝජනා රැස් කර ගැනීම
3. න්‍යායාත්මක අවබෝධය සහිත ප්‍රායෝගික අත්දැකීම් ඇති පුද්ගලයන්ගේ හා ආයතනවල අදහස් යෝජනා ලබා ගැනීම. (උගත යුතු පාඩම්)
4. කෘෂිකාර්මික කටයුතු හොඳින් අභිවර්ධනය වී ඇති රටවලඑම කටයුතු අධ්‍යයනය කර ඒවායින් අපට/අප රටට උචිත අවස්ථා හදුනා ගැනීම ගලපා ගැනීම.
5. රටපුරා දැවැන්ත ප්‍රචාරයක් ලබා දී ජාතික කෘෂි වැඩසටහන සැකසීම ක්‍රියාත්මක කිරීම ජනතා අදහස් ප්‍රතිචාර අගය කිරීම.

**චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ**
ගරු සභාපති
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය



# සම්බුද්ධ පරිනිර්වාණය

ඉපදී ගහක් යට, බුදු වී ගහක් යට
සෙත දී ලොවට පන්සාලිස් වසක් සිට
අම සේ අකාලික සදහම ඉතිරි කොට
නිම කළසේක බුදු කිස වැඩ නිවන් ගෙට

අවසන් මොහොතෙ දුවගෙන ආ කෙනෙකු පවා
පිටමං නොකරමිනි ඔවදන් ඔසුව පොවා
ගෙනදුන් සේක අම රස බව අඳුර නිවා
සදහම් කොඩිය ලෙළ දේ මෙහි උදය හවා

වැනසෙන්නේය කොයි දේ මුත් නැතිව නිමා
එහෙයින් වඩනු විරි, මොහොතක් නැතිව පමා
විදසුන් මග තිබේ නිවනෙහි රසය අමා
අවසන් බුදු වදන සෙත දුනි, තිලොව තෙමා

රැස්වුණු දෙව් බඹුන් දෝතින් වැටුනු මලින්
වැස්සක් වැටුණි ඉඩකඩ නැත, සැදුණු පෙලින්
ගස් යට ඉපිද ගස් යට පිරිනිවුම තුළින්
දිස්විය සරල බව අතහැර දැමුම කෙලින්

අදටත් ජීවමානය බුදු සමිඳු අපේ
අතපත් නිවන ගමු, අතහැර සසර හපේ
පැතුවත් නැතත් සුව දේ පින, ඇතිව ඔපේ
දහමත් පිළිවෙතත් ළඟ, බව අඳුර කැපේ

හමුවෙයි ලොවේ ඇතිවීමද නැති වීම
ගමු ඒලෙසට මගුලකි පිරිනිවි යෑම
දෙමු මුළු ලොවට අත රැඳි සම්බුදු දාම
යමු! අරි අටඟි මග සොයුරනි, දෙසු සේම
(බව = භවය)

**කොළඹ ජාතික රෝහලේ සේවය කළ**
**වෛද්‍ය ඉන්ද්‍රා රත්නායක**

# බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද සිල්පද භාවිතය නැතිවීම

මහින්ද මහරහතන් වහන්සේ විසින් ආරම්භ කරන ලද ලක්දිව භික්ෂු සම්ප්‍රදාය පැවතෙන්නේ ම විනයවාදී වූ උපාලි මහරහතන් වහන්සේගේ ශාසනික ශිෂ්‍ය පරම්පරාවෙනි. එබැවින් ලක්දිව බුදු සමයේ ආරම්භයේ සිටම විනය කෙරෙහි දැක්වූයේ විශේෂ අවධානයක් සහ විශේෂ ගෞරවයකි. ලක්දිව දී රචිත සමන්තපාසාදිකාවේ **'විනයෝ නාම සාසනස්ස ආයු'** යන්නෙන් පෙන්වා දෙන්නේ සම්බුද්ධ ශාසනය රඳා පවතින්නේ ම විනය මත බවයි. එහෙත් බැමිණිතියා සාගතය අවසානයේ දී එතෙක් පැවති විනයට සහ නිවනට මූලිකත්වය ලබා දුන් සම්ප්‍රදාය බිඳ වැටී ඒ වෙනුවට ශාස්ත්‍රීය ග්‍රන්ථකරණය සහ ඒවා ආරක්ෂා කර ගැනීම යන කාරණයට ශාසනයෙහි ප්‍රමුඛත්වය හිමි විය. මෙම තීරණයෙන් පසු ප්‍රතිපත්තිය සහ ප්‍රතිවේදය සපුරා ම අත්හැර දැමුණා'යි වැරදි අවබෝධයකට එළඹිය යුතු නොවේ. එය ටිකින් ටික විනයෙන් ඈත් වීමකි. අද වනවිට බොහෝ දුරට අත්මිදුණු තත්ත්වයකි. ධර්ම කථික හිමිවරුන් සහ පාංශු කුල හිමිවරුන් අතර වාදයක් ඇතිවිය. විනයම මූලිකත්වයෙහිලා සැලකූ පාංශුකුල භික්ෂුන්ට මෙම විවාදයේ දී පරාජය හිමිවිය. මෙය මෙකල පැවති ශාසන සම්ප්‍රදාය ඛණ්ඩනය වීමකි. එකී සිදුවීමත් සමඟ ක්‍රමයෙන් නිවන් මාර්ගයෙන් භික්ෂුන් වහන්සේ ඉවත් වී ග්‍රන්ථධූරය හෙවත් ශාස්ත්‍රීය ධර්ම අධ්‍යයනයට වැඩි වශයෙන් නැඹුරු වන්නට ඇත. එදා සිට පටිපදා සහ ප්‍රතිපත්ති ඉවත්වීමෙන් සිල් පද භාවිතයෙන් ඉවත් වී ශීලයෙහි පිහිටීමද නැති වී ඇත.

බුද්ධ ශාසනයෙහි මූලික අභිප්‍රාය වන විමුක්ති මාර්ගය වැඩීම දෙවැනි තැනකට පත්ව ධර්ම මාර්ගය ආරක්ෂා කිරීම ශාසනික කාර්යයැ'යි සාගත අවසානයේ කල්ලාගම ජනපදයේ මණ්ඩලාරාමයට රැස් වූ බහුතර භික්ෂුහු තීරණය කළහ. ඒ අනුව බැමිණිතියා සාගතය ශ්‍රී ලාංකේය භික්ෂු සංස්ථාවේ මූලික පණිවුඩය සහ සංකල්ප කෙරෙහි ඍජු බලපෑමක් එල්ල කරමින් ශාසන ඉතිහාසයෙහි සන්ධිස්ථානයක් බවට පත්විය.

ක්‍රි.පූ. 77-86 රට පාලනය කළ වළගම්බා රජු ස්වාමීන් වහන්සේලාගේ පරිහරණයට ඉඩ කඩම් පූජා කිරීමත්, තමන්ට උදව් කළ ස්වාමීන් වහන්සේලාට වැඩියෙන් සැලකීමත් නිසා සංඝයා වහන්සේලා දෙකොටසට බෙදීමෙන් නිකාය භේදය සිදුවිය. එම වළගම්බා රජුගේ කාලයේ අවසන් වරට වැඩ සිටියේ මලියදේව මහරහතන් වහන්සේ පමණි. ප්‍රතිපත්ති නොරැකීමෙන් එදා සිට ප්‍රතිපත්ති රැකීම අවම වීම නිසා ධර්මය වනගත විය. රහතන් වහන්සේලා නැතිවීමත් විය. එසේම බුදුරජාණන් වහන්සේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ මංගල ධර්ම දේශනාවේ දී දේශනා කළ සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත සිල් පද භාවිතා නොකිරීමත්, ධර්මය අවබෝධ වීමත්, සීලයෙහි පිහිටීමත්, රහතන් වහන්සේලා ඇතිවීමක් ද නැත. සිත, කය, වචනය සංවර කරගෙන, ශීලයේ පිහිටීමටවත් නොහැකිය. දහම් පොත් පත් ඕනෑ තරම් ඇත. එහෙත් ධර්මය ඉගෙන ගත්තත් ධර්මය අවබෝධ කර ගැනීමට නොහැක. දැන්වත් බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සිත, කය, වචනය සංවර කරන සිල්පද සම්මා වාචා, සම්මා සංකප්ප, සම්මා කම්මන්ත සිල්පද භාවිතා කර කය, වචනය සංවර කරගෙන නිවන් මඟ අවබෝධ කර ගැනීමට බලමු.


- පින් සහ පව් කුසල් සහ අකුසල් - 120/-
- පින සහ කුසලය දෙකක්ද? එකක්ද? - 200/-
- බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය - 350/-
- සිත මනස සහ ආගම් - 80/-
- පංච උපාදානස්කන්ධය - 250/-
- සිත ගැන දැනගන්න - 125/-
- චිත්ත නියාම ධර්ම - 125/-
- සිතිවිලි සහ සිතින් සිතිම - 150/-
- සිත සහ මනසින් කුසල් අකුසල් - කය සහ වචනින් පින් පව් - 100/-
- සිල්වතෙකු වී දහම් අවබෝධ කර ගැනීම - 300/-
- ඉතිහාසය පිළිබඳ ගෞරව ශාස්ත්‍රවේදී, රාජකීය පණ්ඩිත කවුඩාගම්මන රතනසාර හිමි ලියන ලද පොත - 550/-
- ලොව සැමට සිත නිවාගන්න දහම් දැනුම - 125/-
- කය වචන දෙකින් පින් - පව් සිතින් කුසල් - අකුසල් - 250/-
- සිතෙහි සතුට ඇතිකර ගැනීමට කුසල් කරන්න අකුසලෙන් මිදෙන්න - 125/-

**මෙය පින් - පව්, කුසල් - අකුසල් ගැන දැනගැනීමට සලස්වන දහම් පණිවිඩයකි.**

**ත්‍රිපිටකය හැදෑරීමට ඒ. පී. ද. සොයිසා මහතා සරල බසට නැගූ ත්‍රිපිටකය කියවන්න.**

සී/ස ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම
661, 665, 675 පී.ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.
දුරකතන: (011) 2685369, 2686925 ෆැක්ස්: 2674187

## සමාජ සේවා කටයුතු වෙනුවෙන් විශේෂ ජාත්‍යන්තර ගෞරව සම්මාන ප්‍රදානය

මෙයට වසර 40 කට පමණ ප්‍රථම 998 සාමාජික අංකයෙන් සම්මේලනයට ඇතුළත් වූ වසන්ත ද සිල්වා මහතා පුරා වසර 30 කට ආසන්න කාලයක් සම්මේලනයේ විවිධ නිලතල දැරිය. මහජන බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ධුරය දරන සමයේ සම්මේලනයේ වැදගත්ම මණ්ඩලයක් වූ මුදල් මණ්ඩලයේ ගරු සාමාජිකයෙකු විය. සම්මේලනයේ දේපල සංවර්ධනයට හා මුදල් ඉපයීමට මාර්ගෝපදේශ සපයමින් මුදල් මණ්ඩලයට ආදර්ශයක් දෙමින් මාලඹේ සම්මේලනය සතු භූමියෙහි තම පුද්ගලික මුදල් ආයෝජනය කර අංග සම්පූර්ණ කාමර 05 ක ඒකකයක් වැඩිහිටි නිවාස සංකීර්ණයේ ඉදි කරන ලදි. සම්මේලනයේ ගරු භාණ්ඩාගාරික, උපසභාපති වැනි විවිධ තනතුරු දරමින් ආර්ථිකය ශක්තිමත් කිරීමට පෙරමුණ ගත්හ. ''ඔහු කිසිදා කිසිවෙකුගෙන් කිසිවක් නොඉල්ලයි.'' ඔහුගේ පිරිපුන් නායකත්ව ගුණාංග මහිමයෙන් හා  මූල්‍ය කළමණාකරණ හැකියාව අප සම්මේලනයට අරමුදල් ලැබීමට මාර්ගය පාදයි. වර්තමානයේ ඔහු විසින් කළමණාකරණය කරන ලද නිවාසවලින් සම්මේලනයේ ආගමික හා ශාසනික, සමාජයීය කටයුතු සඳහා අරමුදල් විශාල වශයෙන් මුලස්ථානයේ කටයුතු වලට ලබා දී ඇත.

''විනය ඇති තැන සාර්ථකත්වයේ සලකුණ බව ඔහුගේ අදහසයි.'' ඔහු කළමණාකරණය කරනු ලබන සියලු නිවාස 2013 සිට 2022 දක්වා රුපියල් මිලියන 17 සිට 93 දක්වා 547% කින් තැන්පත් වර්ධනයක් ඇති කර ඇත. ඔහුගේ මූල්‍ය කළමණාකරණ හැකියාවෙන් අප සම්මේලනයට කරන ලද සුවිශේෂී සේවාවටත්, වැඩිහිටියන්ට විශ්‍රාම වයසේ සුවසේ ගත කිරීමට දරනා වෙහෙසටත්, කැළණි රජමහා විහාරයේ ගරු භාණ්ඩාගාරික ලෙස දීර්ඝ කාලයක් කැළණි මිටියාවතට කරන ලද සේවය අගයා වෛකල්පිත ජාත්‍යන්තර විවෘත විද්‍යාලය 2023 වර්ෂයේ උපාධි ප්‍රදානෝත්සවය සහ සංවත්සර උත්සවය බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී 2023 නොවැම්බර් මස 24 දින පැවැති අතර, එහිදී උතුරු ඇමෙරිකාවේ"'චැප් විශ්ව විද්‍යාලයේ අධ්‍යක්ෂක මහාචාර්ය රිකාඩෝ මැතිතුමා විසින් ජාත්‍යන්තර විශේෂ ගෞරව සම්මානයක් සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ජාතික සමාජ සේවා මණ්ඩලයේ ගරු සභාපති වසන්ත ද සිල්වා මැතිතුමා වෙත ප්‍රදානය කරනු ලැබූ වගයි.

රටට ජාතියට ආගමට සුවිශේෂී සේවාවක් කිරීමට වසන්ත ද සිල්වා මැතිතුමාට සහ එම මැතිණියට නිදුක් නිරෝගී සුවය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

සංස්කාරක මණ්ඩලය





# Paryatti , Pratipatti, Learning and Practicing

The title consists of four different terms. However, Paryatti and Pratpatti are used in the doctrine as the formal Pali terms to refer to Learning and Practicing. The objective of this presentation is to see the relevance of 'learning the doctrine' and 'practicing the doctrine' to achieve the final goal of the Buddhist practitioners and to apply a focused attention towards the path of progress.

In the past there had been dialogues leading to even debates on which one out of learning and practicing is more important. The general consensus had been in favour of learning. But there is a need to appreciate that the aspirations of those who promote and develop such dialogues, would be different from the aspirations of those who seek liberation from Samsara, the cycle of birth and death. We, at Buddhist organizations, where the large majority are practitioners who seek liberation from Samsara should consider practicing as the primary need. **In this regard The Buddha at the time of Parinibbana clearly emphasized the need to practice Appamada.**

A seeker of liberation has to understand the true nature of reality which is the highest level of wisdom. This is a penetrative realization which a practitioner has to directly experience. For the purpose of understanding reality, mental development is essential as compared to learning. In this regard **Dhammapada ( stanza 19)** states as follows:-

> ***''Though he recites a large number of scriptural texts, but does not act accordingly, that heedless man is like the cowherd who counts cows; he has no share in the blessings of a recluse."***

A question arises as to whether studying gives rise to more understanding than from practicing mental development. It is noteworthy that mental development can be directly experienced through practicing. Academic boundaries can become artificial. Pure knowledge alone can lead academics to commercial gains and marketability. **However, it has to be emphasized that a certain level of learning is needed for practicing.**

According to the doctrine the path taken by a Buddhist is seen as a trifold progress referred to under three heads - Paryatti, Pratipatti and Prativedha; meaning the three stages of **learning , practicing and realizing.** Each stage gives rise to the next higher stage. This analysis shows that realization is achieved through practicing.

A practitioner has to appreciate the value of time available for practicing and what his priorities should be in maximizing the benefits of utilization of the limited time available. The wholesome activities which a practitioner can adopt can be broadly divided into 3 groups Dana (donations), Seela (morality) and Bhavana (mental development). Traditionally it is seen that Buddhists are practitioners of alms-givings. It is also observed that most of them get so accustomed to alms-givings that they continue to remain donors of alms without realizing that there are great opportunities of further developing the practice through Sila (morality) and Bhavana (mental development). It is correct that through Dana one can develop the quality of renunciation or giving-away (nekkhamma), which is one of the ten perfections. But it is far more beneficial to practice mental development through observation of Sila and proceeding to the practice of meditation.

The doctrine preaches a 'path' or 'Magga' better known as Noble eight –fold path. It has to be appreciated that all eight factors which come under three groups – virtue, concentration and wisdom - are there to be practiced together simultaneously.

During a life-time it is important that there should be continuous progress in the practices. There is a need to move along the path progressively without allowing it to be stagnant. By getting attached to too many traditions and ceremonies, practitioners tend to get into rituals which can become an impediment to progress. Rituals can become useful only as stepping stones to start focusing one's mind for activities which help in mental development. It is noteworthy that in the doctrine the 'rituals and rites' have been listed as one of ten fetters or Dasa Sanyojana which are impediments on the path of practice. It is also one of the four 'Upadanas' (clingings) which a practitioner has to avoid.

Meditation can take the form Samata (tranquility) where one-pointed ness and removal of five hindrances can be achieved. The next stage of progress towards Vipassana (insight) which helps one to gradually realize the true nature of our existence, is also possible. Vipassana itself can be in different postures (a) seated (b) walking (c) day to day activities with clear-comprehension (Sampajanna). Those who practice Satipatthana can progress from mindfulness on body (Kayanupaasana) towards the other three foundations of mindfulness gradually. It is important to realize that pactising of Sila (virtue) and Bhavana (meditation) can be performed in a temple or even at the residence itself depending on the suitability of environment.

**Continuous progress through practicing mental development in achieving realization of the true nature of our existence will result in the liberation from Samsara**.

May all living beings be well and happy.!

**Das Miriyagalla**



# සීවලී මහ රහතන් වහන්සේට පල දුන් කුසල අකුසල කර්ම

සීවලී මහ රහතන් වහන්සේ ප්‍රත්‍යාලාභීන්ගෙන් අග්‍රශ්‍රාවක තනතුර ලැබූ තැනැත්තෙකි. ඒ නිසා කිසිඳු අවස්ථාවකදී ආහාර අහිමි වූ අවස්ථාවක් අසන්නට ලැබුණේ නැත. බෞද්ධ නිවැසි ජනතාව අතර සීවලී හිමියන්ගේ පිංතූරයක් නොමැති නිවසක් දකින්නට ලැබෙන්නේ ඉතාමත් කලාතුරකිනි. අපහසුවක් නොමැතිව නිවසට ආහාර ටික ලැබේවා යනුවෙන් සෑම නිවැසියකුගේ ප්‍රාර්ථනාව මත සෑම නිවසකම මැද සාලයේ බිත්තියක සීවලී තෙරුන් වහන්සේගේ පිංතූරයක් දකින්නට ඇත.

අද පමණක් නොව බුදු රජුන් ජීවමාන කාලයේදී පවා බුදුන් වහන්සේ ඇතුළු භික්ෂු පිරිසක් සමඟ දුර බැහැර ගම් නියම්වල සැරි සරන විට පවා සීවලී මහ රහතන් වහන්සේ තම පිරිසේ සිටිනවාදැයි විපරම් කර බැලූ අවස්ථා බුදුන් වහන්සේගේ ගමන් බිමන්වලදී පෙනී යයි. එබඳු එක් අවස්ථාවක් මෙසේ දක්වමි.

දිනක් බුදුරජාණන් වහන්සේ මහා සැරියුත් තෙරුන් වහන්සේගේ බාල සහෝදරයා වූ රේවත තෙරුන් දක්නා පිණිස හිරණ්‍ය වන විහාරයට වැඩියේ සිය ශ්‍රාවක පිරිස තිස් දහසක් භික්ෂූන් වහන්සේලා සමඟය. මෙම හිරණ්‍ය වන විහාරයට වැඩිය යුත්තේ තොරක් නොපෙනෙන මහා වනයක් මැදින්ය. එහි දුර ප්‍රමාණය සැට යොදුණකි. දිනකින් දෙකකින් ගමන කෙළවර කළ නොහැකිය. මනුෂ්‍ය ගමනා ගමනයට නුසුදුසු රාක්ෂ, ප්‍රේතයින් හා මහ පල් සොරුන් මෙන්ම වග වළසුන් ගැවසෙන වනාන්තර ප්‍රදේශයකි.

කෙසේ වෙතත් බුදුන් වහන්සේ ශ්‍රාවක පිරිස සමඟ ගමන ආරම්භ කර ටික දුරක් පැමිණි කල්හි ආනන්ද හිමියෝ එක්තරා ස්ථානයක දී දෙමඟක් දැක බුදු හිමියන්ට ප්‍රකාශ කර සිටියේ "ස්වාමිනී මේ මං දෙකම රේවත මහ තෙරුන් වසන තැනට යන මාර්ගයන් බවයි. මේ මාර්ග දෙකේ දුර සැට යොදුනකි. ඒ මග මනුෂ්‍ය වාසයක් ඇත්තේ නැත. අමනුෂ්‍ය වාසය මේ මං දෙකළවර වන තෙක් ඇති බව බුදුහිමියන්ට දැන්වීය. එවිට බුදුන් වහන්සේ ආනන්දයෙනි, අප සමඟ සීවලී ඇවිද්දැයි විචාරා..... එසේය ස්වාමීනි කී කල්හි එසේ නම් කිට්ටු මාර්ගයෙන් යම්හයි වදාළ සේක.

සීවලී තෙරුන් වහන්සේගේ කුසලය විපාක දෙන්නට අවසර ලත් තැන යයි දැනම ඔබගේ කුසල මහිමය ප්‍රකාශ කොට දක්වනු පිණිස සීවලී අවු නම් ළං මඟ යම්හයි වදාළ සේක.

මෙසේ කිසිවෙකුටත් නොලැබූ අයුරින් සීවලී මහ රහතන් වහන්සේට ප්‍රත්‍ය පහසුව සැලසුණි. එසේ හෙයින් පසු කලෙක බුදු රජාණන් වහන්සේ ප්‍රත්‍යලාභීන් අතර අග තනතුරෙහි තැබූහ. මේ අග තනතුර ලැබීමට උන්වහන්සේ සසරදී කළ විශේෂ කුසලයන් හේතුවිය. ඒ හා සම්බන්ධ අතීත කතාව මෙසේ දක්වමි.

පියුමතුරා බුදුන් වහන්සේ එක් භික්ෂුවක ප්‍රත්‍යාලාභීන් අතර අග තනතුරෙහි පිහිටු වූහ. ඒ සමයේදී සීවලී හිමියෝ තරුණයෙකි. ඔහු ද ඒ දැක මම ද මතු බුදු සසුනක ප්‍රත්‍යාලාභීන් අතර අග තනතුරු පැතුවේය.

එතැන් සිට සසරේ දිගු කාලයක් ගෙවී ගොස් විපස්සී බුදු සසුන ලොව පහළ විය. එදා ප්‍රාර්ථනා පැතූ තරුණයා මෙදා ද ගම්වැසි තරුණයකු විය. දිනක් දී කිරි රැගෙන නගරයට යන ඔහුට අතර මග දී දඬුවැල් බෑ මීයක් හමුවිය. ඒ පැණි ද රැගෙන නුවරට එන අතර තුර එක් මිනිසෙක් ඔහුට හමු විය. ඔහු ද සොයා ගන්නේ කිරි හා මී පැණිය.

විපස්සී බුදු රජුන් ඇතුළු මහ සඟරුවනට රජතුමා දුන් දන් පරදවා මහා දානයක් දීමට නුවර වැසියන්ට අවශ්‍ය විය. ඒ සඳහා අවශ්‍යම දාන වස්තු දෙක දී කිරි හා මී පැණිය. දාන වස්තු සොයා ගිය මිනිසාට දී කිරි හා මී පැණි මිල දී ගැනිමට සූදානම් වුව ද, මේ ගම්වැසි තරුණයා ඒවා නොවිකුණුවේය. පිං පිණිස බුදු හිමියන් ඇතුළු මහා සඟරුවනට ඒවා සියතින්ම පූජා කළේය. ඒ කුසල කර්මය නිසා ගෞතම බුදු සසුනේ ප්‍රත්‍යාලාභී තනතුර ලැබුවේය.

එසේ කුසල පැත්ත මෙන්ම සීවලී මහ රහතන් වහන්සේ පෙර කරන ලද අකුසල කර්මය නිසා විඳි දුක් ගැහැට ගැන මෙසේය. පෙර කලක සීවලී මහ තෙරුණුවෝ බරණැස නුවර රජ බවට පත් විය. තමාට හිමිව ඇති රාජ්‍යයෙන් සෑහීමට පත් නොවී රජතුමා වෙනත් රාජ්‍යයක් තමා සතු කර ගැනීමට සිතීය. දිනක් එක් රාජධානියක් අල්ලා ගැනීමට සේනා සමග රජතුමා පිටත් විය. ඒ රාජධානියේ සතර වාසල් දොරටු රැකවල්ලා ගෙන සත් අවුරුදු සත් මාසයක් එහි ජනතාව සිර කර ගත්තේය. එහෙත් රාජ්‍යය අල්ලා ගැනීමට නොහැකි විය.

සතර වාසල් දොරටු අල්ලා ගත්තත් ඒ නගර වැසියෝ හොඳින් කාබී දිවි ගෙන ගියේය. රජුට මේ කරුණු දැන ගැනීමට ලැබී ජනතාව හොඳින් සිටින්නේ කොහොමදැයි තොරතුරු සෙවීය. එවිට දැන ගැනීමට ලැබුණේ නගර වැසියන් පිටත නගරයට ගොස් තමන්ට අවශ්‍ය ආහාර පාන ගෙන එන බවයි. ඒ සඳහා පිටතට යෑමට ඊමට කුඩා කවුළුවකින් යන එන ආකාරයකි. මව් බිසවව පුතුගේ අසාර්ථක ක්‍රියාව ගැන අසා නුවරින් පිටවීමට ඇති කවුළුව පවා වසා රැකවල් ලා සිටින ලෙස දන්වා යැවීය. පුතු රජතුමා මවගේ වචනය ඉටු කළේය. මේ නිසා නුවර වැසියෝ දැඩි වෙහෙසට පත්වූහ.

මේ තත්ත්වය ඉවසා ගත නොවූ නුවර වැසියෝ රජතුමා මරා දමා රාජ්‍ය බරණැස් රජුට භාර කළහ. සත් අවුරුදු සත් මසක් නුවර ජනතාව නුවර තුළ සිරකරුවන් බවට පත් කිරීමෙහි දරුණු විපාකය අපා දුක් ලබා දීමෙන් කෙළවර නොවීය. රහත් භාවය ලබන ජීවිතයේ දී එදා කළ අකුසල කර්මයේ ශේෂ විපාකය පල දෙමින් සත් අවුරුදු සත් මසක් මව් කුස තුළ දුකට පත් කළේය. එදා පුතුගේ නරක ක්‍රියාවට මව ද සහභාගී වූ සෙයින් මෙදා සුප්පාවාසයට තම දරුවා සත් අවුරුදු සත් මසක් කුසෙහි දරමින් දැඩි දුක් වින්දාය.

ගෞතම බුදු රජුන් ලොව පහළ වූ සමයේ කෝලිය නුවර මහා ලිච්ඡවි රජුට දාව සුප්පාවාස නම් කෝලිය රජ බිසවගේ කුස තුළ දරුවෙකු පිළිසඳ ගත්තත් සත් අවුරුදු සත් මසක් යනතුරු දරුවා මෙලොවට බිහි නොවීය. දරුවා මෙලොවට බිහිවන අන්තිම සතියෙහි බිසව වඩාත් දුකට පත්ව බුදු රජුන් සිහි කළාය. සැමියා මගින් තම දුක බුදු රජුන්ට දැන්වීය. මෙත් කරුණා ගුණැති බුදු රජුන් ඇයට හා දරුවාට ආශිර්වාද කළහ. ඒ ආශිර්වාදයෙන් නිවසේ සිටි සුප්පාවාස බිසව නිදුකින් පින්බර පුතෙකු බිහි කළාය. සියලු දෙනාගේ සිත් සතන් සිසිල් කරමින් උපන් හෙයින් සීවලී යන නම තැබූහ.

බෙහෙතකින් නොලත් ආශිර්වාදයෙන් ලත් මේ අසිරිමත් සිදුවීම කෙරෙහි සුප්පාවාසවගේ සිත දැඩි ලෙස බැඳී ගියේය. ඇය සත් දිනක්ම බුදු පාමොක් මහ සඟ රුවනට දන් දුන්නේය. සීවලී කුමරු සත් හැවිරිදි වියේ දී පැවැදි වීමට දැඩි කැමැත්තක් දැක්වීය. කුමරුගේ පැවිද්ද අවශ්‍ය කටයුතු මව් පියන් විසින් සලසා දුනි. සීවලී කුමරුගේ හිස කෙස් කපා නිමවිය. කුඩා වුවත් මහ නුවණැති කුමරුගේ කෙස් කපා නිමවනවාත් සමඟම රහතන් වහන්සේ නමක් විය. හිසේ තිබූ බර එලෙසින්ම ඉවත් විය. මේ කුඩා රහතන් වහන්සේ සැරියුත්-මුගලන් රහතන් වහන්සේලාගේ දෙනමගේ ප්‍රධානත්වයෙන් පැවිදි විය.

බුදු පියාණන් වහන්සේ වේරංජා නුවර වස් විසූ සමයේ බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට දානය පවා ලබා ගැනීමට අපහසු වුවත් සීවලී මහ රහතන් වහන්සේ ගේ පුණ්‍ය බලයෙන් කිසි දිනක දානයෙන් හිඟයක් නොවූ බව බෞද්ධ සාහිත්‍යයේ දැක්වේ.

**නරේන්ද්‍ර බණ්ඩාර පෙරමුණේ**
ශාස්ත්‍රපති - සාම විනිසුරු (මුළු දිවයින)

# ඇයද උත්පලවණ්ණාවකි

## (හතරවන පරිච්ඡේදය)

උත්පලා උදෑසනම නැගිට වෙනදාටත් නැති උද්‍යෝගයකින් උදෑසන ආහාර පිළියෙල කළාය. සුපුරුදු පරිදි නයනානන්ද නැගිට උත්පලා අතින් පිළිගැන්වුන තේ කෝප්පය උගුරට දෙකට බී ඇඟපත සෝදා කන්තෝරුව වෙත යන්නට කඩිනමින් සූදානම් වූයේ බසයට තවත් විනාඩි පහළොවක් පමණ තිබූ නිසාවෙනි.

"බිංදු .........." උත්පලා දියණියට කථා කළාය. ඒත් සමඟම උක්කු පුතාද අවදි වී අක්කා පිටු පසම උයනගෙට සේන්දු වූයේ දෑස් දෑතින් පොඩිකරමිනි. "අම්මා ඇයි අද ගොඩක් බත් වෑංජන....." උක්කු පුතා ප්‍රශ්න කරයි. "අද ලොකු මාමා සීයත් එක්ක මෙහෙ එනවනේ". "අදම යනවද? අම්මේ..."

"නැහැ බිංදු.. සීයව මෙහෙ නතර කරල ලොකු මාමා විතරක් යයි. ලොකු මාමලා රට යනවලුනේ, එයාල එනකල් සීයව අපි හොඳට බලාගන්න ඕනේ. ඉස්සරහට බිංදුටයි උක්කු පුතාටයි ටිකක් වැඩ වැඩිවෙයි."

"අපි මොනවද කරන්න ඕනේ අම්මේ...." "සීයව වෙලාවට නාවන්න, කෑම බීම හදලා දෙන්න බෙහෙත් දෙන්න රෙදි පෙරෙදි සෝදන්න මට උදව් වෙන්න ඕනේ, නිතරම සීයත් එක්ක කථා බහ කරන්න ඕනේ, සීයට තනියම කල්පනා කර කර ඉන්න දෙන්න නරකයි. ආච්චි නැති වෙලත් ඒ හැටි කාලයක් නෑනේ, ලොකු මාමත් ඈත් වෙනකොට සීයට තනිකමක් නොදැනෙන්න අපි සීයත් එක්ක නිතරම මුහුවෙන්න ඕනේ..."

උත්පලාගේ පියා වෘත්තියෙන් ගුරුවරයෙකි. විශ්‍රාමයෙන් පසුවද දහම්පාසල් ගුරුවරයෙකු ලෙස බොහෝ කලක් කටයුතු කර ඇත. දැනට සියලු කටයුතු වලින් ඈත්ව සිටින්නේ දෙපා ඉදිමී තනිව ඇවිදීමට ඇති අපහසුව නිසාමය.

නාන කාමරය අසලම ඇති කෑම කාමරයේ කොටසක් තිර රෙද්දකින් ආවරණය කර ඇඳක්, මේසයක්, හාන්සි පුටුවක් සමඟින් පියාගේ සුව පහසුවට අවැසි පරිදි කාමරයක් සකස් කිරීමට උත්පලාට හැකි විය. ලොකු අයියා සමඟ පැමිණි තාත්තා ගමන් මහන්සිය නිසාදෝ හෝරා කීපයක් නිදන්නට විය. උත්පලා කිහිපවිටක් තේ සූදානම් කරන්නට එබී බැලුවද තාත්තා සුවපහසු නින්දකය. බිංදු ද, උක්කු පුතා ද, පාසල් ඇරී ගෙදර ඒමට හෝරා දෙකක් පමණ ඇත.

අද තාත්තා නාවන්නට වුවමනා නැත. සවස් වරුවේ ස්නානය අපත්‍ය වන්නට ඉඩ ඇත. හෙට සෙනසුරාදා දිනයක් බැවින් දරු දෙදෙනාද සම්බන්ධ කරගනිමින් ඒ කටයුත්ත කිරීම වඩාත් ඵලදායි වන බව උත්පලා සිතයි. තාත්තා උගුරපාදන හඬින් කල්පනාවෙන් මිදුන උත්පලා ඔහුට දහවල ආහාරය බෙදා දුන්නාය. අනතුරුව උත්පලා උදෑසන තැම්බූ හැලපයක් ද තාත්තාට දුන් විට කිතුල් පැණිවලට පොල් මුසු කර පදමට ලුනුද දමා කුරහන්පිටියෙන් තනා තැබූ හැලප වල රස වර්ණනා කරමින් තාත්තා දෙවෙනි හැලපයකින් ද අතුරුපස සම්පූර්ණ කර ගත්තේය. ඊලඟ රාජකාරිය වූ හක්ක පිරෙන්නට මුඛට ඔබා ගන්නා බුලත් විට සඳහා අවැසි කලමනා ලඟට කර දුන් උත්පලා ද පුවක් පෙත්තක් හපමින් තාත්තා සමඟ දොඩමළු වූවාය.

"තාත්තා මෙහෙ ආවා කියලා පන්සලේ ලොකු හාමුදුරුවෝ දන්නවද?"

පයින්ඩයක් ඇරියා යා ගන්ඩ බැරි වුනා. පහුගිය දොහේම කකුල් අඩිය තියන්න බැරුව හොඳටම අමාරු වුනා. අනේ පුතේ මේ කරුම ලෙඩේ හන්දා මට නං මේ ආත්මේදී සංසාරෙන් එගොඩ වෙන්න වෙන්නේ නෑ. දනක් පිනක් කරගන්ඩ කොහේවත් යන්න එන්න නෑ. මලක් පහනක් පූජා කරගන්න විහාරෙකට යා ගන්න බෑ......"

"අනේ තාත්තේ ඇයි එහෙම කියන්නේ....... විස්සෝප ගන්න කාරි නෑ මම කියල දෙන්නම්කෝ තාත්තට කොහේවත් නොගිහින් ඔය සේරම ටික කර ගන්නේ කොහොමද කියලා. තාත්තා ගුරුවරයෙක් වෙලා ඉන්නෙද්දි පාසල් ළමයින්ටත් දහම්පාසල් ළමයින්ටත් බුද්ධ ධර්මය ඉගැන්නුවට පොත් පත් වල තියෙන

කරුණු ජීවිතේට ප්‍රායෝගික කරගන්න විදිය ගැන කල්පනා කරලම නෑනේ. ප්‍රශ්න පත්තර වලට පිළිතුරු ලියන විදිය ළමයින්ට ඉගැන්නුවට ඒ කරුණු කාරණා ළමයින්ගේ ජීවිත ඇතුලේ කොහොමද ක්‍රියාත්මක වෙන්නේ කියලා ළමයින්ට කියා දීලත් නැතිව ඇතිනේ. බුදුවරු ලෝකයට පෙන්වා දුන්නේ දහමක්. ඒ තමයි මේ ලෝකේ තියෙන පරම සත්‍යය. මේ ලෝකේ ධර්මතාවල ස්වභාවය. එහෙමත් නැත්නම් සොභාදහමේ යථාර්තය. ඒක විභාග පාස්කරලවත් ගාථා කිය කියා ඉදලවත් අවබෝධ කරගන්ඩ බැහැ.

සත්වයා දුක් සහිත සසර ක්‍රියාත්මක වන්නේ කුමක් නිසාද? එය අවබෝධයෙන්ම සසරින් මිදිය හැකි මගයි බුදුවරු කියා දුන්නේ. තාත්තට කොහේවත් ගිහින් කරන්න දෙයක් නෑ. ඔය ඉන්න තැනම ඉදගෙන ඔය හිතට එබෙන්න. ඔය හිත තුළ ක්‍රියාත්මක වෙන බර සිතුවිලි වලින් මිදෙන්න. එහෙමත් වෙන්නේ ඇයි? කියලා හිතන්න. ආයතන හයේ ක්‍රියාකාරීත්වය දහම් පාසලේ අභිධර්මය උගන්වපු නාම, රූප බේදීම තුලින් මෙනෙහි කරන්න. රූප, වේදනා, සංඥා, සංඛාර, වලට බැදෙන මායාව හඳුනා ගන්න. ඒ පිළිබඳ හඳුනාගත්ත තැනම ඔය සිතට එන බර සිතුවිලි වලින් ඉබේම මිදෙයි. ඒ විදියට තමන්ගේ හිත දිහාම සතර ඉරියව්වෙම බලාන ඉන්න. ඒක තමයි බුදුපියාණන් වහන්සේ සතර සතිපට්ඨානය ලෙස දේශනා කළේ.

තාත්තා වගේ කරුණු කාරණා දන්න කෙනෙකුට තමා තුළින් ලෝකය ගොඩ නැගෙන විදියයි එය අවබෝධයම ලෝකයෙන් මිදීමයි කියන එක මීට වැඩිය කියන්ඩ දෙයක් නෑ මයේ හිතේ. ඔය තමයි තාත්තා බුදුන්වහන්සේලාට කරන උතුම්ම පූජාව.

සාදු...! සාදු...! සාදු...! අනේ පුතේ මට වැටහුනා ........ දොහොත් මුදුන් තබා සාදු කියමින් තාත්තා දෙනෙතට ආ කඳුළු පියදා ගන්නා විට උත්පලා එය නොදැක්කාසේ සිටින්නට උත්සාහ කළාය.

ඉනික්බිතිව තාත්තා ඇදෙහි වැතිර සිවිලිම දෙසට නෙත් යොමා බොහෝ වේලාවක් සිතින් යමක් මුමුන මුමුනා තේරුම් ගන්නට උත්සාහ කරන බවක් පෙනුණි. උත්පලා දරුවන්ගේ දහවල කෑම මේසය උඩ තබා කූඩයෙන් වසන ගමන් කාමරයට එබෙන විටත් තාත්තා කල්පනා කරමින් සිටින බව පෙනුනි. ඔහුට නොදැනෙන්නට ඒ දෙස බලා සිටි උත්පලාගේ සිතෙහි ඔහු පිළිබඳ මහා සංවේගයක් හට ගැනුණි. එවැනි විටක ඇය නිතර යමක් සටහන් තබන කුඩා පොත් පිංච කෑම මේසය කොනකින් ගෙන සිතට ආ සිතුවිලි පද පේලි බවට පෙරළන්නට විය.

අක් බඹර දිගු හැරී තඹුවන්
රත් දෙතොල් මත ඉරී ඇදී
නෙත් කොනින් බැලූ ඉගි බැලුම්
හිස් අහස දෙසටම විදී

සතුට ගෙන දුන් වදන් ගොළුවී
ගොත ගැසුන බස් ඉකි බිඳී
දුබල වී ඇත සිත ගතත්
දෙපා වාරුව අහිමි වී

නුඹ තුළින් නුඹ සොයාගන්නට
පමා වූ බව සැබෑවී
බවයේ බියකරු බව නියාදෝ
නෙතඟ කඳුලට හාදු වී .......

අනතුරුව උත්පලා තම නෙතට ආ කඳුළු ද දෑතින් පිස දිගු සුසුමකින් ලය ලිහිල්කර ගත්තාය. කෙසේ හෝ තම පියාණන්ට හැකි ඉක්මනින් දහම අවබෝධය පිණිස අවැසි සියලු කටයුතු ක්‍රියාත්මක කිරීම මැනවයි ඇයට සිතුනි.

බිංදු හා උක්කු පුතා තරඟයට මෙන් බොරළු පාර දිගේ එනු පෙනේ. ඊට පිටු පසින් උඩ ගෙදර උදාරි දුවය.

"ඔන්න නැන්දේ අද නංගියි මල්ලියි මාවත් දාල ඉස්කෝලේ ඉදලම ඔය දුවගෙන එන්නේ සීයා බලන්න. සීයා ආවද නැන්දේ?"

"ආවා..... ආවා.... දුවේ. දවාලට කාලා එහෙම දැන් ටිකක් නින්ද ගිහින් වගේ" මාත් හවස් අතේ ඔය පැත්තේ එන්නම් නැන්දේ උක්කු..... බිංදු...... මං යනවා....... උදාරි ගෙමිදුල දිගේ ගොස් කෙටි තාප්පයෙන් පැන ඇගේ නිවසට සේන්දු විය.

දයා හේවාගම
අනුරාධපුර



# තාරුණ්‍යය හා බුදුදහම

ආගම සහ දර්ශනය බොහෝ තරුණ ජීවිත හා එක්ව ගමන් නොකරයිද? බොහෝ තරුණ තරුණියන් ආගම පිළිබඳව ඇති කරගෙන ඇත්තේ ශුභවාදී හැඟීමක් නම් නොවේ. එයට හේතුව ලෙස ඔවුන් සිතන්නේ තරුණ වයසෙහි පිනවිය යුතු හැඟීම් වලට ආගම නිසා බාධාවක් වන බවයි. මේ නිසා සමහරුන් සිතන්නේ "වයසට ගියාම ඕවට කල් තිබෙනවා" යනුවෙනි. මෙම පොදු මතය හා හැඟීම නිසා කුමන ආගමක සිද්ධස්ථානවල නමුත් තරුණ පිරිස අඩුවී සහභාගී වන වැඩිහිටි පිරිසගේ ප්‍රමාණය වැඩිය. එනමුත් සංගීත, චිත්‍රපට, නාට්‍ය හා සාදයන් වැනි ස්ථානවල වැඩිපුර දක්නට ලැබෙන්නේ තරුණ පිරිස්ය. මේවා සම්පූර්ණයෙන් එපායි සඳහන් කිරීමක් මින් අදහස් නොකෙරේ. ප්‍රශ්නය පැන නඟින්නේ එම චිත්‍රපට, සංගීත හා නාට්‍ය ආදියට ඇති උනන්දුව ආගම හා දහමට නැත්තේ ඇයි ද යන්න සමඟයි.

සියලු ආගම් තුළින් මනුෂ්‍යයාගේ යහපත පිණිස කටයුතු කරයි. මෙය පොදු පිළිගැනීමකි. එසේ නම් ආගම තරුණ හදවත් වලින් ඈත්වන්නේ ඇයි? මෙම කුඩා පොතෙහි ආරම්භයේදීම සඳහන් කළා මෙන් තරුණ වයස හා ආගම යනු වෙනම පැවතිය යුතු දෙකක් නිසාද? මෙම ප්‍රශ්නයට පිළිතුරු බෞද්ධ දර්ශනය තුළින් ලබාගන්නා අයුරු මෙම ග්‍රන්ථය මගින් සාකච්ඡා කරමු.

අවුරුදු දෙදහස් පන්සිය ගණනාවකට පෙරත් මෙවැනිම ප්‍රශ්න තරුණ පිරිස් අතරින් ඉදිරිපත් වූ බවට සාක්ෂි බෞද්ධ ඉතිහාසයෙහි සඳහන්ව තිබේ. දීඝජානු කෝලිය නම් ධනවත් තරුණයා, බුදුරජුන් වෙතට පැමිණෙමින් මෙවැනි ප්‍රශ්නයක් ඉදිරිපත් කළේය. තමන් තරුණ වයසෙහි පසුවන විවාහ ජීවිතයට පත්ව මිල මුදල් පරිහරණය කරමින් හා සුවඳ විලවුන් පරිහරණය කරමින් හොඳට ඇඳ පැළඳ හැඩ බලමින් ජීවත්වන්නට කැමති අයෙකු බවයි. මෙවැනි ජීවිතයක් ගතකරන තරුණ වයසේ පසුවන තමන්ට බුදුරජුන් කියාදෙන මාර්ගය පිළිපදිමින් සතුටක්, ප්‍රීතියක් හා වින්දනයක් ලැබිය හැකිද යනුවෙන් මේ තරුණයා ප්‍රශ්න කළේය. බුදුරජුන්ගේ පිළිතුර වූයේ "පුළුවනි" යන්නයි. වර්තමානය එදාට වඩා සිත් ඇදගන්නා වට පිටාවකින් සංකීර්ණ වී ඇති බව සත්‍යයකි. එහෙත් දීඝජානු කෝලිය

තරුණයාගේ ප්‍රශ්නයෙන් ද්වනිත වන්නේ අද කාලයේ තරුණයෙකුගේ සිතක හා බලාපොරොත්තුවක රිද්මය නොවේද? බුදුරජුන්ගේ පිළිතුර අනුව තරුණ ජීවිතයකට සතුට ලබමින් “නිරාමිෂ” ප්‍රීතියක් ද ලබන්නට පුළුවනි.

එහෙත් වරදවා තේරුම් ගන්නට එපා. “තරුණ වයසට ඔහොම තමයි” පවසමින් සිතට අයාලේ යන්නට ඉඩ ඇරලා හැඟීම් වලට වහල් වෙලා ලබන සතුටක් නම් නොවෙයි මේ පවසන්නේ තරුණ සිතේ සතුට යනුවෙන් වටිනා මිනිස් ජීවිතයක් ලබපු බව අමතක නොකොට, බුදුදහම මගින් පෙන්වාදුන් සදාචාරාත්මක මගක් ඔස්සේ ලබන තරුණ සිතේ සතුටයි. ඒ තරුණ සිතට බෞද්ධ දර්ශනය පවසන්නේ අධ්‍යාපනයේදී මෙන්ම රැකියා ව්‍යාපාර වලදීත් උට්ඨාන වීර්යයෙන් හා මනා සිහිනුවණිනුත්, සංයමයෙනුත්, කම්මැලිනොවී ධාර්මිකව ක්‍රියා කළොත් තරුණ සිතේ සතුට එතන බවයි. (ධම්ම පදය) මෙලොව සියලු දෙනා සොයා ගෙන යන්නේ මානසික සන්තෘෂ්ඨියයි. තරුණ වයසේදී මේ බව හොඳින් දැනේ. “මම කැමති මෙහෙම කරන්න”. “මම කැමති මේ වගේ කෙනෙක් වෙන්න”. “මම ඒකට කැමති නැහැ”. “මම මේ ඔක්කෝම දේවල් කරන්නේ මගේ හිතේ සතුටට”. මේ වගේ වදන් කොච්චර නම් තරුණ දරුවෝ කියනවාද? තරුණ කාලයේදී ශාරීරිකවත් මානසිකවත් මහත් ශක්තියක් තිබෙන කාලය නිසා, අධ්‍යාපනය වෙනුවෙන් නිවැරදිව ධනයක් සොයා ගැනීම පිණිසත් උත්සාහයෙන් කටයුතු කිරීම බෞද්ධ දර්ශනය අගය කරයි.

තරුණ වයසේදී ඒ මග නොගියවූ අයට ජීවිතයේ පසුකාලයකදී අපමණ පීඩා පැමිණේවි. සමහර දෙමවුපියෝ දරුවනට මෙහෙම කියනවා ඔබ අහලා ඇත. “තරුණ කාලේ නට නටා හිටියොත් පස්සට අඬන්න වේවි. ඔය තරුණකම හැමදාම තිබෙන්නේ නැහැ”. බුදුදහම දෙවනුව පෙන්වා දෙන්නේ උත්සාහයෙන් උපයාගත් දේ හොඳින් ආරක්ෂා කරගත යුතු බවයි. තුන්වෙනුව, යහපත් වූ ආශ්‍රයක් අවශ්‍යයි. තරුණ වයසේදී බොහෝ දෙනාගේ ලෝකය හැදෙන්නේ යහළුවන් සමඟයි. නරක ආශ්‍රයකට වැටුනොත් ජීවිත බලාගෙන සිටිද්දි විනාශවෙලා යාවි. හොඳ ආශ්‍රයක් තිබුණොත් එය ජීවිතයේ දියුණුව පිණිස මහත් සේ බලපාවි. සමහර තරුණ දරුවන්ට සිරිත් විරිත් පෙන්නේ යල් පැනපු පරණ කාලයේ දේවල් ලෙසය. නමුත් ඒ සිරිත් විරිත් තුළ ජීවිතයට ප්‍රබෝධයක් ඇති කිරීමේ ශක්තියක් තිබේ. හතර වෙනුව, බුදුදහම පෙන්වා දෙන්නේ ආදායම මැනවින් දැන එයට ගැළපෙන අයුරින් වියදම් කරන්නටයි. සෙලියුලර් ෆෝන්, වාහන, ඇඳුම් පැළඳුම් හා ගමන් බිමන් පවා. මේ සියල්ල කළ යුත්තේ තමන්ගේ ආදායමට ගැළපෙන තරමටයි. එහෙම නැතිවුනාම තමන් ණය කාරයෙක් වෙන්නට පුළුවනි.

දෙමාපියන්ගේ ධනය හා මිළ මුදල් වුවත් අනිසි ලෙස පාවිච්චි කිරීම හොඳ දෙයක් නොවෙයි. ධනය පරිහරණය කිරීම පිළිබඳව බුදුදහම වටිනා උපදේශයක් දෙයි. උපයන ධනය කොටස් හතරකට බෙදා එක් කොටසක් ආහාර, ඇඳුම් පැළඳුම් හා බෙහෙත් වැනි එදිනෙදා ජීවිතයේ කටයුතු සඳහා යොදා ගන්න. කොටස් දෙකක් නැවත ආදායමක් ලැබෙන හෝ ප්‍රයෝජනවත් යමකට යොදවන්න. සතරවෙනි කොටස, හදිසි උවමනාවකදී ගැනීම පිණිස තැන්පත් කොට තබන්න. වර්තමානයේ ලැබෙන මාසික ආදායම එදිනෙදා වියදමටත් ප්‍රමාණවත් නොවේ ය ඔබ සිතන්නට පුළුවනි. එහෙත් වර්තමානයේ පවතින ඔවුන්නොවුන් පරදා යන්නට කරන තරඟකාරී බවින් අත්මිදී “තමන්ගේ තරම දැන” කටයුතු කිරීමෙන් වියදම තරමකින් හෝ පාලනය කරගත හැකියි. තරුණ වයස හා එහි ඇවතුම් පැවතුම් කිසි විටෙකවත් “නාස්තිකාර දරුවෝ” නම් වූ නාමයට ඇතුළත් වෙන්නට ඉඩ තබන්න එපා.

ඔබට මතකද මම ඉදිරිපත් කරපු ප්‍රශ්නය ඒ දීඝජානු කෝලිය ධනවත් තරුණයා, බුදුරජුන්ගේ ඇසූ ප්‍රශ්නයයි. එම ප්‍රශ්නය වෙනත් වචනවලින් සඳහන් කළොත් ඒ මෙහෙමයි. තරුණ වයසත් සමඟම ආගම දහම අනුග මනය කරන්නට පුළුවන්ද කියායි. තමන්ගේ ජීවිතය සතුටෙන් ගත කරන්න අවශ්‍ය නිවැරදිව මිළ මුදල් ලබන අයුරුත් යහළු හිත මිතුරු ආශ්‍රය පිළිබඳවත්, ධනය වියපැහැදම් කරනා අයුරුත් පෙන්වන බෞද්ධ දර්ශනය, හිත හදනා දර්ශනයකුත් පෙන්නුම් කරයි.

මෙහි පළමු කරුණ නම් පිරිසිදු හිතක් ඇතිකර ගැනීම (සද්ධා සම්පදා). පිරිසිදු හිතක “කහට” නැහැ. අනුන්ට උදවු උපකාරී වීමට කැමතියි. කාරුණිකයි. තමා ගැන

පමණක්ම නොව අනුන්ගේ දුක වේදනාවන් හඳුනාගන්න පුළුවන් අයෙකුයි. දෙවනුව "හැදිච්චකම" තිබෙන්නට ඕනෑ (සීල සම්පදා). සීලය යනු තරුණකම හා නොග ැළපෙන වචනයක් නොවෙයි. සමහර තරුණ දරුවන් සිතන්නේ සීලය යනු හිත කළ කිරවලා මෙලොව ජීවිතය එපා කරවන යමක් කියලයි. සීලයෙන් කරන්නේ ජීවිතය කළකරවීමක් නොවෙයි. සීලය යනු හැදිච්චකම තුළින් ජීවිතය ප්‍රසන්න හා ප්‍රබෝධමත් කිරීමකුයි. සීලය නොමැති වුනාම සමහරු මෙහෙම කියනවා ඔබ අසා ඇත. "ඔය කතා කරන්නවත් දන්නේ නැහැ" "ඔයා කළේ එපා කරවපු වැඩක්" "එයා හැසිරෙන්නෙ මනුස්සයෙක් විදියට නම් නොවෙයි." මේ වගේ හැසිරීම් හා කතාව නිසා ඔවුනොවුන්ට එපා වෙයි. හැඩට රුවට කොපමණ අඳුම් ඇන්දත්, දහස් ගණන් වටිනා මාල, වළලු මුදු හා ඔරලෝසු පැළඳුවත් හැදිච්චකම හෙවත් සීලය නොමැති නම් කවුරුත් ඔබ දෙස පිළිකුලෙන් හා අමනාපයෙන් බලාවි. එහෙම වුනත් හැඳුනුම්කම තිබෙනකොට, එහි ප්‍රසන්න බවත් ඔවුනොවුන්ට තිබෙනකොට, එහි ප්‍රසන්න බවත් ඔවුනොවුන්ට සමීප බවකුත් දැනේවි.

තුන්වෙනුව පරිත්‍යාගශීලි හිතක් ඇතිකර ගැනීම අවශ්‍යයි. මුලින් කරුණාව හා මෛත්‍රිය ලෙන්ගතුකම බෙදාහදා ගන්න. මින් අනතුරුව ඇති හැටියෙන් අනුන්ට පිහිටවන කෙනෙක් වෙන්න. මින් අනතුරුව ඇති හැටියෙන් අනුන්ට පිහිටවන කෙනෙක් වෙන්න. නිවසේදී ඔවුනොවුන්ට උදවු කරන්න. නිවසේදී කළ යුතු වැඩකදී "ඕක මට අයිති වැඩක් නොවෙයි" පවසමින් මගහරින්නට උත්සාහ ගැනීම ක්‍රියාශීලී තරුණයකුගේ තරුණ දුවකගේ පුරුද්දක් නොවෙයි. නිවසින් බැහැරව නමුත් පිහිටවිය යුතු අවස්ථාවෙහි ඕනෑම අයෙකුට පිහිටවීමට තරම් නම්‍යශීලීවීම මිනිස්කමේ ලක්ෂණයක් විය යුතුයි. යම්විටෙක මේ පිහිටවීම මහළු වම් කෙනෙකුට බස් රථයේදී නැගිට ආසනය දීම වෙන්නට පුළුවනි. එවැනි වෙලාවක ඒ අයගෙන් ලැබෙන කාරුණික සිනහව ඔබට කොපමණ අගනේදැයි සිතන්න. එහෙම නැති වුනත් මම උදවුවක් කළායි සිතිවිල්ල ඔබට ප්‍රීතියක් වේවි. ඔබට තවත් කෙනෙකුට ඇහුම්කම් දෙන්න තරම් කාරුණික හා පරිත්‍යාගශීලි වෙන්නට පුළුවනිද? මේ ලෝකයේ හැම කෙනෙකුටම තවත් කෙනෙකුට කියන්න කතාවක් තිබේ.

එනමුත් සමහරුන්ට විශ්වාසයෙන් අහගෙන ඉන්න සමීප කෙනෙකේ සොයා ගැනීම පහසු නැහැ. ඔබට නිවස තුළ ඇහුම්කම් දෙන්නෙක් වීමට පුළුවනි. ඒ ඔබේ දෙමව්පියන්ට, සහෝදර සහෝදරියන්ට, ස්වාමියාට හෝ බිරිඳට වෙන්න පුළුවනි. සමාජයේදී යටහපත් යහළුවෙක් හා යෙහෙළියෙක් වීමට පුළුවනිද? සමහර තරුණ දරුවෝ තමන්ගේ හද රිදවන වේදනාකාරී සිතුවිලි යහළුවෙකුට හෝ යෙහෙළියකට කියා දීර්ඝ හුස්මක් පිට කරමින් "ඔළුව" නිදහස් කරගන්නා අයුරු ඔබ දැකලා ඇත. ඊළඟට මෙහෙම කියාවි. "අනේ ඔබට බොහොම ස්තූතිය. බොහොම පිං." මේ වගේ සිදුවීම් දකිනකොට, ඇහෙනකොට, එහි මනුස්සකම කොපමණ අගේට රැඳිලා තියෙනවද කියා ඔබට සිතෙන්නේ නැද්ද? හතර වෙනුව සඳහන් කළේ නුවණ ඇතිව ක්‍රියා කිරීමයි.

නුවණ හා ප්‍රඥාව ආදී වචනවලින් බෞද්ධ දර්ශනය ගැඹුරු අදහසක් ඉදිරිපත් කරයි. ඇස, කණ, නාසය, දිව හා ශරීරය නම් වූ පඤ්ච ඉන්ද්‍රියන් ඔස්සේ ලෝකය හා සම්බන්ධ වන විට සිතින් ගන්නා හැම අරමුණක්ම එහ අරමුණෙහි ගැබ්ව ඇති හැබෑ ස්වභාවය ද හඳුනාගෙන කටයුතු කිරීමයි. මේ ලෝකයේ කිසිවක් ස්ථිර නැහැ. සියලු දෙයම වෙනස්වෙයි. පණ ඇති පණ නැති හැම දෙයක්ම එයට අඩංගුයි. මේ බව අවබෝධයෙන් කටයුතු කළාම ඒවා වෙනස් වෙලා නැතිව යන විට නොහඬා, නොතැවී සිටින්නට ඔබට පුළුවන්කම ලැබේවි. වෙනස්වීම හා මෙලොව හැම වස්තුවක්ම අනිත්‍ය බව අමතක කරන්නට උත්සාහ කළොත් ඒවා වෙනස්වන හැම විටම හඬාවි. දුක්වේවි. ලෝක ස්වභාවය වෙනස්කරන්නට අපට බැරිවේවි. අඳුර පිළිගෙන පහනක් දල්වනවා මෙන් අනිත්‍ය පිළිගෙන සිතේ සතුටින් ජීවිත ගමන යාම හොඳයි.

**ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේගේ**


තාරුණ්‍යය සහ බුදුදහම පොතෙන් උපුටා ගන්නා ලදි.

# සිත

සිත යනු කුමක්ද? එය කොතැනක පිහිටා ඇත්ද? එය ශරීරයේ යම් තැනක පිහිටා ඇත්නම් ඒ කොතැනකද?

අනාදිමත් කාලයක් තිස්සේ මිනිසා මේ ප්‍රශ්න වලට පිළිතුරු සෙවීය. මේ නිසාම නොයෙකුත් දර්ශන, වාද, විවාද සහ ආගම් ලොව පහළ විය. ශත වර්ෂ විසි පහකට පෙර සිටම පෙරදිග විසූ දාර්ශනිකයෝ මේ සම්බන්ධව නොයෙකුත් අදහස් ඉදිරිපත් කලහ. එකල දැනුමෙන් ඉදිරියෙන් සිටි දඹදිව විසූ දාර්ශනිකයන් විසින් මේ සම්බන්ධව තමන්ගේ දර්ශන ලොවට ඉදිරිපත් කළහ. සිත පිරිසිදු කර ගැනීමම මෝක්ෂය හෙවත් සැනසීම ළඟා කර ගැනීමේ මාර්ගයක් වශයෙන් එකල සිටි වියතුන් විශ්වාස කළහ. මෙම සැනසිලි දායක තත්ත්වය හැඳින්වීම සඳහා ඔවුහු 'නිර්වාන' යන පදය යෙදූහ. 'පුරුත්පත්තිය' නොහොත් නැවත ඉපදීම මත ගොනැගුණු දර්ශන බොහොමයක්ම සිත එකඟ කර ගැනීමේ පිළිවෙත් මගින් (සිත ධ්‍යාන ගත කිරීම) නොයෙකුත් විශ්මිත දේ කිරීමේ හැකියාවන් ලබා ගත් අය වූහ. (අහසින් යාම, නොපෙනී සිටීමේ හැකියාව, අන් අයගේ සිත් කියවීමේ හැකියාව වැනි) මොවුන් විසින් මිනිස් සිතේ ශක්තිය තමන්ට උවමනා ආකාරයට හැසිරවීමේ ශක්තිය ලබාගත්තෝ ද වූහ. මේයින් මතු භවය යහපත් කර ගැනීම ඔවුන්ගේ අරමුණ විය. මිනිස් සිත අති මහත් ශක්තියකින් සමන්විත බව ඔවුන් එවකටත් තේරුම් ගෙන සිටියාහ. සිතක ඇති ශක්තිය හා බලය නවීන විද්‍යාවට පවා අදහත් ප්‍රහේලිකාවක්ව තිබේ.

ලෝකයේ ඇති වුන සමහර ආගම් 'සිත දියුණු' කිරීමක් ගැන හෝ 'සිත පිරිසිදු' කිරීමක් ගැන සඳහන් කොට ඇත. මේ බෞද්ධ දර්ශනයේ ඉගැන්වෙන ශීල සමාධි යන ශික්ෂා වලට බොහෝ දුරට සමාන ඉගැන්වීමක් වෙයි. ශීල සමාධියෙන් පමණක් ඇති කර ගනු ලබන මේ දැවුණ සිත වෙනත් නිමිත්තක ගැටීම නිසා බිඳ වැටේ. මේ නිසාම මේ තාවකාලික තත්ත්වයකි.



එවකට දඹදිව කිඹුල්වත් නුවර විසූ සුද්දෝධන රජු ගේ පුත් සිද්ධාර්ථ ගෞතම ගිහිගෙය අත්හැර ගොස් තවුස්දම් රකිමින් මිනිස් ජීවිතවල නොනවත්වා අත්විදින්නට ලැබෙන්නා වූ දුක්, පීඩන ස්ථිර වශයෙන්ම නැති කරගන්නේ කෙසේ ද යන ප්‍රශ්නයට පිළිතුරු සොයන්නේ මේ දාර්ශනිකයින් අනුගමනය කරමින් සිත පිරිසිදු කිරීමේ ව්‍යායාමයන්හි යෙදුනාහ. ආත්මය පිරිසිදු කිරීමේ ව්‍යායාමයන්ගෙන් සිත යම් තරමකට පිරිසිදු කරගැනීමෙන් ලබා ගත හැකි උපරිම ශුද්ධා භාවය වූ බ්‍රහ්ම තත්ත්වය පවා නැවත අරමුණු හා ස්පර්ශ වීම නිසා කිළිටි වන බවද උන්වහන්සේ වටහා ගත් සේක. මිනිස් ජීවිතවල දුක හෝ සැප සඳහා සිත මූලික වන බව තේරුම් ගත් උන්වහන්සේ සිත පිළිබඳව තම දර්ශනය ලොවට ඉදිරිපත් කළ සේක.

සිත හේතූන් සමූහයක් නිසා හට ගන්නා බවත් ඒ හේතූන් නැති වූ විට හිත/සිත නැති වී යන බවත්

උන්වහන්සේ ලොවට ඉදිරිපත් කළ මූලික දර්ශනයයි. මෙසේ බලන කළ, ශරීරය තුළ සිතෙහි පැවැත්ම සඳහා නිශ්චිත තැනක් නොමැති අතර සිත, හේතු සමූහයක උපකාරයෙන් හටගෙන ඒ හේතු නැතිවෙන විට නැති වන්නා වූ ධර්මතාවකි. මෙසේ සිත කෘත්‍ය ස්වරූපයක් පමණක් වන අතර සිත ඉන්ද්‍රියයක් හෝ ශරීරයේ නිතනව පවතින ශරීර උපාංගයක් නොවේ. සිතේ ලක්‍ෂණය නම් නිරන්තරයෙන් ක්‍රියා කරන ස්වරූපයයි. යමෙක් නිදන අවස්ථාවේ පවා සිත නොනවත්වා වැඩ කරයි. අවදියෙන් සිටින, නිදන යන මේ අවස්ථා දෙක හැඳිනීම සඳහා සිත "ප්‍රවෘත්ති" හා "භවංග" වශයෙන් වෙන්කර හඳුන්වා දී ඇත. භවංග සිත නිරතුරුවම ක්‍රියා කරමින් පවතින අතර ප්‍රවෘත්ති සිත (යමෙක් අවදිව සිටින කළ) දැනීමක් සහිතව ක්‍රියා කරයි. සිතෙක දක්නට ලැබෙන්නා වූ ලක්‍ෂණ ලෙස උන්වහන්සේ පහත දක්වා ඇති කරුණු ඉදිරිපත් කළ සේක. ඵස්ස, වේදනා, සංඥා, මනසිකාර, චේතනා, ඒකග්ගතා, ජීවිතේනද්‍රිය වශයෙන්. මෙසේ සිත පහළ වීම සඳහා ජීව ශක්තිය අවශ්‍ය සාධකයක් වන නිසා උන්වහන්සේගේ දර්ශනය සජීවී වස්තූන් සඳහාම පමණක් බලපානු ලබයි.

සෑම විටකම වරකට එක සිතක් පහළ වන නමුත් සිත ආශ්‍රිතව හටග්නා සිතිවිලි සමුදාය නිසා සිත සංකීර්ණ බවක් පෙන්වයි. සිතක්, සිතිවිල්ලක් සම්පූර්ණ කිරීම සඳහා චිත්තක්‍ෂණ දාහතකින් සමන්විත සිත් පරම්පරාවක් නොහොත් චිත්ත වීථියක් පසු කළ යුතුව ඇත. (භවංග, භවංග චලන, භවංග උප්පච්ඡේද, පංචද්වාර වජ්ජන, චක්ඛුවිඤ්ඤාණ, සම්පටිච්ඡන, සංතීරණ, වොත්තපන වශයෙන් හඳුන්වනු ලබන මේ මුදල් චිත්තක්‍ෂණ අට මගින් සිතිවිල්ලක මූලික සංවිධානය සිදු කරන අතර ඉන් පසු එළඹෙන චිත්තක්‍ෂණ හත මගින් ඒ සිතිවිල්ල තීව්‍ර නැතහොත් ශක්තිමත් කරනු ලබයි. මේ චිත්තක්‍ෂණ සත ජවන් සිත් වශයෙන් හඳුන්වයි. අවසාන වශයෙන් තදාලම්බන චිත්තක්‍ෂණ දෙකකින් එම චිත්ත වීථිය අවසන් වෙයි. නැවතත් තවත් සිතිවිල්ලක් භවාංග, චිත්තක්‍ෂණයෙකින්ම ඇරඹෙයි.) මේ චිත්ත වීථි ක්‍රියාවලිය සිදුවීම සඳහා ගතවන්නේ සිතාගත නොහැකි තරමේ සුළු කාල පරාසයක් නිසි යමෙකු දකින්නේ චිත්ත වීථිය අවසානයේ ඉදිරිපත් වන සිතිවිල්ල (අදහසක්) පමණක් වන අතර, කිසිම චිත්තක්‍ෂණයක කෘත්‍ය ස්වරූපය වෙන්කර දැනගත නොහැක. නමුත් ඒ ඒචිත්තක්‍ෂණය ඒ ඒ චිත්තක්‍ෂණයට අයත් කෘතිය ඉටකරනු බවයි. (මෙම ක්‍රියාදාමය ඉබේ සිදුවන්නක් විනා එය කරන කෙනෙක් නොමැත. මේ සක්කායේ ස්වරූපයයි. සක්කාය හෙවත් ස්වකීය ක්‍රියාව වශයෙන් හඳුන්වා ඇත්තේත් මෙයයි) නමුත් අවසානයේ දී ඉදිරිපත්වන සිතිවිල්ල තමා විසින් ගොනු කරන ලද්දක් බව සත්වයා විශ්වාස කරයි. මේ අවිද්‍යාව (ඇත්ත නොදැනීම) නිසා ඇතිවී තිබෙන විශ්වාසයෙකි.

සමහරු සිත හා මනස එකක් වශයෙන් සළකත්. නමුත් බුදුන් වහන්සේ තම දේශනාවන්හීදි පැහැදිලිවම මේ සඳහා **"චිත්ත"** හා **"මන"** වශයෙන් වචන දෙකක් යෙදු සේක.

චිත්ත යනුවෙන් හේතූන් ගොනු වූ කල පහල වෙන ධර්මතාවයකුත්, මනස, ඇස, කණ, නාසය වැනි ඉන්ද්‍රියක් වශයෙනුත් උන්වහන්සේ දේශනා කළ සේක. මනස මොළය තුළ පවත්නා යම් කොටසක් මගින් ඉටුකරන කෘත්‍ය ස්වරූපයකි. සිතක් පහළ වීමට ශරීරයේ ඉන්ද්‍රියයන් අරමුණු හෙවත් නිමිති සමඟ ස්පර්ෂ වීම අවශ්‍ය වෙයි. අරමුණ බාහිර හෝ අභ්‍යන්තර විය හැක. බාහිර අරමුණු වශයෙන් ජීවී, අජීවී, සචේතනික හෝ අචේතනික දේ අදහස් වේ. අභ්‍යන්තර අරමුණු මනසේ සටහන් වූ සංඥා මගින් හෝ කල්පිත වශයෙන් ඉදිරිපත් කරනු ලබයි. ඇස, කණ, නාසය වැනි ඉන්ද්‍රියය ස්පර්ශයෙන් ලැබෙන්නා වූ අරමුණු සංඥා ලෙස සටහන් කර ගැනීමද මෙම සංඥා නැවත මතුකර දීම ද මනසේ කෘත්‍යකි. මෙය අප මතකය වශයෙන් හඳුන්වමු. (අපරදිග දාර්ශනිකයින් 'සිත' ද මොළයේ කෘත්‍යයක් වශයෙන් ගත්හ. මොලයේ ක්‍රියාකාරීත්වය විවිධ වන අතර ඉතාමත්ම සංකීර්ණ වේ. මේ නිසා බොහෝ විට මොලයේ ක්‍රියාකාරීත්වය හමුවේ නවීන විද්‍යාව පවා අසරණ වී ඇත. සිත පිළිබඳව අපරදිගින් මතු වූ පැරණිම සඳහන හෝමර් නැමති කවියාගේ 'odyssey' සහ 'illiad' යන පැණි වෘතාන්ත වල කෙරුණු සටහන් වශයෙන් සැලකිය හැක.)

නවීන විද්‍යාත්මක පර්යේෂණ වලට අනුව මොලයේ ක්‍රියාකාරීත්වය දෙආකාරව සිදුවෙයි. සංවේදී නැතහොත් උද්වේගකර (emotional) වශයෙන් සහ තාර්කික (logical) වශයෙනි.උද්වේගකර සිත් බොහෝ විට තාර්කික සිත් මඩිමින් ඉදිරිපත්ව සත්ත්වයා ක්‍රියාවට යොමු කරවයි. උද්වේග පාලනය කිරීම සිත නිවීමේ මගයි. මේ පාලන ක්‍රියාව පුරුදු කිරීම මගින් කළ හැකි

අතර මේ මගින් අරමුණ ස්පර්ශ වීම නිසා සිත උද්වේග කර වීම වලකී. මේ නිවුන සිතක ලක්ෂණයයි.

සිතක් අවසන් වී තව සිතක් පටන් ගැනීමේදී එය අවසන් වූ සිතට සම්බන්ධවම පහළ වෙයි. අවසන් වූ සිතේ උපාංග යක් ලෙස මේ සිත ඉදිරියට යයි. ඉහතින් සඳහන් කළ පරිදි සිතිවිල්ලක් ඉදිරිපත් වෙන්නේ සිත් පරම්පරාවක උපකාරයෙනි. සෑම ශරීරික ක්‍රියාවක්ම (කායික, වාචික, මානසික) සිතෙහි මෙහෙය වීමෙන් සිදුවේ. මෙයට අමතරව ශරීරය තුළ දහසකුත් එකක් ක්‍රියා ප්‍රවෘත්ති සිතෙහි අනුදැනුමෙන් තොරව සිදුවේ. රුධිර සංසරණය, හෘද ක්‍රියාකාරිත්වය, ඇසිපිය ගැසීම, හුස්ම ඉහළ පහළ හෙලීම (ආශ්වාස ප්‍රශ්වාස) මේ ගණනයට අයත් වෙයි. සිත මගින් කෙරෙන මේ අභ්‍යන්තර කෘත්‍යන් අපට නොපෙනේ. මේ කෘත්‍යන් සඳහා ස්වයංක්‍රීය ස්නායු පද්ධතිය (autonomic nervous system) උපකාරීවේ. ශරීරයේ සෑම කොටසක්ම ස්නායු පද්ධතියේ ඇති ස්නායු මගින් මොලයට සම්බන්ධ වී ඇත.

සිතක් පහළවීමට පංචස්කන්ධ ක්‍රියාවලිය මුල්වෙයි. රූප, වේදනා, සංඥා, සංඛාර, විඥාණ යන මේ පංචස්කන්ධ කෘත්‍ය පහ හේතුකොට ගෙන සිතක් පහළ වෙයි. ජීවිතයක් ඉදිරියට පවත්වාගෙන යාමේ බලය මේ පංචස්කන්ධ ක්‍රියාවලියට ඇති ඇල්ම (පංචඋපාදානාස්කන්ධය) හේතුකොට ගෙන පවතී. ඉදිරියට ගල යන්නා වූ මේ සිත් ප්‍රවාහය නිසාම කෙනෙක් තමා ජීවත් වනවා යන නිගමනයට බැස ගනියි.

ධ්‍යාන තත්ත්වය මගින් කෙරෙන්නේ සිත එක අරමුණක තබා ගැනීමයි. නමුත් යම් විටෙක ඔහු ධ්‍යානයෙන් මිදුනේ වෙද, අරමුණු ස්පර්ශ වීම නිසා නැවත සිත් පහළ වීමේ ක්‍රියාවලිය පටන් ගැනේ.

සිතීමේ කාත්‍ය මනස මගින් සිදු කළත් සිතීමෙන් මතුවන සිතිවිල්ලේ ස්වරූපය සිත මගින් ඉදිරිපත් කරනු ලබයි. අරමුණු ස්පර්ශ වීම නිසා වින්දන (වේදනා) ස්වරූපයක් (කායික හෝ මානසික) ඇතිවෙයි. වින්දනය හේතුකොට ගෙන (ප්‍රත්‍ය වීම මත) මනස සිතීමේ ක්‍රියාවලිය අරඹයි. මෙම වින්දන ස්වරූප හොඳ හෝ නරක විය හැක. කටුක හෝ සෞම්‍ය විය හැක. නැතහොත් උපේක්ඛා (සැප හෝ දුකින් තොර) විය හැක. වින්දනය, මනස මගින් මොළයේ උපකාරයෙන් සිදුකරන්නා වූ කෘත්‍යයක් බැවින් ස්නායු පද්ධතියේ ක්‍රියාකාරීත්වය මේ සඳහා ඉවහල්වේ. මේ නිසා බාහිර දෙයක උපකාරයෙන්, (රසායන ආධාරයෙන් කරන නිර්වින්දනය ANESTHEISA මගින්) අපට "වින්දනය මගින් ඇති කරනු ලබන දැනීම" තාවකාලිකව නැති කරලිය හැකි වේ.

ඉන්ද්‍රියන් අරමුණක් සමඟ ස්පර්ශ වීම නිසා හටගන්නා වින්දන ස්වරූපයේ යම් හඳුනාගැනීමක් සිදුවෙයි. මෙම හඳුනා ගැනීම විඥ්ඥාණ වීම වශයෙන් දක්වා ඇත. මනස ද ඇතුලත්ව ඉන්ද්‍රිය සය මගින් ලබා ගන්නා වූ ආරම්මන (අරමුණ) නිසා චක්ඛු විඥ්ඥාණ, සෝත විඥ්ඥාණ, ඝාණ විඥ්ඥාණ, ජිව්හා විඥ්ඥාණ, කාය විඥ්ඥාණ සහ මනෝ විඥ්ඥාණ වශයෙන් සය ආකාර විඥ්ඥාණයන් ගේ හටගැනීම සිදුවේ.

බෞද්ධ දර්ශනයේ ඉගැන්වෙන අන්දමට සත්ත්වයා යනු ශරීර කූඩුවක් තුළ ගොනු වූ ශක්ති පොදියකි. ශරීරය යනු මේ ශක්තීන් මගින් මෙහෙය වන්නා වූ කෘත්‍ය සමූහයකින් සකස් වූවකි. මේ පැහැදිලි කිරීම බෞද්ධ දර්ශනයෙන්ම පමණක් ඉදිරිපත් කෙරෙයි. දැනට සාමාන්‍ය වහරේ ඇති අර්ථ දැක්වීමට අනුව වේදනා යනු ඉන්ද්‍රියක් මගින් කෙරෙන්නා වූ ස්පර්ෂ වීමයි. නමුත් පරමාර්ථ වශයෙන් ගත් කළ ස්පර්ෂ වීමෙන් ඔබ්බට ගිය සම්පූර්ණ අවබෝධ කිරීමක් 'රූප' (රුප්පනය) යන්නෙන් අදහස් කෙරෙයි. අරමුණක ස්පර්ශය 'රූපය' වශයෙන් නොව 'රූපස්කන්ධය' වශයෙන් හඳුන්වා ඇත්තේ මේ ස්පර්ශය, අරමුණෙහි සෑම පැතිකඩක්ම ආවරණය කිරීම නිසයි. පංචස්කන්ධ කෘත්‍ය විසින් ලබා දෙන්නා වූ වින්දන මගින් සැපයක් බලාපොරොත්තුවෙන් සත්ත්වයා සංචස්කන්ධ කෘත්‍ය කෙරේ ඇලීමක් (උපාදාන) ඇතිකර ගනී. මේ පංචඋපාදානස්කන්ධය නිසා සත්ත්වයාගේ පැවැත්ම සිදුවේ. මේ උපාදානයේ නිරෝධය පැවැත්මේ (භවයේ) නිරෝධය වේ.

(මේ ලිපිය සැකසීමේදී ධර්මධර පැවිදි උතුමන්ගේ දෙසුම් පාදක කරගත් බව පුණ්‍යානුමෝදනා පූර්වකව සඳහන් කරමි.)

**අනුර සේනාරත්න**

# ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර 139 වන ජන්ම සංවත්සර උපහාර උලෙළ - 2023 සහ නැණකිරණ අධ්‍යාපන තිළිණ පත් ප්‍රදානය - 2

සමස්ත ලදකා බෞද්ධ මහා සම්මේලනයේ ජාතික අධ්‍යාපන මන්ඩලය මගින් ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර ශ්‍රීමතාණන් ගේ 139 වන ජන්ම සංවත්සර සැමරුම සහ නැණකිරණ අධ්‍යාපන තිළිණ පත් ප්‍රදානය 2023 ඔක්තෝබර් 16 දින ගරු අධ්‍යාපන අමාත්‍ය නීතිඥ සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා ගේ ප්‍රදානත්වයෙන් බෞද්ධ මහා සම්මේලනයේ බී.එච්.විලියම් ශාලාවේදී පවත්වන ලදී.

කොළඹ නව කෝරළේ ප්‍රධාන අධිකරණ සංඝනායක සද්ධර්ම කීර්ති ශ්‍රී ත්‍රිපිටකාචාර්ය පූජ්‍ය දිවියාගහ යසස්සී නායක ස්වාමීන්වහන්සේ මුලසුන හෙබවූ අතර කන්නන්ගර මැතිතුමා පිළිබඳ ප්‍රධාන දේශනය බුද්ධ ශාසන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ හිටපු ලේකම් බන්දුල හරිස්චන්ද්‍ර මැතිතුමා විසින් සිදුකල අතර පාසල් ශිෂ්‍ය දේශන ප්‍රවර්ධන වැඩ සටහන යටතේ කොළඹ නාලන්දා විද්‍යාලයේ කෙවිරු ජිත්නුක සෙනෙවිරත්න ශිෂ්‍යයා සහ දේවී බාලිකා විද්‍යාලයේ මහේලී ජයනිමා ශිෂ්‍යාව විසින් පවත්වන ලදී.

තෝරා ගත් පාසල් 13 ක විදුහල්පති වරුන් විසින් තෝරා එවන ලද සිසුන් 130 ට නැණකිරණ අධ්‍යාපන තිළිණ පත් ප්‍රදානය කළ අතර කන්නන්ගර මැතිතුමා අධ්‍යාපනය ලැබූ ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලය සහ එතුමා ආරම්භ කරන ලද මතුගම සී.ඩබ්ලිව්.ඩබ්ලිව්.කන්නන්ගර විද්‍යාලය පුමුඛව කොළඹ අවට පාසල් වන ආනන්ද, නාලන්ද, විශාකා, දේවී බාලිකා, යසෝදරා, ආනන්ද බාලිකා, අසෝක, රත්නාවලී බාලිකා, ඩඩ්ලි.එස්. සේනානායක, ගොතමී බාලිකා සහ රාජගිරිය ජනාධිපති යන විද්‍යාලයන් ගෙන් තිළිණ පත් ලාභී සිසුන් තෝරා ගන්නා ලදි.

පරිත්‍යාගශීලීන් ගේ මුල්‍යාධාර යටතේ දෙවන වරටත් පවත්වන ලද මෙම වැඩ සටහන සමස්ත ලදකා බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍රා නිමල් වාකිෂ්ඨ මැතිතුමා ගේ උපදේශකත්වයෙන් හා ජාතික අධ්‍යාපන මණ්ඩලයේ ගරු සභාපති මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ මහතා ගේ මූලිකත්වයෙන් ජාතික අධ්‍යාපන මන්ඩලය සහ සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මගින් සංවිධානය කරන ලදී.









# ලෝකයේ දීර්ඝතම වන්දනා සමය සිරිපා වන්දනා සමයයි



උඳුවප් පොහොයෙන් පසු සිරිපා ගමන් ආරම්භ කෙරේ. රත්නපුර පැල්මඩුල්ල ශ්‍රී පාදස්ථාන විහාරස්ථානයේ තිබෙන සමන් දේව ප්‍රතිමාව රැගත් පෙරහැර සිරිපා මළුවේ පිහිටි දේව මන්දිරයේ තැන්පත් කිරීමෙන් අනතුරුව සිරිපා සමය පටන් ගනී. එම දේව ප්‍රතිමාව සුදු හඳුන් දැවමුවා සමන් දෙවිදුන්ගේ ප්‍රතිමාවකි. දඹදෙණි රාජ සමයේදී රජ කළ දෙවන පැරකුම්බාවන්ගේ ප්‍රධාන ඇමති දේව පතිරාජයන් විසින් පූජා කළ බව පූජාවලිය හා චූලවංශය ආදී වංශ කතා සඳහන් කරයි.

ශ්‍රී පාදස්ථානය භාර හිමිපාණන් වහන්සේලාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී පාද සුවඳ පැනින් දෝවනය කර එයට කෙරෙන පුද පූජා කිරීම ද සිදු කෙරේ. ශ්‍රී පාද පද්මය දෝවනයට පැන් රැගෙන එන්නේ භගවාලෙන (දීඝ ගුහාව) අසළ ඇති පොකුණෙනි. ශ්‍රී පාද පද්මය වෙනුවෙන් පුද පූජා අවසානයේදි සමන් දෙවිඳුන්ගේ ආසිරිවාදයෙන් පසු මහජනතාවට සිරිපා නැමදීමට අවස්ථාව හිමිවේ.

ශ්‍රී පාදස්ථානය සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළයේ උතුරු උඩු පත්තුවේ සීමා කර පිහිටයි. එය මුහුදු මට්ටමින් අඩි 7430 (මීටර් 2230) උසකින් පිහිටා ඇති සමනොළ කන්ද ලංකාවේ භූ විෂමතා අනුව සෙසු කඳු මුදුන් හා සසඳන විට පස්වැනි ස්ථානය හිමිකර ගනි. ඈත අතීතය දෙස බලන විට රුහුණු, මායා, පිහිටි ආදී ලෙස බෙදි තිබු සමයක සමන්ත කූටය (සමනොළ සිරිපා) රුහුණට අයත් විය. සත්වන සියවසයේ අග භාගයේදී ලක්දිවට පැමිණි වජ්‍රබෝධි හිමියන් සමනොළ කන්ද රුහුණට අයත් කඳු ගැටයක් බව චීන වාර්තාවල සඳහන් කර තිබේ.

සමනොළ කන්ද මුදුන කොණ්ඩ කැවුමක හැඩයක් ගන්නා බව වරක් රොබට් නෝක්ස් සඳහන් කර තිබුණේ මේ කඳු මුදුන කෝණාකාර හැඩයක් ගන්නා නිසයි. සමනොළ කඳුකරය කළු, කැලණි, වළවේ හා මහවැලි යන ගංගා ආරම්භ වන ජල පෝෂිත කඳුකරයක් බව සඳහන් කෙරේ. මැයි, ජූනි, ජූලි මාසවල සමනොළ අඩවියට ලැබෙන වර්ෂා පතනය මිලි මීටර් 5000 ක් පමණ වෙයි. එය අඟල් 200 ක් පමණ ඉක්මවා යයි. මේ නිසා වන්දනා ගමන් වලට බාධාවන් ඇති වන හෙයින් සිරිපා වැඳීම නතර කෙරේ. දෙසැම්බර්, ජනවාරි, පෙබරවාරි, මාර්තු, අප්‍රේල් දක්වා සිරිපා සමය වෙයි. හිරු පායන සමයකි.

සමනොළ සිරිපා කන්ද සොබා සෞන්දර්ය යුතු ප්‍රදේශයකි. ඒ සුන්දරත්වය, මනස්කාන්ත දර්ශන වලින් පිරි ඇත.

පොත් පත් රැසක්ම මෙහි වර්ණ මහිමය විස්තර කළත් සමනොළ කන්දේ දකින්නට ලැබෙන සොබා සුන්දරත්වය අගය වනමින් ලියැවුණු සිංහල සංදේශ කාව්‍ය අතර තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් සැළලිහිණි සංදේශයේ දී සමනොළ පිළිබඳ වර්ණාව විශේෂ වෙයි.

සුර රද සමන් සමඟින් සුරඟන ඒවර
පැහැනද මදාරා පරසතු මල් පතර
කර පුද වදින රැඳි මුණි සිරිපා තඹර
සකිසඳ පෙනේ සමනොළ ගල නැගෙන හිර

(සැළ - 25 වන පද්‍යය)

සම්බුදු පියාණන් වහන්සේ තෙවරක් ලක්දිවට වැඩම කළ බව දීපවංශය, මහාවංශය, හා සමන්ත පාසාදිකාව, විනය අට්ඨ කතාව, ආදී මූලාශ්‍ර ග්‍රන්ථවල සඳහන් වෙයි. ප්‍රථම වරට බුදුපියාණන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කරන ලද්දේ මහියංගණ (බිංතැන්න ප්‍රදේශයේ) භූමියේ යක්ෂ දෙපිරිසක් සමඟ ඇති වූ යක්ෂ කෝට්ඨාසයේ අරගලය දමනය පිණිසය. මහවැලි නදිය අසබඩ පිහිටි මහානාග වනෝද්‍යානයේදී පැවැති යක්ෂ අරගලයට සහභාගී වූයේ අහසේ එලක් බැඳගෙනය. එහි සිට බිමට සම්ප්‍රාප්ත වී ඒ යක්ෂ දෙපිරිසට දහම් දෙසූහ. ඔවුන් දෙසූ දහම් අසා සුමනකූට වාසී සුමණ දෙව් රජු සෝවහන් ඵලයට පත් වූ බවත් මහාවංශය සඳහන් කරයි.

ඒ අවස්ථාවේ සර්වඥයන් වහන්සේගෙන් වැඳම් පිදුම් කිරීමට යමක් ඉල්ලා සිටි සුමණ දිව්‍යරාජයාට උන්වහන්සේ තම සිරස පිරිමැද කේෂ ධාතූන් ස්වල්පයක් ප්‍රදානය කළ බවත්, එය පිළිගත් සුමණ දිව්‍යරාජයා බුදුහිමියන් වැඩ සිටි ස්ථානය මැදි කොට මහියංගන ස්ථූපය සත්රියන් උසට කරවා මැණික් කරඬුවක කේෂ ධාතු තැනපත් කර එම කරඬුව සත් රියන් උසට කරවූ චෛත්‍යයේ තැන්පත් කළ බව මහාවංශ කතාව කියයි. එහිදි සුමණ දිව්‍ය රාජයා තම වාස භවනය වන සුමණ කූටය (සමනොළ ගිර හෙවත් සමන් ගිරට) වඩින ලෙස බුදුපියාණන් වහන්සේට ආරාධනා කළ බව මහාවංශය කියයි.

සම්බුද්ධත්වයෙන් පස්වන වස බුදු පියාණන් වහන්සේ දෙවන වරට ලක්දිව නාගදීපයට වැඩම කර චූලෝදර-මහෝදර අරගලය සංසිඳුවාලීය. තෙවන වර ලංකාග මනය සිදු වූයේ බුද්ධත්වයෙන් අටවන වසරේදීය. එවර වැඩම කලේ කැලණියටය. කැලණියට වැඩියේ රහතන් වහන්සේලා 500 දෙනා සමඟ වෙසක් පෝය දිනකදී බවත්, ඒ රහතන් වහන්සේලා සමඟ දහවල් දානය වළඳා සුමණ දිව්‍ය රාජයාගේ වාස භවනය වන සුමණ කූට පර්වතයට වැඩ වම් සිරිපා ලාංඡනය පිහිටුවා වදාළ බවත්, පසුව පර්වත පාදයේ පිහිටි දිග් වූ ලෙනක (දිවාගුහාව, භගවා ලෙන) දිවා විහරණය කොට ශ්‍රී ලංකාවේ සොලොස්මස්ථානයන්හි මොහොතක් සම සුවයෙන් වැඩ සිට ආපසු දෙව්රම් වෙහෙර බලා වැඩම කළ බව මහා වංශයේ සඳහන්ය.

සමනොළ ගිර (සුමණ කූටය) සම්බුදු පියාණන්ගේ සිරිපා පිහිටු වීමට අමතරව බුදු හිමියන්ගේ ශ්‍රී පාද ලාංඡනය තවත් ස්ථාන තුනක (3) පිහිටුවා ඇති බව බෞද්ධ සාහිත්‍ය සඳහන් කරයි. ඒ ස්ථාන තුන 1. නර්මදා නදී තීරය, 2. යෝනක පුරය, 3. සච්ච භද්ධ පර්වතය ද වෙයි. සිරිපා වදින ගාථාවේ මෙම ස්ථාන සඳහන් වන බව බෞද්ධයෝ සඳහන් කරති.

සිරිපා ගමන් මග ස්ථාන තුනක් ප්‍රධාන කර ගනිමින් ආරම්භ වෙයි. ඉන් පළමුවැන්න රත්නපුර මාර්ගයයි. දෙවැන්න කුරුවිට එරත්ත මාර්ගයයි. තෙවැන්න හැටන් නල්ලතන්නිය මාර්ගය වෙයි. මෙම මාර්ග වලට සම්බන්ධ වන තවත් පාරවල් රැසක්ම ඇත. ක්‍රි.ව. 1340 දි ශ්‍රී ලංකාවේ සංචාරය කළ ඉබන් බතූතා නම් දේශාටකයා සමනොළ සිරිපා වන්දනා කිරීමට මාර්ග දෙකක් තිබූ බවත් ඒ මාර්ග දෙන 'බබා පාර' හා 'මමා පාර' යනුවෙන් සඳහන් කරයි. ඉබන් බතූතා බබා පාර ලෙස ආදම්ගේ මාවත නූතනයේ රත්නපුර පාර ලෙස දැක්වේ. මමා පාර නම් හැටන් මාර්ගයයි.

සිරිපා මාර්ගය මහා වනාන්තර මැදින් දිවෙන රූස්ස ගස් හා හෙළ බෑවුම් අතරින් බැස යන සීතදිය දහරා පසු කරමින් ගමන් මාර්ගය පිහිටා තිබේ. මේවා අතර ප්‍රධාන ස්ථානයන් වන්නේ මකර තොරණ, ළිහිණි හෙල, ඉදිකටු පාන, ගෙත්තම් පාන, සීත ගඟුල, මහගිරි දඹ, ධර්ම රාජගල, අහස් ගව්ව ආදි ස්ථාන පසු කරමින් මහ මළුවට පැමිණිය හැකිය. සමනළ කන්දට ආරක්ෂාවට මෙන් තවත් කඳු ශිඛර කිහිපයක්ම පිහිටා ඇති බව මහ මළුවේ සිට බලන්නෙකුට පෙනේ. ඒ කඳු වළල්ල අතර බෑන සමනොළ, ගවර විල, කුණු දිය පර්වතනය ප්‍රධාන තැනක් ගනී. සිරිපා ගමනේදී අතර මඟ නවතමින් සුන්දර පරිසරය ගැන නෙත සිත පිනවා ගන්නෝ බොහෝ දෙනාගේ සිරිතය.

රාත්‍රී කාලයේ ගමන් ගන්නා බොහෝ දෙනා අළුයම වෙද්දී ඉර සේවය නැරඹීමට අමතක නොකරන සිද්ධියකි. ඉර සේවය බොහෝ වන්දනාකරුවන්ගේ නෙත සිත පිනවන දර්ශනයකි. ශ්‍රී ලාංකිකයන් පමණක් නොව විදේශිකයින් බොහෝ දෙනා සිරිපා වන්දනා කරන්නේ ඉර සේවය නැරඹීමටය. ඒ සිද්ධිය නෙතින් දුටු දෑ විස්තරාත්මකව තව දින සටහන් පොත් වල ලියා තැබීය. තවත් විදේශිකයෝ ලෝකයේ කිසිම තැනක එවැනි සිද්ධියක් දැකීමට නොලැබුණු බවත් පුවත් පත් සඟරා වල ශ්‍රී ලංකාවේ ඉර සේවය දැකීම විස්තර කර දක්විය.

සිවිල් සේවකයකුගේ දින සටහන් වල පවා එවැනි වාර්තා දකින්නට ලැබේ. 1911 ජනවාරි 17 වන දින පී. කුක්සන් මහතා ලියු සටහනක සිංහල පරිවර්තනය මෙසේ දැක්වේ.

"'හිරු උදාව' එයින් මැවෙන රශ්මි මාලාව හා සෙවනැල්ල පිළිබඳ විස්තර කීමට පිටු ගණනාවක් අවශ්‍ය වනු ඇත. මෙයට වඩා අලංකාර වූ වෙනත් දර්ශනයක් මම තවම නුදුටුවෙමු. මේ තරම් සුන්දර දර්ශනයක් ලෝකයේ වෙනත් රටවලදීවත් මා දැක නැත. එය ඒ තරම්ම අලංකාරය. හිරු රැස් නිසා අහස මැණික් දුන්නක සේයාව ගනී. ශිඛරයේ සෙවනැල්ල තියුණු කඳු මුදුනක විලාසය මේ යැයි දක්වමින් විහිදෙයි. මේ වෙලාවේ අහසේ පවත්නා අලංකාරය අපගේ නෙත් පැහැර ගනී. මේ සියල්ල හදිසියේ පෙනෙන චමත්කාර දර්ශනයකි. තද අඳුර නැමැති විල්ලුදය පොරවාගෙන සිටින කඳු මුදුන් සුදු වළාකුළු අතරින් දර්ශනය වන්නේ රත් පැහැයෙන් කොදෙව් සමූහයක් රන් ආභරණින් සැරසුණු අන්දම විදහා පාමිනි."

මේ ආකාරයට 'ඉර සේවය' ගැන විස්තර ලියු විදේශිකයින් අතර දොස්තර ඩේවි, එච්.වේස්, හෙන්රි කේව්, දොස්තර ඒ. නෙල්, ජෝන් ස්ටීල් ආදි අය ප්‍රධාන තැනක් ගනී. විදේශිකයින් රැසක්ම ශ්‍රී පාද වන්දනා කර ඇති බව පෙනේ. සමන් ගිරට දිස්වෙන ඉර සේවය ලෝකයේ වෙනත් රටවල නැති බව පැහැදිලිය.

සිරිපා වන්දනාවට කිසිඳු ආගම් භේදයක් ඇත්තේ නැත. බුදුපියාණන් වහන්සේගේ ශ්‍රී පාද පත්මය වෙනුවෙන් බෞද්ධයන්ගේ වන්දනාමානය සිදුවේ. මෙයට අමතරව මුස්ලිම් බැති මතුන්ද්‍ර, ඉස්ලාම් ආගම් නායකයාණන්ගේ පාදය වෙනුවෙන් ද ශ්‍රී පාදය නමස්කාර කරති. ක්‍රිස්තු භක්තිකයන් බොහෝ දෙනා ශ්‍රී පාදනය වන්දනාවේ යෙදේ.

පස්වන සියවසේදී මහානාම භික්ෂුවගේ සම්පාදනයක් වන මහාවංශයේ සඳහන් වන පරිදි පොළොන්නරුව යුගයේ විසු නිශ්ශංක මල්ල රජු පළමුවන විජයබාහු රජු, ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු, පළමු වැනි විජයබාහු ආදී රජවරුන් සිය පිරිසෙන් සමඟ සිරිපා තරණය කර සිරිපා වන්දනා කළ බව කියැවේ.

ශ්‍රී පාද වන්දනාව සඳහා මුලින්ම ගල් පඩි යොදා මාර්ගය ඉදි කළේ නිශ්ශංක මල්ල රජතුමාය. රාජාවලියට අනුව සිරිපා මළුවේ ප්‍රථමයෙන්ම ඡත්‍රයක් සහිත මණ්ඩපයක් සාදා ඇත්තේ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසිනි. සිරිපා මළුවේ සමන් දේවාලය ඉදි කර ඇත්තේ දෙවන පරාක්‍රමබාහු රජතුමාය. ශ්‍රීමත් සර් ජෝන් කොතලාවල, ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යතුමන් සමන් දෙවිඳුන්ට වූ භාරයකට අනුව ප්‍රථමයෙන්ම සිරිපා මළුවට විදුලි ආලෝකය ලබා දුන්නේය. ඒ 1950 මාර්තු මස 04 වැනි දිනට යෙදුන මැදින් පුර පසළොස්වක පොහෝ දිනකදීය.

ලෝකයේ කිසිම රටක එක දිගටම වන්දනා සමයක් පැවැත්වෙන රටක් දකින්නට නැතැත් ලෝකයේ දීර්ඝතම වන්දනා සමය ලෙස සැළකෙන්නේ සිරිපා වන්දනා සමයයි. දෙසැම්බර් (උඳුවප්) පොහොයෙන් ඇරඹෙන සිරිපා වන්දනා සමය මැයි (වෙසක්) පොහොය දක්වා දිවා රෑ දෙකෙහිම නොකඩවා එක දිගටම මාස පහක් (5) කාලය පුරා පැවැත්වේ.

මෙවර උඳුවප් පොහොයෙන් (දෙසැම්බර් 26 දා) ආරම්භ කෙරෙන අතර ශ්‍රී පාදස්ථානාධිපති සබරග මුවව පළාතේ ප්‍රධාන සංඝනායක ආචාර්ය බෙන්ගමුවේ නාලක හිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රත්නපුර පැල්මඩුල්ල ශ්‍රී පාද රජමහා විහාරස්ථානයේ තැන්පත් කර ඇති සධාතුක කරඬුව, සමන් දේව ප්‍රතිමාව, දේව ආභරණ හා පූජා භාණ්ඩ ආදිය සිරිපා මළුව වෙත වැඩම වීමට නියමිතය. එය දෙසැම්බර් 25 වැනි දින අළුයම පැල්මඩුල්ල ශ්‍රී පාද රජමහා විහාරස්ථානයෙන් ආරම්භ කෙරෙන පෙරහැර ඉපැරණි චාරිත්‍ර ඉටු කිරීමෙන් අනතුරුව මාර්ග හතරක් ඔස්සේ ආරම්භ කෙරෙන පෙරහැර හතරක් එකතුවීමෙන් පසු මහ මළුව වෙත පැමිණීමට නියමිතය.

**ශාස්ත්‍රපති ලොකුබණ්ඩාර මුණසිංහ**
(සාම විනිසුරු - මුළු දිවයිනටම)



# ශ්‍රී ලංකාවේ රාජ්‍යපාලනය හා බුදුසමය

ශ්‍රී ලංකාවේ බුදු සමයේ ඉතිහාසය යම් තරම් පැරණිද, ඒ තරමටම බුදු සමයත් රාජ්‍යයත් අතර සම්බන්ධය ද පැරැණිය. ශ්‍රී ලංකාවේ බුදු සමයෙහි ඉතිහාසය ක්‍රි.පූ. 3 සියවසෙහි දේවානම්පියතිස්ස රජු දවස ඇරඹෙන්නේය. ශ්‍රී ලංකාවේ බුදු සමයත් - රාජ්‍යයත් අතර සම්බන්ධය ඇරඹෙන්නේ ද එ් දවසමය.

මිහිඳු මාහිමියන් ශ්‍රී ලංකාවට වැඩමවන අවස්ථාව වන විට මෙහි පැවැති දේශපාලන තන්ත්‍රය බ්‍රාහ්මණ බලපෑමට නතුව පැවැති බවට සාධන ලැබේ. මහින්දාගමනයට පෙර රජු පුරාතන භාරතීය පාලන තන්ත්‍රය අනුව යමින් බ්‍රාහ්මණ පුරෝහිතයකුගේ අනුශාසනය යටතේ රාජ්‍ය පරිපාලනය ගෙන ගිය බව විජය රජුගේ උපතිස්ස පුරෝහිතයා (පොරොහිච්ච) පිළිබඳවත් පණ්ඩුකාභය රජුගේ චන්ද නම් පුරෝහිතයා පිළිබඳවත් එන සඳහන්වලින් සලකා ගත හැකිය.

මෙපමණක් නොව, රාජ්‍යත්වය හා සම්බන්ධ ආගමික ආධිපත්‍යය බ්‍රාහ්මණයන් සතු කොට ගෙන තිබුණු බව විජය රජු මිය ගිය පසු උදා වූ අරාජක අවදියේදී ඇමතිවරුන් තම්බපණ්ණි නගරයෙන් අවුත් උපතිස්ස ග්‍රාමයෙහි සිට රට පාලනය කළ බව දැක්වෙන පුවතිනුත් පණ්ඩුකාභය කුමරු පණ්ඩුල බ්‍රාහ්මණයා වෙතින් ශාස්ත්‍ර හැදෑරීමේ පුවතිනුත් හෙළිදරව් වෙයි. පණ්ඩුකාභය බ්‍රාහ්මණ හින්දු වීර කාව්‍යයන්හි එන රජකුගේ තත්ත්වයට පත් කරලමින් රාජ්‍යත්වයේ බලතල සියතට ගෙන ක්‍රියා කළෝ බ්‍රාහ්මණයෝය.

බ්‍රාහ්මණයන්ගේ ආගම එවකට රාජ්‍යධ ආගමව පැවැත්තේය යන සඳහන කෙලින්ම දක්නට නොලැබෙතුදු එය එසේ වී යැයි අනුමාන කළ හැකි සාධක ලැබේ. සියලු ආම්වලට සැලකීමේ ප්‍රතිපත්තිය මත දෙවොල්, ආශ්‍රම ආදිය ඉදි කළ ද සොත්ථිසාලා, සිවිකාසාලා, බ්‍රාහ්මණවත්ථු හෙවත් බ්‍රාහ්මණවට්ට ආදි බ්‍රාහ්මණ ආගමික ගොඩනැගිලි රැසක් ඉදිකරවීමෙන් ම ඒ බව පෙනී යයි.

**රාජ්‍යාගම**

ක්‍රි.පූ. 3 සියවසේ මිහිඳු මාහිමියන් පැමිණීමෙත් සමඟ ම බුද්ධාගම ලංකාවේ රාජ්‍ය ගම බවට පත් වී යැයි කිවහොත් ඒ නිවැරදිය. මෙය බැලු බැල්මට ප්‍රාතිහාර්යයක් බඳු ක්ෂණික සිදුවීමකි. එහෙත් දේවානම්පියතිස්ස රජුත් භාරතයේ අශෝක රජුත් අතර පැවැති සම්බන්ධතාව මේ ක්ෂණික විපර්යාසයට තුඩු දුන් බව පැහැදිලිවම පෙනී යයි.

ලංකාවට ආසන්න රට වූ ඉන්දියාව අශෝකයන් යටතේ අධිරාජ්‍ය තත්ත්වයක් ගොඩ නගා ගෙන තිබුණු බව දකුණු ඉන්දියාවේ පුලිකට්හි සිට නැගෙනහිර ඉන්දියාවේ චිතල්ඩ්‍රග් දක්වා මෞර්ය අධිරාජ්‍යයේ සීමාවන් විහිද තිබීමෙනුත් අශෝකගේ දහතුන්වන ශිලා ලේඛනයට අනුව සිරියාව, මිසරය, මැසිඩෝනියාව, සිරීන්, සයිරේනියාව ආදි විදේශයන්ට පවා තම සම්බන්ධතාවන් විහිදවා තිබීමෙනුත් සලකා ගත හැකිය.

මේ අධිරාජ්‍ය තත්තවය කෙරේ කිසියම් ගෞරව සම්ප්‍රයුක්ත බවක් ශ්‍රී ලංකාවේ රජු ඇති කර ගෙන තිබිණැයි කල්පනා කිරීම යුක්ති සහගතය. ලක් රජු අශෝකයන් වෙත පුද පඬුරු සමඟ දූතයින් යැවීමත් අශෝක රජු යළි අභිෂේකයක් කරන ලෙස දන්වා අභිෂෙකොපකරණ ලංකාවට එවීමත් පිළිබඳ වංසකතා සඳහන් තුළින් ලක් රජු අශෝකයන් කෙරේ දැක් වූ ගෞරවය මැනැවින් අනාවරණය කෙරෙයි.

දේවානම්පියතිස්ස රජුත් එයින් අනතුරුව ලක් රජුන් රාශියකුත් භාවිත කළ දෙවනපිය විරුද නාමය ද ඔවුන්ට ලැබුණේ අශෝක රජුගෙන්ය. මේ සමඟ ම අශෝක රජු ලක් රජුට තවත් පණිවුඩයක් ද එවා තිබිණි. එනම්, මම බුදු සසුනෙහි තෙරුවන් සරණ ගිය උපාසකයකුව සිටිමි. ඔබත් මාහැඟි තෙරුවන් සරණ යන්න යන පණිවුඩයයි. මේ කරුණු අනුව මිහිඳු මාහිමියන් පැමිණි මහාම මෙහි බුද්ධාගම රාජ්‍යාගම බවට පත්වීම පිළිබඳ ප්‍රාතිහාර්යාත්මක, අවිශ්වසනිය ස්වරූපය ඉවත්ව යයි.

**ජාතික ආගම**

මෙසේ බිහු වූ ශ්‍රී ලංකාවේ ජාතික ආගම හෙවත් රාජ්‍ය ආගම පිළිබඳ සංකල්පය ක්‍රි.පූ. 3 වන ශත වර්ෂයේ පටන් සිංහල රාජ්‍යයේ අවසානය වූ 9 වන ශත වර්ෂය දක්වා ම ගත වූ දීර්ඝතම කාලය තුළ නොනැසී පැවැත්තේය. ලක් සිහසුන බෞද්ධයකුටම මිස අන් කිසිවකුටත් හිමි නොවන බව මේ මුළු කාලය තුළම ලක් වැස්සන්ගේ සම්මතය විය.

ක්‍රි.ව. 10 වන සියවස වන විට මේ අදහස තව දුරටත් වැඩි දියුණු වී ගොස් බෞද්ධයකු පමණක් නොව, ලක් රජය උරුම බෝධිසත්වයකුටය යන අදහසක් ද ඇතිවිය. iv මිහිඳු රජුගේ (ක්‍රි.ව. 956-972) අභයගිරි දෙවන ලිපියෙහි සිරිලක්හි නොබොහොසත්හු නොරජවන්හයි සැහැකුල කොත් සවැනිය මුණිරජ්හු වියරන ලද් තුමා යනුවෙන් බෝධිසත්වයකු හැර අන් කිසිවෙක් ලක්දිව රජ නොවන්නේ යැයි ද ඔවුන්ට මේ ව්‍යාකරණය (විවරණය) ලැබුණේ ශාක්‍ය වංශ ජාත නර්වඥයන් වහන්සේගෙන්ම යැයි ද දැක්වෙයි.

මෙහි ම තුමා පය්සිවුර් රක්(නුවා)ස් මහසඟ්හු පිළිවැයු රජ්සිරි පැමිණ සැණැ බිහෙව් වින්දීන (ද) වස් මහ (ස)ඟ්නට් මෙහෙයට් උවසර් වස් යනුවෙන් බුදුරජුන්ගේ පාත්‍ර චීවර රකිනු සඳහා මහා සංඝයා පිළියෙල කර දුන් රාජ්‍ය ශ්‍රීයට පැමිණෙන බව කියැවේ. මෙහි මහාසඟ්හු පිළිවැයු රජ්සිරි යන්න අපගේ විශේෂ අවධානය මොයු විය යුත්තකි. මේ අනුව රාජ්‍යය යමෙකුට හිමි වන්නේ සංඝයාගේ කැමැත්ත අනුවය යන්න පිළිගෙන තිබුණු බව පෙනේ. බුද්ධාගම රාජ්‍යාගම හෙවත් ජාතිකාගම බවට පත් වෙද්දී භික්ෂූන් වහන්සේ ජාතියේ මුර දේවතාවුන් බවට ද පත් වූයේ එහෙයිනි.

ක්‍රි.ව. 12 සියවසේ නිශ්ශංකමල්ල රජු සිය පොළොන්නරුවේ ගල්පොත ශිලාලේඛනයෙහි ලක්දිවැ බුද්ධශාසනයට ප්‍රතිපක්ෂ අබෞද්ධ චොල පාණ්ඩ්‍යාදි රජුන් නොපිහිටිය යුත්තේය යනුවෙන් චෝල පාණ්ඩ්‍ය ආදි අබෞද්ධයින් ලක් සිහසුනට පත් නොකළ යුතු යයි දක්වා තිබේ. එරජුන් විසින්ම පිහිටුවන ලද පොළොන්නරුවේ උතුරු වාසල් පුවරු ලිපියෙහි ද බුදු සසුනට හිමි ලක්දිවට අබෞද්ධ චෝළ කෙරළාදී රජ දරුවෝද තොතැකිය යුත්තාය යනුවෙන් බුද්ධශාසනයට හිමිකම් ඇති ලක්තලයට අබෞද්ධ වූ චොල කේරලාදී රජ දරුවන්ට උරුමකම් නැතැයි අවධාරණය කොට ඇත.

**තුනුරුවන් භාණ්ඩාගාරය**

ක්‍රි.ව. 13 සියවස වන විට මේ අදහස තව තවත් තහවුරු වී තිබුණු බව දඹදෙණිය යුගයට අයත් සාහිත්‍ය කෘතියක් වන බුද්ධපුත්‍ර මාහිමියන්ගේ පූජාවලියෙහි මේ ලංකාද්වීපය බුදුන්ගේම තුනුරුවන් භාණ්ඩාගාරයක් වැන්න. එසේ හෙයින් මේ මිථ්‍යාදෘෂ්ටි ගතුවන්ගේ වාසය නම් පෙර යක්ෂයන්ගේ වාසය ස්ථිර නුවූවා සේම ස්ථිර නොවේමය. මිථ්‍යාදෘෂ්ටි ගත් රජෙක් ලක්දිව බලාත්කාරයෙන් කිසි කලෙක රාජ්‍යය කළේ වී නමුත් ඔවුන්ගේ වංශ ප්‍රතිෂ්ඨා නොවනු බුදුන්ගේ අනුභාව විශේෂයක්මය. එසේ හෙයින් මේ ලක්දිව සම්‍යග් දෘෂ්ටි ගත් රජුන්ටම සීහෙන හෙයින් උන්ගේ කුලප්‍රවේණිය පවතින්නේ ද ඒකාන්තමය. මේ ලක්දිව නම් මිථ්‍යා දෘෂ්ටි ගත් රජුන්ට නොසීහෙනු ඒකාන්ත ධර්මයෙක සම්‍යක් දෘෂ්ටි ගත් රජුන්ටම සීහෙනුද ඒකාන්ත ධර්මයෙක. යන ප්‍රකාශයන්ගෙන් තහවුරු වේ.

මහනුවර කාලයේ පවා මේ අදහස බලවත්ව පැවති බව 1816 පුනි 13 දා බ්‍රාවුන්රිග් ආණ්ඩුකාර තැන විසින් එංගලන්තයට යවන ලද ලියමනකින් පෙනේ යයි යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම මාහිමියෝ පෙන්වා දෙති. යටත් විජිත යුගයෙහි බුදු සමයට හිමිව පැවැති තැන යටපත්ව ගිය බව පෙනෙතුදු 1815 දී සම්මත කර ගන්නා ලද ඉංගිරිසි - සිංහල ගිවිසුමේ ද මෙකී රටවල්වල මුලාදෑනි සහ වැසියන් විසිනුත් අදහන්නා වූ බුද්ධ ශාසනය ද දේවාගම ද කඩ කළ නොහැකිව පවත්වන්නට ඕනෑව සහ එහි කටයුතු ද සංඝයා වහන්සේලා ද විහාරස්ථාන ද දේවාල ද පවත්වන්නට සහ ආරක්‍ෂා කරන්ට ඕනෑය යනුවෙන් එය අයිතිය තහවුරු කර ලීමේ වගන්තියක් ඇතුලත් කොට තිබේ. නිදහස් ලංකාවේ අභිනව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්හි ද බුද්ධාගම මේ රටේ ප්‍රමුඛ ආගම වශයෙන් පිළිගෙන ඇත්තේය. රජය විසින් බුද්ධාගම සුරක්‍ෂිත කොට පෝෂණය කළ යුත්තේය යනුවෙන් 1972 ජනරජ ව්‍යවස්ථාවෙහිත් 1978 ජනරජ ව්‍යවස්ථාවෙහිත් සඳහන්ව තිබේ.

### අබෞද්ධ පාලකයෝ

මේ අතර ම බෞද්ධ නොවූ යමෙක් ලක් රජය ආක්‍රමණ ආදි මාර්ගයන්ගෙන් හෝ අල්ලා ගත්තේ නම් ඔවුන් ද ව්‍යාජ ව හෝ බෞද්ධයන් සේ පෙනී සිටින්නටත් බෞද්ධාගමේ ආරක්‍ෂකයන් ලෙස කටයුතු කරන්නටත් උත්සුක වූ බවට කොතෙකුත් සාධක ලැබේ. කවර ආකාරයකින් හෝ අල්ලා ගත් පාලන බලය තහවුරු කර ගැනීමට නම් බුදු සමය කෙරේ දැක්විය යුතු ගෞරවයත් ඒ කෙරේ ඉටු කළ යුතු යුතුකමුත් නොපිරිහෙලා ඉටුකළ යුතුය යන ආකල්පය ඔවුන් විසින් දැරූ බව පෙනේ.

අසේල රජු මරා රාජ්‍යය උදුරා ගත් එළාරයන් කොතෙක් දුරට බෞද්ධ සිත් සතන් දිනා ගැනීමට මෙම ක්‍රියා මාර්ගය උපයෝගී කොටගත්තේද යත්, අපේ වංසකථාකරුවන් පවා ඔහු හඳුන්වා ඇත්තේ දැහැමින් (ධම්මෙන) රාජ්‍යය කළ රජකු හැටියටය. දීපවංස කරු ඔහු හඳුන්වා ඇත්තේ තුලාවක් මෙන් (තුලාභූතොව හුත්වාන) රාජ්‍යය කළ යුක්තිගරුක රජකු හැටියටය. මෙම ප්‍රසන්නතාව එළාරයන් ලබා ගත්තේ කෙසේද යන්න ඔහුගේ ක්‍රියා කලාපය විමසා බැලීමේදී හෙළි වෙයි. ඒ අනෙකක් නොව, බුදුසමය කෙරේ ඔහු දැක්වූ ගෞරව පක්‍ෂපාතිත්වයයි. චෙතියගිරිය (මිහින්තලය) ට වන්දනා ගමනක යොදුණු ඔහු පෙර සිරිත් අනුව භික්‍ෂූන් වහන්සේලා බැහැ දැක්කේය.

තව රිය කෙළවර වැද ස්ථූපයක කොටසක් බිඳී ගිය කල ඇමතිවරුන් ඒ බව ඔහුට දන්වා සිටි බවත් එවිට ඔහු රියෙන් බැස රිය සකට යට කොට තම හිස හිඳින්නැයි කියා සිටි බවත් මහරජ, පරහිංසාව ශාස්තෘන් වහන්සේ නොකැමති හෙයින් ස්ථූපය ප්‍රකෘතිමත් කරවා ක්‍ෂමා කරවනු මැනැවැයි කී විට එය ප්‍රතිසංස්කරණය කර වූ බවත් දැක්වේ. එපමණක් නොව, එළාරයන්ගේ අමාත්‍ය මණ්ඩලය සිංහ බෞද්ධ ඇමතිවරුන්ගෙන් ද සමන්විය වූ බව ආචාර්ය අදිකාරම් පෙන්වා දෙයි.

### උපපද නාම

ක්‍රි.ව. 5 සියවසේදී ලක්දිව රජ පැමිණි බුද්දපාරින්ද නම් ද්‍රවිඩ රජු තමන් බුදුසමයට අවනත බව පෙන්වීම සඳහා බුද්දස (බුද්ධදාස) යන උපපද නාමය ගත් බව අනුරාධපුර පුවරු ලිපියෙන් හෙළිවේ. මෙම ලිපිය ලියැවී ඇත්තේ මේ රජුගේ මෙහෙසියක විසින් විහාරයකට පිරිනමන ලද දාන වස්තූන් දැක්වීමට බවද විශේෂයෙන් සිහිපත් කළ යුතු වන්නේය.

කතරගමින් සොයා ගෙන ඇති ලිපියක දමිළ තිරීතර රජුගේ පුත්‍ර දාඨීය රජු කතරගම මංගල මහා විහාරයට කළ පූජාවක් ගැන සඳහන්ව තිබේ. මහනුවර යුගයේ උඩරට රාජ්‍යයේ රජ කළ නායක්කර් වංශික ද්‍රවිඩ රජවරු පවා තම බිසෝවරුන් හින්දු සමය අදහද්දී තමන් හින්දු සමය අතහැර බුදුසමය වැළඳ ගෙන බුදුසමය කෙරේ පිළිපැදිය යුතු යුතුකම් හා වගකීම් ඉටු කළහ.

ලංකා රාජ්‍යය හා බුදුසමය අතර පැවැති අවියෝජනීය සම්බන්ධය කොතරම්ද යන්න පෙන්වන තවත් සාධකයක් නම් ලක් රජුන් විසින් බොහෝ විට යොදා ගෙන ඇති සංඥා නාම හා උපාධි නාමයන් බෞද්ධ මුහුණුවරක් ගෙන තිබීමයි. බුද්ධ, ධම්ම, සංඝ යන නම් ඔවුනට ඉතා ප්‍රිය විය. බුද්ධදාස, ධර්මාශෝක, සංඝතිස්ස, සංඝබෝධි, සද්ධාතිස්ස, ධාතුසේන, අග්ගබෝධි යන නම් මෙන්ම සුප්‍රකට බුද්ධ ශ්‍රාවකයින් වහන්සේලාගේ නම් වන මහින්ද, කාශ්‍යප, මොග්ගල්ලාන යන නම් ද ඔවුහු භාවිත කළහ. සිරිසඟබෝ යන උප පද නාමය සිරි සඟබෝ උදා යනුවෙන් iv උදයත් සිරිසඟබෝ අබහය් යනුවෙන් iv මිහිඳුත් සිරිසඟබෝ විජයබාහු යනුවෙන් මහා විජයබාහුත් ආදි වශයෙන් බොහෝ රජවරුන් මහත් අභිරුචියකින් යෙදූ නාමයක් වූයේ එය බෝසත් ගුණ පිළිබඳ සංකේතාත්මක නාමයක් වූ බැවින් විය යුතුය. වෙස්සගිරි පුවරු ලිපිය පුලිමියන්කුලම් පුවරු ලිපිය, මිහින්තලා ලිපිය ආදියෙහි භික්‍ෂූන් වහන්සේලා හැඳින්වීම සඳහා භාවිතා වූ වත්හිමි යන උප නාමය

වත්හිමි විජයබාහු, පරාක්‍රමබාහු වත්හිමියන් වහන්සේ ආදි වශයෙන් රජුන් බොහෝ දෙනෙක් ම යොදා ගත්හ.

මහින්දාගමනයත් සමඟ ම බ්‍රාහ්මණ පුරෝහිත අනුශාසකත්වය ඇතුළු රාජ්‍යය කෙරේ විහිද පැවැති බ්‍රාහ්මණ බලය පිරිහී ගිය බව මේ ලිපියේ ආරම්භයේ ම සඳහන් කළෙමු. බුදුසමය මෙරටට පැමිණීමෙන් පසු බ්‍රාහ්මණයන් සතුව තිබුණු මේ ස්ථානය භික්ෂූන් වහන්සේට හිමිවූ බව පෙනේ. ඒ සඳහා අවශ්‍ය යෝග්‍යතාව බුදු දහම විසින් හිමි කර දී තිබිණි.

රාෂ්ට්‍ර පාලනය දෙවියන් සම්බන්ධ කාර්යයක් නොව මනුෂ්‍යයන් සම්බන්ධ ජන ජීවිතයේම අංගයක් ලෙස සැලකූ බුදුදහම රාෂ්ට්‍ර පාලනයෙහි ලා වැදගත් වන අවවාද අනුශාසනා පද්ධතියකින් ද සමන්විත වූවක් විය. සංයුත්ත නිකායේ මාරසංයුක්තය, දීඝනිකායේ චක්කවත්තිසීහනාද, අග්ගඤ්ඤ, මහා පරිනිබ්බාණ, ලක්ඛණ ආදි සූත්‍රයන්හි එම අනුශාසනාවන් ගැබ්ව ඇත. දසරාජ ධර්මයත් පඤ්ච ශීලයත් පදනම කොට ගත් නව පාලන රටාවකට ලක් රජුන් යොමු කරවන්නට මේ නිසා භික්ෂූන් වහන්සේලාට අවස්ථාව සැලසිණි.

**භික්ෂු දේශපාලනය**

කලින් සිටි බමුණන් සමීප ව සිටියේ රජුන්ට පමණය. එහෙත් භික්ෂූන් වහන්සේ ජනතාවට ද සමීප ව සිටියහ. එබැවින් ජනතාවගේ අවශ්‍යතා හඳුනා ගෙන ඊට අදාළ රාජ්‍ය පාලනයක් කරා රජුන් මෙහෙයවන්නට උන්වහන්සේලා සමත් වූහ. භික්ෂූන් වහන්සේලා ලක්දිව රාජ්‍ය සංස්ථාව සමඟ ළඟින් ම සම්බන්ධව කටයුතු කළ බවට සාධක කොතෙකුත් ඉදිරිපත් වෙයි. මහින්දාගමනයේදී මිහිඳු මාහිමියන් දේවානම්පියතිස්ස රජුගේ ආගමික අනුශාසකයා බවට පත් වූවා ද දේශපාලන කටයුතු කෙරේ උන්වහන්සේ එතරම් ම උනන්දු වූ බවක් නොපෙනේ.

ඇතැම් විට ඒ අවස්ථාවේදී භික්ෂූන් වහන්සේට ඉදිරිපත් ව කටයුතු කරන්නට තරම් දේශපාලනමය අවශ්‍යතාවක් පැන නොනැඟුණා විය හැකිය. කෙසේ වුවද භික්ෂූන් වහන්සේ ප්‍රථම වරට දුටුගැමුණු අවදියේදී මේ කාර්යයට අතගැසූ බව පෙනේ. එළාර ප්‍රමුඛ ද්‍රවිඩයන්ගෙන් වන ආගමික වූත් ජාතික වූත් විනාශය දැක දැක නිහඬව සිටින්නට තරම් භික්ෂූන් වහන්සේලාට නොහැකි වූවාට සැක නැත. විශේෂයෙන්ම බුදුසමය රැකෙන්නේ සිංහල ජාතිය රැකුනොත්ය යන අදහස දැරූ යුගයක බුදුසමයෙහි ආරක්ෂකයින් වන භික්ෂූන් වහන්සේලා සිංහල රාජ්‍යය රැක ගැනීමට කටයුතු කිරීම පුදුම විය යුත්තක් නොවේ.

ද්‍රවිඩ සිංහල සටනෙහිදී සිංහල විජයග්‍රහණයට බාධාකයක්ව පැවැති සද්ධාතිස්ස, දුටුගැමුණු දෙසොහොයුරන්ගේ අසමගිය ගොඩගත්තතිස්ස තෙරුන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලාගේ මැදිහත් වීමෙන් සමථයකට පත් වූයේත් පැවිදිව මහණ දම් පුරමින් සිටි ථේරපුත්තාභය උපැදිව ජාතික සටන් බිමට පිවිස ජයග්‍රහණයෙන් අනතුරුව යලි පැවිදි වූයේත් දුටුගැමුණු රජුගේත් සිංහල සේනාවෙහිත් ධෛර්යය පිණිස භික්ෂූන් වහන්සේලා සටන් පෙරමුණට ගියේත් එහි ප්‍රතිඵල විසිනි.

මෙසේ ම වළගම්බා රජුගේ කාලයේදී ද පර සතුරු උවදුරින් රජයත් රටත් රටවැසියාත් ගලවා ගන්නට භික්ෂූන් වහන්සේලාගේ නොමද සහය රජුට ලැබිණි. පලා ගොස් වල් වැදී සිටියදී අනාමට්ඨ පිණ්ඩපාතයෙන් රජු පෝෂණය කළෝ භික්ෂුහුය. ද්‍රවිඩයන්ට එරෙහිව සටහනට සූදානම් වන වකවානුවෙහි රජුගේ ප්‍රමාදයකින් කලකිරුණු ඇමතිවරුන් පිරිසක් රජු අතැර ද්‍රවිඩයින්ට එක් වන්නට ගිය හොහොතෙහි යළි එවුන් කැඳවාගෙන අවුත් රජු හා සමගි කළෝ ද භික්ෂුහුමය. ගජබා, පැරකුම් දෙරජුන් අතර රාජ්‍යය පිළිබඳව ඇති වූ වියවුලෙහිදි භික්ෂූන් මැදිහත් ව සමථයකට පත් කළ බව සංගමු විහාර සෙල්ලිපිය කියයි. මේ හැරත් ද්‍රවිඩයින්ගෙන් ධාතුසේන රජු මුදා ගැන්මට ඔහු රැගෙන තැනින් තැන සැරි සැරූයේ ද මහාවංසංසය ලියා ජාතික ඉතිහාසය ජාතියට උරුම කළ මහානාම මාහිමියෝය.

**රාජ්‍ය උරුමය**

භික්ෂූන් වහන්සේලා රාජ්‍ය උරුමය පිළිබඳව ද මැදිහත් වූ බව දක්නට ලැබේ. ඇතැම් විටෙක තමන්ට අභිමත වූවන් රාජ්‍යයට පත්කරලීය සඳහාත් පැන නැග ඇති ව්‍යාකූලතාවන් මග හැරවීම සඳහාත් මේ මැදිහත් වීම් සිදුවී තිබේ. සද්ධාතිස්ස රජුගෙන් අනතුරුව ථුල්ලත්ථනට රජකම පැවරීමේදී ද පළමුවන විජයබාහු රජුගෙන් අනතුරුව යුවරජුට රජකම පැවරීමේදී ද රාජාධිරාජසිංහ රජුගෙන් පසුව ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට රජකම පැවරීමේදී ද භික්ෂූන් වහන්ස්ලා එසේ මැදිහත් වූහ. මහාපරාක්‍රමබාහු රජු කිත්නුවරගලුන් යවා බුරුමයේ කුසුම් නුවරට පහර දීයටත් කර ගෙන ලක්රජයේ යටත් විජිතයන් ලෙස පවත්වාගෙන යද්දී බුරුම භික්ෂූන් වහන්සේලාගේ ඉල්ලීම පරිදි ලංකාවේ තුන් නිකායේ භික්ෂූන් වහන්සේලා ලක්රජු හා කථිකා කොට බුරුමයට සහනය ලබා දුන් බව ද සඳහන් වේ.

බුදුදහම නිසා ඇතැම් විට දේශපාලන විරුද්ධවාදීන් හමුවට පවා නොබියව යන්නට රජුන්ට හැකියාව ලැබිණි. සේරු නුවර රජු හා කාවන්තිස්ස රජු අතර සමගියක් නොවූව ද සේරු නුවන පැවැති ධාතු නිදානෝත්සවයකට සහභාගිවීම සඳහා කාවන්තිස්ස රජු එහි ගිය විට එහි සිටි සිව රජු ඒ ගමන වැලැක්වීමට උත්සාය නොගත්තේය. ඒ අවස්ථාවේ කාවන්තිස්ස රජුට විරුද්ධ වීම ජනතාව සැලකුවේ බුද්ධාගමට විරුද්ධ වීමක් හැටියට හෙයින් සිව රජුට නිශ්ශබ්ද වනු විනා අන් කළ හැක්කක් නොවීය. බුද්ධාගමට අවධාරණය වන තවත් අවස්ථාවක් ධාතුසේන රජු සපයා දෙයි. ධාතුසේන රජුට විරුද්ධව ද්‍රවිඩයින්ට එක් ව කටයුතු කළ කුලීනයින් හෝ කුලහීනයින් තම රජු හෝ බුදුසසුන ආරක්‍ෂා නොකළවුන් හැටියට ඔහු චෝදනා කළේය.

### බුද්ධාගම පිළිබඳව රජුගේ වගකීම

රාජ්‍යය හා බැඳුණු බුද්ධාගම රට තුළ වඩ වඩාත් දියුණු තත්ත්වයකට ගෙන ඒමට අනිවාර්යයෙන් ම රජතුමා බැඳී සිටියේය. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ප්‍රධාන පෙළේ ඓතිහාසික විහාරාරාම බොහොමයක්ම රජුන්ගේ මෙහෙයවීමෙන් ඉදි වූ ඒවා වීමේ රහස එයයි. එකම ස්තූපය වරින් වර විශාල කරමින් වැඩි දියුණු කරවන ලද්දේ ද ඌන වූ විහාරාංග කරවා සම්පූර්ණ කරවන ලද්දේ ද ඒ අනුවය. විහාර ආරාමයන් ක්‍රමවත්ව පවත්වා ගෙන යාම සඳහා ද රජුන්ගේ අනුග්‍රහය නොමද ව ලැබිණි. ඒ සඳහා රජුන් විසින් කෙබඳු පරිශ්‍රමයක් දරන ලදද යන්න මිහින්තලා ශිලා ලේඛනයෙන් මනා ව පැහැදිලි වෙයි.

විහාරය සඳහා අවශ්‍ය සියලුම සේවාවන් රාජකාරි බවට පත් කොට තිබිණි. වෛද්‍යවරුන්, අහර පිසන්නන්, සහල් සපයන්නන්, දර සපයන්නන්, වළං තනන්නන් ආදී අවශ්‍ය සියලුම සේවකයින් රජයේ වැටුපෙන් නඩත්තු කෙරිණි. ආරාම පාලනය සඳහා පත්කොට තිබුණු විශාල නිලධාරි පිරිස අතර වෙහෙර් පිරිවහනුවා (ආරාම පාලනය භාර ප්‍රධාන නිලධාරියා) නියම්ජෙටු (අය පාලක මණ්ඩලයේ ප්‍රධානියා) කරඬිලෙයා (කරඬු භාර ලේකම්) පසක්කැමි (ප්‍රත්‍ය සම්පාදකයා) කැබලිජෙටු (විහාර ගම්හි පාලකයා) යන තනතුරු ඉතා වැදගත් විය. එසේම විහාරාරාමයන්හි පරිභෝජනය සඳහා විශාල වශයෙන් ගම්බිම් පවරා දී තිබිණි.

හිතිකාභය රජු විසින් කරන ලද එවැනි පරිත්‍යාගයන් ගැන මෝලාහිටියවෙලේගල ලිපිය කරුණු අනාවර්ණය කරන අතර බදු ආදි විවිධ ආදායම් මාර්ග විහාරාමයන්ට පවරා තිබිණු අයුරු ලබුඇටබැඳිගල පෙරුමියන්කුලම් ආදි ලිපිවලින් හෙලිදරව් වෙයි. වැව් හා ඇල දොළ වලින් ලැබුණු ජල බද්ද විහාරයනට පැවරූ බව පුලිමියන්කුලම් ලිපියෙනුත් වී ආදී ධාන්‍ය වර්ග හෝ මුදල් බැංකුවල තැන්පැත් කිරීම් ආදියෙන් ලත් පොලිය විහාරයට පිදූ බව තෝනිගල ලිපියෙනුත් හෙලි වේ.ඇතැම් විහාරාරාම පරිපාලනයෙහි ලා රජය විසින් ඇති කොට සංවිධානය කොතරම් දියුණු වීද යත් **සංඝාරාම පාලනයට** විශේෂ දෙපාර්තමේන්තු පිහිටුවා තිබිණැයි මිහින්තලා ලිපිය හා අභයගිරි සංස්කෘත ලිපිය ඇසුරෙන් යක්කඩුවේ ප්‍රඥාරාම මාහිමියෝ පෙන්වා දෙති මිහින්තලයේ ආරාමික කටයුතු සදහා සේවකයින් 200ක් පමණ සිටි බව වල්පොල රාහුල හිමියෝ පෙන්වා දෙති.

ශාස්ත්‍රපති **සිරිසේන විතානගේ**



# ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමන්ගේ 159 වන ජන්ම දින සැමරුම සහ නායකත්ව පුහුණු වැඩමුළුව




සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය, ගාල්ල තරුණ බෞද්ධ සමිතිය හා ආණ්ඩුකාර කාර්යාලය එක්ව ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමන්ගේ 159 වෙනි ජන්ම දින සැමරුම ගාලුපුරවරයේ අති උත්කර්ෂවත් ලෙෂ පවත්වන ලදි

ගාලු දිස්ත්‍රික්කයේ සියලුම දහම් පාසල් ගුරුවරුන් සඳහා නායකත්ව පුහුණු වැඩ සටහන් පවත්වා ගුරුවරුන් අතර මී පැල පන්සියයක්ද බෙදා දෙන ලදි

# ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාස සඳහා පවත්වනු ලැබූ වැඩමුළුව



















**ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාස සඳහා පවත්වනු ලැබූ වැඩමුළුව**


සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ජාතික සමාජසේවා මණ්ඩලය මගින් පාලනය කරනු ලබන ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාස වල සිටින පාලක සභා නිලධාරීන් සහ සාමාජිකයින් උදෙසා අරමුදල් රැස් කිරීම්, සේවා කටයුතු ප්‍රවර්ධනය කිරීම් ඇතුළු අලෙවිකරන මූලධර්ම පිළිබඳ වැඩමුළුව 2023 අගෝස්තු මස 27 දින බෞද්ධ මහා සම්මේලන ශාලාවේදී සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලැබීය. එහිදී ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා, ප්‍රවීණ අලෙවිකරණ දේශක පී.පී. පෙරේරා මහතා, විශ්‍රාමලත් විගණකාධිපති ගාමිණී විජේසිංහ මහතා, මහජන බැංකු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(විශ්‍රාමික) වසන්ත සිල්වා මහතා සහ හිටපු මහාධිකරණ විනිසුරු සහ වර්තමාන මහාභාරකාර තැන්පත් නීතිඥ ගිහාන් පිලපිටිය මහතා ඇතුළු මහත්වරුන් විසින් දේශන පවත්වන ලදී. මෙම වැඩසටහන ජාතික සමාජ සේවා මණ්ඩලයේ ගරු සභාපති වසන්ත ද සිල්වා මහතාගේ සංකල්පයක් අනුව එම මණ්ඩලයේ නිලධාරීන්ගේ මූලිකත්වයෙන් සංවිධානය කරන ලදී.

එසේම මෙහිදී සම්මේලනය මගින් සංස්කරණය කරන ලද නව පාලක සභා රෙගුලාසි පොත ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාස පාලක සභා වෙත ලබාදීම සිදු කරන ලදී.

---


**වස් කාලයෙහි විහාරස්ථානවලට**
**පූජා භාණ්ඩයක් ලෙස පූජා කිරීමට ජාතක කතා**
**පන්සිය හතළිස් අට ම (548) ඇතුළත්,**

# පන්සිය පනස් ජාතක පොත් වහන්සේ




**(පෙනීම දුර්වල අයට පවා පහසුවෙන් කියවීමට හැකිවන පරිදි ලොකු අකුරෙන් සම්පාදිත)**

**20%** **වට්ටම් යටතේ ගොඩගේ පොත් මැදුරෙන්**

| | | |
|---|---|---|
| කථා 548 ම තනි පොතක් ලෙස ~~රු. 35000/-~~ (ලොකු අකුරු සහිත) | රු. 28000/- | දැන් ලබාගත හැක |
| කථා 548 ම කාණ්ඩ 03 ක් ලෙස ~~රු. 9000/-~~ | රු. 7200/- | |
| කථා 548 ම කාණ්ඩ 10ක් ලෙස ~~රු. 4000/-~~ | රු. 3200/- | |

**ගොඩගේ පොත් මැදුර**
**675, පී.ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.**
0112 686925
0777 168453

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ජාතික ළමාරක්ෂක මණ්ඩලය මගින් පාලනය වන
ළමා සංවර්ධන මධ්‍යස්ථාන 17 හි ආදරණීය දුවා දරුවන් වෙනුවෙන් සංවිධානය කරන ලද

# තරු මුතු දරු ප්‍රසංගය - 2023



2023 ඔක්තෝම්බර් මස 15 වෙනි දින
බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී
පවත්වන ලදී

# බලංගොඩ සඳගිරි අෂ්ඨඵල බෝධි රජ මහා විහාරයේ කඨීන චීවර පූජාව 2023






කඨීන චීවරය සඟ සත කොට පූජා කිරීම





අස්ගිරි පාර්ශවයේ අතිපූජ්‍ය වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද මහානායක ස්වාමින්වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නය









# 2023 ඔක්තෝබර්
# සඳහම් චාරිකාව බරණැස නව ඉසිපතන මූලගන්ධකූට විහාරය










බෞද්ධාලෝකය®

ප්‍රකාශනය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07
දුරකථන: 011-2 691695/ 2 688517

ජාත්‍යන්තර ග්‍රන්ථ හඳුනාගැනීමේ සංකේතය
ISSN 2613-8743
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ලියාපදිංචි අංකය
P 1567
තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංකය
DOP/NEWS/24/2023

9 772613 874002